ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත


03 දිව්‍ය සත්ප්‍රසාදයේ කාන්තාව වන මරියෝත්තමාවෝ



05 ස්තෝත්‍ර යාගික යැදුම් වෙනස



08 සුපුවත් අරණ පින්තූර කතාව






# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07

www.colombocatholicpress.com




දෙසැ. 01 දින උපන් දිනය සමරන ප්‍රදීපයේ කාටූන් ශිල්පී කැමිලස් පෙරේරා මහතාට පාඨක, ලේඛක සුබ පැතුම්!

ක්‍රි.ව. 2013 ක් වූ දෙසැම්බර් 01 ඉරිදා 148 වෙළුම 27 කලබ සතිපතා පත්‍රය - පිටු 28 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/51/NEWS/2013

# ආගම ධර්මය ඉගැන්වීමෙහිලා හීනමානයෙන් පෙළෙන්න එපා!

## බිංගිරිය ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේදී බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි. හිමිපාණෝ ප්‍රකාශ කරති

**අද පාසල් දරුවන්ගේ අධ්‍යාපනය විකුණාගෙන කන තත්ත්වයක් රටේ ඇතිවී තිබෙනවා. උපකාරක පංති, ටියුෂන් පංති දේශයේ අගනා සංස්කෘතිය විනාශ කරනවා. දේශය පුරා හතු පිපෙන්නාක් මෙන් දකින්නට ලැබෙන්නේ අධ්‍යාපන ක්‍රමයේ දුර්වලතා නිසා බිහිවී ඇති අධ්‍යාපන කඩ යැයි පැවසීම වඩාත් නිවැරදි යැයි බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි. හිමිපාණෝ ප්‍රකාශ කරති.**




බිංගිරිය වයඹ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ කතෝලික / ක්‍රිස්තියානි සංගමය වාර්ෂිකව සංවිධානය කරන නත්තල් උත්සවයට එක්වෙමින් රදගුරු හිමි මෙසේද පැවසීය.

මේ විද්‍යා පීඨයෙන් සුදුසුකම් ලබා පිටවෙන ඉතාමත් සුළු පිරිසකගේ ආකල්ප සහ ක්‍රියා පටිපාටිය එතරම්ම යහපත් නොවන බව සඳහන් වෙනවා. එය ඉදිරියේදී වළක්වා ගැනීම සඳහා යමක් සඳහන් කිරීමට මට අවසර.

එය විද්‍යා පීඨයේ වරදක් නොවේ.

15 පිටුවට




## දියගල ළමා නගරයේ ස්වර්ණ ජයන්තිය

දියගල ළමා නගරය අභිමානවත්ව සමරන ස්වර්ණ ජයන්තිය නිමිතිකොට පුද කරන ස්වර්ණ ජයන්ති මංගල දිව්‍ය යාගය දෙසැ. 10 දින පෙ.ව. 9.00 ට අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සිදුවන බව එහි කළමනාකාර අධ්‍යක්ෂ ගරු පුබුදු රාජපක්ෂ ද ලාසාල් නිකායික සහෝදරතුමා ප්‍රදීපයට දන්වා සිටී.

ඒ ස්වර්ණ ජයන්තිය සමඟ එක්වන්නට ඔබටත් ආරාධනා! (විශේෂ ලිපියක් ලබන සතියේ)

## කටාන ප්‍රදේශයේ කැසිනෝ ගම්මානයක් ආරම්භ කිරීමට සැරසීම පිළිබඳ කොළඹ අගරදගුරු හිමිපාණන්ගේ විරෝධය

රජය විසින් ගම්පහ දිස්ත්‍රික්කයේ කටාන ප්‍රදේශය තුළ විදේශ විනිමය ලබා ගැනීම සඳහා කැසිනෝ ගම්මානයක් ආරම්භ කරන්නට පියවර ගනිමින් සිටින බව මා හට දැනගන්නට ලැබී ඇත. මේ තුළින් ගම්බද ප්‍රදේශවල මුල් බැස ඇති ආධ්‍යාත්මික රටාව හා වටිනාකම් වලට පවා තර්ජනයක් එල්ල වන බව ප්‍රකාශ කර සිටිමි.

එබැවින් ශ්‍රී ලංකාවේ සංස්කෘතික උත්තරීතරත්වය ඒ තරමටම පිරිහෙන්නට ඉඩ දී අපේ ආගමික හා සංස්කෘතික ආත්මය මුදලට විකුණා දැමීමට දරණ මේ උත්සාහය මම ඉතා ඕනෑකමින් හා පිළිකුළින් යුතුව හෙලා දකිමි.

ලොව පිළිගත් ආගමික චින්තනයන් විසින් පෝෂණය වී ඇති ශ්‍රී ලංකාවේ ආධ්‍යාත්මය වෙළෙඳ භාණ්ඩයක් නොවන බව පැවසිය යුතුවේ. එබැවින් මේ ආධ්‍යාත්මිකත්වය අගය කරන සහෝදර පුරවැසියන්ගෙන් මා ඉල්ලා සිටින්නේ මෙම වැඩ පිළිවෙලට සිය විරුද්ධත්වය එඩිතරව ප්‍රකාශ කර මෙය නවතා දැමීමට රජයට බලපෑම් කරන ලෙසයි. සංවර්ධනයට අපි "ඔව්" කියමු. එහෙත් එය අපේ ආත්ම ගෞරවය වෙළෙඳාම් කිරීම තුළින් නොවිය යුතු බව සිහි කරමි.

✠ අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ
කොළඹ අගරදගුරු

2013 නොවැම්බර් 25

## ඉකුත් සඳුදා පළවූ අසත්‍ය පුවතට "ලංකාදීප"යට දැඩි විරෝධතා!

"විවාහක කතකට අතවර කිරීමට තැත් කළැ යි කතෝලික පූජක රිමාන්ඩ්" මැයෙන් නොවැ. 25 වැනිදා ලංකාදීප පුවත්පතේ 01 පිටුවේ හා 06 වැනි පිටුවේ පළවූ පුවත ගැන බොහෝ දෙනෙක් අපගෙන් ද විමසූහ.

මේ පිළිබඳව අනුරාධපුර රදගුරු අති උතුම් නෝබට් එම්. අන්ද්‍රාදි හිමිපාණන් වෙනුවෙන් අනුරාධපුර රදගුරු වසමේ ජනසන්නිවේදන අධ්‍යක්ෂ ගරු ඇලෙක් රෝයි පියතුමා මේ පුවතේ කතෝලික පූජකවරයකු යන්න මුළුමනින්ම අසත්‍ය බැව් දන්වා ඇත. කහටගස්දිගිලියේ "ස්වර්ගයේ දොරටුව" නමින් තබා මොනයම් හෝ කතෝලික දෙව්මැඳුරක් නැති බවත් සිද්ධියට අදාළ තැනැත්තා කතෝලික පූජකවරයකු නොවන බවත් ප්‍රදීපයට වාර්තා වේ.

15 පිටුවට

## "සිග්නිස් - උන්ඩා" සම්මාන උළෙල

මෙරට වැඩිම අවස්ථා ගණනක් අඛණ්ඩව පවත්වාගෙන එනු ලබන එකම සිනමා උත්තමාචාර සම්මාන උළෙල වන "සිග්නිස්" සිනමා උත්තමාචාර උළෙල 37 වන වරටත් ඉමහත් අභිමානයෙන් යුතුව දෙසැ. 07 දා රාජ්‍ය චිත්‍රපට සංස්ථා "තරංගනී" සිනමා ශාලාවේදී පැවැත්වේ.

15 පිටුවට

## නායකකන්ද මීසම් ජනතාවගේ දායකත්වයෙන් මුලතිව් කුලම්උරුප්පු මීසමට නව දෙව්මැදුරක්

තිළිණ අලහකෝන් විසිනි

අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ආරාධනය පරිදි මෙවර නත්තල දිළිඳු මීසමක් හා බෙදා ගැනීමේ සංකල්පය මත නායකකන්ද මීසම් ජනතාවගේ මූල්‍ය හා ද්‍රව්‍යමය ආධාරයෙන් යුතුව මුලතිව් කුලම්උරුප්පු ග්‍රාමයේ වැසියන්ට ආධාර කිරීමේ විශේෂ නත්තල් වැඩසටහන දෙසැම්බර් මස 06-07 දෙදින මුලතිව් කුලම්උරුප්පු ග්‍රාමයේදී පැවැත්වීමට නියමිතය. ඡායාරූපයෙහි දැක්වෙනුයේ ඉදිකිරීමට නියමිත නව දෙව් මැදුරේ ආකෘතියකි.



## තරුණ වසර - හලාවත පදවිය

2012 වසරේ පවත්වන ලද හලාවත පදවි දහම් කතිකාවතේ ගනු ලැබූ තීරණයක් අනුව "යෞවනය නැගිටින්න" තේමාව යටතේ 2014 වසර, හලාවත පදවි "තරුණ වසර" ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය මූලික කටයුතු, පදවි එඩේරාණන් ප්‍රමුඛ පූජක සංඝය සංවිධානය කර ඇති අතර, 2014 ජනවාරි 01 වන දින එය නිල වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට නියමිත බැව් වාර්තා වේ.

## රූපවාහිනි "සුපුවත"

දෙසැම්බර් 01 ඉරුදින සවස 6.00 ට ජාතික රූපවාහිනියේ "සුපුවත" කතෝලික වැඩසටහනින් මෙවර "මරිය වසර" පිළිබඳව අති උතුම් මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් සමඟ කළ සාකච්ඡාව විකාශනය වීමට නියමිත බව එහි වැඩසටහන් සම්පාදක රංජුල සේනාධීරයන් ප්‍රදීපයට පැවසීය. එලෙසම බෝපිටිය සා. නිකුලා දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය නිමිතිකොට දෙසැ. 05 බ්‍රහස්පතින්දා දින පෙ.ව. 10.30 ට පිදෙන බාර නොවාන දිව්‍ය පූජාව ද පුරා පැයක් සජීවීව ජාතික රූපවාහිනියේ විකාශය වීමට නියමිත බැව්ද දන්වා සිටී.

## සා.බෙ.නි. නව ශ්‍රේෂ්ඨාධිපති



සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකායේ නව ප්‍රාදේශියාධිපති වශයෙන් (ශ්‍රී ලංකාවේ) ගරු ශමින්ද ජයවර්ධන පියතුමන් තෝරා පත් කොට ඇත.

15 පිටුවට

**"අපේ ගැළවීම ළං ළංව පැමිණේ. ඔබත් අවදිව සූදානම්ව සිටින්න." (මතෙ. 24:37-44)**

පදවියෙන් පදවියට



නාවලපිටිය මීසම් සේවක ගරු නිව්මන් පීරිස් පියතුමා තෙමස් අධ්‍යාපන වැඩසටහනකට ඉන්දියාව බලා පිටත්ව යෑම හා ගරු නිලංක ඩයස් හා ගරු සත්ගුණ රාජා පියතුමන් මීසමට පැමිණීමත්. ගරු සත්ගුණ රාජා පියතුමා නාවලපිටියෙන් බිහිවූ පූජක පුතකු වීමත් එතුමාගේ පළමු දිව්‍ය පූජාව පැවැත්වීමට අවස්ථාවක් ලැබීම හා එතුමාගේ ජන්ම දිනයද එදිනට යෙදී තිබීමත් විශේෂ අවස්ථාවන් විය. ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබූ දීප ව්‍යාප්ත බයිබල් දැනුම මිනුම තරගාවලියෙන් සමස්ත ලංකා ප්‍රථම ස්ථාන සම්මාන දෙකක් හිමි කරගත් දමිළ හා සිංහල දහම් පාසල් දරු දැරියන්ට මෙන්ම එම ගුරු භවතුන් හා දෙමාපියන්ටද උපහාර දැක්වීම මීසම් ජනතාව එක්ව සංවිධානය කරන ලදි.

මිකි ප්‍රනාන්දු

# දේව ආදරය නොවරදවා ලබාගන්න

## සලාපුර රදගුරු හිම්පාණෝ උල්හිටියාවේ දී පවසති

**"කතෝලිකයාගේ විශ්වාසයේ කැඩපත, ඉරුදින දිව්‍ය පූජාවයි. ඒ තැනැත්තා කුමන තරාතිරමක වුවද, දෙවියන් වහන්සේගේ උතුම්ම ආදරය ඔහුට හිමිවෙනවා" යැයි උල්හිටියාව දේවස්ථානයේ පැවති, අභිවෘද්ධිආලේපය දානය කිරීමේ දේව මෙහෙයේදී හලාවත රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිම්පාණෝ පැවසුහ.**



මෙදින ළමුන් 90 ක් අභිවෘද්ධිආලේපය ලැබූ අතර, මීසම් සේවක ගරු බෙනට් ශාන්ත හා සහයක ගරු ප්‍රනිල්ක පියතුමන් සහ වෙන්නප්පුව ශු. පවුලේ කන්‍යාරාමයේ ගරු සාමලා සහ සුමල්කි පැවිදි සොහොයුරියෝ ළමුන් සූදානම් කළහ.

දිව්‍ය පූජාවෙන් පසු රදගුරු තුමා මීසම් සභාවේ නිලධාරින් හා සමිති සමාගම් නියෝජිතයන් සමග දහම් සාකච්ඡාවකටද සහභාගි වූහ. හලාවත පදවි පරිපාලක අතිගරු පැට්‍රික් විජේසිංහ පියතුමාද එම සාකච්ඡාවට එක්විය.

ගොඩ්ප්‍රි ගාල්ලගේ

## සුබාසිංසන



විශ්‍රාමික අගරදගුරු අතිඋතුම් නික්ලස් මාකස් ප්‍රනාන්දු හිම්පාණන්ගේ නාමසාන්තුවර මංගල්‍යය දෙසැම්බර් 06 යෙදේ. ඥානාර්ථ ප්‍රදීපය එතුමනට දෙවිඳුන්ගේ ආශිර්වාදය නොමඳව ලැබේවායි පාඨකයන් පිරිවරා ප්‍රාර්ථනා කරන්නීය.

## ක්‍රිස්මස් බ්‍රීස් 2013 දෙසැම්බර් 02 වැනිදා

කොළඹ ඩී. එස්. සේනානායක විද්‍යාලයීය ක්‍රිස්තියානි සංගමය වාර්ෂිකව සංවිධානය කරන නත්තල් කැරොල් ගී ප්‍රසංගය 'ක්‍රිස්මස් බ්‍රීස් - 2013' දෙසැම්බර් 02 සඳුදා ප.ව. 2.00 ට විදුහල් ප්‍රධාන ශාලාවේදී පැවැත්වේ.

විදුහල්පති ඩී. එම්. ඩී. දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මෙවර උත්සවයට කතෝලික හා ක්‍රිස්තියානි පූජක තුමන්ලාද සහභාගි වෙති.

## හෙට්ටිපොල දේව කැඳවීම් වැඩමුළුවක්

'දේව කැඳවීම' යනු, එක්තරා විදියක අභිරහසකි. එය පහසු කාර්යයක් නොවේ. එහෙත්, එය දේව ආශිර්වාදය තුළ ශක්තිමත් දිවි මඟක ඇරඹුමකි. විශ්වාසය මුල්කරගෙන බලාපොරොත්තුවේ ගමනක් යාමට, දේව සේවකයින් බිහිවන්නේ අප අතරින්මයි. ඒ සඳහා යහපත් පවුල් පසුබිමක, යාච්ඤාවේ ජීවිතය තුළ අප දූ පුතුන් හට අවැසි මඟ පෙන්වීම ලබාදෙමු.

කුරුණෑගල පදවි දේව කැඳවීම් අධ්‍යක්ෂ ගරු හර්මන් සරත්චන්ද්‍ර පියතුමා දේවස්ථාන සභාව දැනුම්වත් කරමින් එසේ ප්‍රකාශ කළේය. අනතුරුව දහම් පාසල් ළමුන් සඳහා වැඩමුළුවක් පැවැත්වූ අතර පදවි දේව කැඳවීම් සම්බන්ධීකාරක ගරු ග්‍රේස් පැවිදි සොයුරිය සහ ගරු ශිරෝමා පැවිදි සොයුරිය ඒ සඳහා සහය වූහ.

මීසම් සේවක ගරු එමාඩ් ප්‍රනාන්දු පියතුමන්ගේ මඟ පෙන්වීම මත, දහම් ගුරු මඩුල්ල මේ අවස්ථාව සංවිධානය කළහ.

ප්‍රිස්කා සුමුදිනී



කැලණිය පිලපිටිය සා. ආනා දේවස්ථානයට අයත් ශ්‍රී හෘදය සමිතියට වසර 50 ක් පිරීම නිමිත්තෙන් පසුගියදා පැවැත්වූ දේව මෙහෙයෙන් පසු හිටපු මීසම් සේවක ගරු ගිහාන් රිඩ්ලි පෙරේරා පියතුමා සමග සමිතියේ සාමාජිකාවන් සේයාරුවකට පෙනීසිටි අයුරු.

ඇතනිෂියස් පෙරේරා

## හපසංක උලෙළ දෙසැම්බර් 07 දා

හලාවත පදවි ජනසන්නිවේදන හා සංස්කෘතික කටයුතු කමිටුව සංවිධානය කළ හපසංක නව නිර්මාණ ගායනා, කෙටි නාට්‍ය, නර්තන, ඡායාරූප හා ටෙලි නාට්‍ය පිටපත් තරගවල ජයග්‍රාහක ජයග්‍රාහිකාවනට ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය හා අවසන් උලෙළ දෙසැම්බර් 07 වැනිදා සවස 4.30 ට හලාවත සුදසුන ශාලාවේදී හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිම්පාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

ප්‍රියන්ත පීටර්ස්

## කළුඑළිය නව ලූර්දු ගුහාව ආසිරිගැන්වේ

අම්මා කියන වචනය මොන තරම් මිහිරිද.....? එවන් මිහිරි වචනයක් තවත් ලොව ඇද්ද.....? අද අප දේව අම්මා ගැන කතා කරද්දී, ලූර්දු මෑණියන් කියනවා, දේව මෑණියන් කියනවා, පාතිමාවේ මෑණියන් කියනවා, මරුද මඩු මෑණියන් කියා කියනවා. යැයි අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වෙල් සිල්වා හිම්පාණෝ කලඑළිය දෙව්මැඳුර අබියස අභිනවයෙන් ඉදිකරන ලද ලූර්දු ගුහාව ආසිරිගැන්වීමේ සන්ධ්‍යා දිව්‍ය පූජා යාගයේ දී පැවසූහ.



මේ ලූර්දු ගුහාව ඉතාමත් කෙටි කාලයකදී ප්‍රදේශයේ පරිත්‍යාගශීලි ඇන්ජලෝ කෝස්තා මහතාගේ ධන පරිත්‍යාගයෙන් එම මහතාගේ දයාබර මෑණියන් වන අයිරින් කෝස්තා මහත්මියගේ අදහසක් අනුව ග්‍රාමයේ සුපතල සමාජ සේවකයකු වන නැසී ගිය සයිමන් කෝස්තා, ලිලියන් ජයතිලක, කැතරින් ප්‍රනාන්දු, ඔස්ටින් කෝස්තා සහ ඔහුගේ දයාබර පියාණන් වන රෝලන්ඩ් කෝස්තා මහතා සිහිවීම පිණිස පරිත්‍යාග කරන ලදි. කලඑළිය මීසම් සේවක ගරු තරංග සම්පත් පෙරේරා පියතුමා කටයුතු සංවිධානය කළේය.

ඩබ්. එම්. ලෙස්ලි පෙරේරා

## වත්තේගම සා. අන්තෝනි දෙව් මැඳුර පිළිසකර කෙරේ

වත්තේගම ශා/ අන්තෝනි දෙව්මැඳුරේ වහල දිරාපත්වී ඉතා අබලන් තත්ත්වයකට පත්ව ඇති බැවින්, එහි පිළිසකර කටයුතු දැන් අරඹා ඇත. මෙවර වාර්ෂික මංගල්ලයද නොපැවත් වූයේ මේ හේතුව මතය.

මෙම අලුත්වැඩියා කටයුතු සිදු කරන්නේ වත්තේගම මීසම් සේවක ගරු නන්දන මනතුංග පියතුමාගේ උපදෙස් මත, මීසම් වාසින්ගේ සහ තරුණ කැලගේ ශ්‍රමය සහ දායකත්වය මූලික කරගෙනය.

ෆ්‍රැන්සිස්කා ගුණතිලක

## සා. ජෝසප් නත්තල් බැති ගී දෙසැම්බර් 07 දා

අප ස්වාමි දූ වන මරියතුමියගේ ජීවිතයේ අභියෝගයන්ට මුහුණ දුන් ආකාරය, අනපේක්ෂිත හා අස්ථිර වර්තමාන සමාජයට ආදර්ශයක් කර ගනිමින් යහ ප්‍රතිඵල ලබා ගන්නේ කෙසේද යන්න....... තේමා කර ගනිමින් කොළඹ, මරදාන සාන්ත ජෝසප් විදුහලේ "වාර්ෂික නත්තල් බැති ගී" මෙහෙය මෙවර අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිම්පාණන්ගේ ප්‍රධානත්වයෙන් දෙසැම්බර් 07 වන සෙනසුරාදා සවස 6.15 ට එම විදුහලේ ස්ටැන්ලි අබේසේකර ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට සියල්ල සූදානම් කර ඇත.

සාන්ත ජෝසප් විදුහලේ සිසුන් 80 කින් සැදුම් ලත් "සාන්ත සිසිලියා" ගායනා කණ්ඩායම විසින් ඉදිරිපත් කරනු ලබන මෙම බැති ගී මෙහෙයේදී සිංහල, දෙමළ හා ඉංග්‍රීසි බසින් ගැයෙන ගීතිකාවන්ට අමතරව මෙවර අප්‍රිකාන බසින්ද ගයන්නට එම ගායනා කණ්ඩායම සූදානම්ය. ඔවුනට අමතරව විදුහලේ ප්‍රාථමික අංශය. ගුරු මණ්ඩලය හා ආදී සිසු ගායන කණ්ඩායම්ද මෙහිදී බැති ගී ගයන්නට නියමිත අතර විදුහලේ බටහිර තූර්ය වාදක කණ්ඩායම විසින් වාදනයෙන් දායක වනු ඇත.



හැඳල බලගල සුසාන භූමිය ඉදිකිරීමට යෝජිත භූමිභාගය ආසිරි ගැන්වූ අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිම්පාණන් මීසම් සේවක ගරු ජුඩ් රාජ් ප්‍රනාන්දු පියතුමා සමග යාච්ඤා මෙහෙය සිදුකළ අවස්ථාව

නිමල් පෙරේරා



විල්ලෝරාවත්ත ශු. කාර්මෙල් බොරෝමියෝ මුනි දෙව්මැඳුරේ 117 වැනි වාර්ෂික මංගල දේව මෙහෙය, පූජක දිවියේ රජත ජයන්තිය සමරණ මීසම් පුත්‍ර ගාල්ල පදවි සංනිවේදන අධ්‍යක්ෂ ගරු ලලිත් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අවස්ථාව.

ට්‍රිසිල් ඇප්. මැන්දිස්

## කරුකුපන මීසමේ ජපමාල රැළියක්

කරුකුපන මීසමේ මරිමව්න් සඳහා විශේෂ ජපමාල රැළියක් සංවිධානය කරන ලදි. මේ සඳහා විශේෂ ආරාධිත දේශක පියතුමන් ලෙස බදුල්ල පදවියේ ගරු මර්වින් සුදර්ශන සහ තොඩුවාව සහයක ගරු ක්‍රිශාන්ත පියතුමන් එක්විය.

සුරේකා



164 පමුණුගම ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානයේ වැඩිහිටියන් පසුගියදා මහනුවර ප්‍රදේශයේ සංචාරයක යෙදුන අවස්ථාවේ කෑගල්ල සාන්ත මරියා දෙව්මැඳුරට පැමිණ යැදුම් මෙහෙයක් පැවැත්වීමෙන් අනතුරුව කෑගල්ල සාන්ත ජෝශප් කන්‍යාරාමයේ ගරු එඩල් පිරිස් හා ක්‍රිසන්තස් බොල්ලෑගල යන පැවිදි සොයුරියන් සමග සාන්ත මරියා දෙව්මැඳුර අබියස සේයාරුවකට මුහුණ දුන් අයුරු.

සටහන - ජේ. සංගපාලආරච්චි, සේයා - චන්දන තිරිමාන්න

## තේවාචාර්ය තුමන් 38 නමක්

**අම්පිටිය ජාතික දෙව්සත්හලේ පැවති තේවාචාර්යවරය දානය කිරීමේ දිව්‍ය යාගය දී ගාලු රදගුරු අතිඋතුම් රේමන් වික්‍රමසිංහ හිම්පාණන් විසින් පවත්වන ලදි.**

එහිදී උන්වහන්සේ මෙසේ පැවසූහ. ක්‍රිස්තුස් වහන්සේට ආදරය කරන්න. දේව ජනතාවට ආදරය කරන්න. ඔබ සැම ක්‍රිස්තුස් වහන්සේගේ සේවකයන් බව සිතට ගන්න. රදගුරු වසම් අටකින් ගරු සහෝදරතුමන් 38 නමක් මේ වසරේ දී තේවාචාර්ය පදවිය ලැබූහ.

ගරු එරන්ද ශාන්ත තේවාචාර්යතුමා

## මරිය වසර පිළිගැනීමට තුඩැල්ලේ ජපමාල දිනයක්

තුඩැල්ල මීසම් සංසයේ වසර ගණනාවක සිට සෑම බදාදාවක පවත්වාගෙන යන සදාසරණ බැතියට නව මුහුණුවරක් දෙමින් මාසයේ සෑම පළමු වන බදාදා විශේෂ සදාසරණ දේව මාතා බැතියක් පැවැත්වීමට කටයුතු කළේ 2012 වර්ෂයේ පටන්ය. මීසම් සේවක ගරු සිසිල් කුමාර පියනමගේ සංකල්පයක් මත ජපමාලය, දේවමාතා ප්‍රාර්ථනාව, දේශන සමග ගැයුමෙන්, වැයුමෙන් සහ දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය ඉන්පසු දිව්‍ය පූජාව පවත්වා නුවානය නිමාවට පත්වේ. එහි වර්ෂ පූර්ණය ඉකුත්දා පැවැත්විණ.

ඔක්තෝබර් මස ජපමාල බැතියටද, මරිය වසරටද දායකත්වය දෙමින්, සහභාගී වූ කුඩා දරුවාගේ පටන් වැඩිහිටියා දක්වා වූ සෑම අයෙකුටම ජපමාලයක් හා දේවමාතා පින්තූර බෙදා දෙන ලද්දේ මීසම් සේවක දොන් සිසිල් කුමාර පියතුමාගේ කැපවීමෙනි.

අයිරින් පෙරේරා

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com
ක්‍රිස්තු වර්ෂ 2013 දෙසැම්බර් 01 ඉරිදා

# "ධර්මදානීය සොම්නස" Evangelii Gaudium

මහත් බලාපොරොත්තුවකින් බලා සිටි අති උත්තම ප්‍රැන්සිස් සසුන් පියාගේ ප්‍රථම අපෝස්තලික අනුශාසනා පත්‍රය ඉකුත් නොවැම්බර් 26 වනදා නිකුත් වූ බව වතිකාන ආරංචි මාර්ග සඳහන් කරයි. තත්කාලීන ලෝක සමාජය තුළ සුභාරංචිය පතල කිරීමේ ඇති මහැඟි බව දනවන තේමා ඔස්සේ ලියැවී ඇති මෙම ප්‍රබල අපෝස්තලික අනුශාසනා පත්‍රය අද කාලයේ කතෝලික සසුන් නියෝජනය සැබවින්ම සවිබල ගන්වන්නකි. නව ධර්මදානය ප්‍රචලිත කිරීමේ ශුද්ධාසන කවුන්සලයේ සභාපති අගරදගුරු අති උතුම් රීනෝ පිසිචෙල්ලා හිම්පාණන්ගේ මූලිකත්වයෙන් වතිකානයේ මාධ්‍ය කාර්යාලයේදී ඉදිරිපත් කෙරුනු මෙම අනුශාසනා පත්‍රය මේ වන විට මුළු මහත් කතෝලික රටවල ප්‍රබල ලෙස අවධානය දිනාගන්නට සමත් වී සිටි. ලෝක රදගුරු සංසදයේ යෝජනාවන් අතර "විශ්වාසය ව්‍යාප්ත කරලීමේ නව ධර්මදානය" තේමා කොට ගත් අනුශාසනා පත්‍රයක අවැසිතාවය මීට කලින් බලවත් සේ පෙන්වා දී තිබිණි. ඒ අනුව ඇල් මැරුණ, මියැදුනු සභා ව්‍යුහයක් පණ ගන්වා ප්‍රබෝධය, ජ්වලිත බව එහි කැටි කොට නව ධර්මදානයක් තුළින් ධර්මදානීය සොම්නස පිළිබඳව සොම්නසින් කථා කිරීමට දැන් අප සසුන් පියා අපට මඟක් හෙළි පෙහෙළි කර දී තිබේ.

අද්‍යතන සමාජ වටපිටාවේ ඇති ප්‍රබල අභියෝගයන් හොඳාකාරව අවබෝධ කරගෙන ඒ අවබෝධය තුළ ධනාත්මක දැක්මක පිහිටා දිවැසිවර කාර්යය ඉටු කරන්නට අත්වැලක් මෙන් මේ "ධර්මදානීය සොම්නස" අනුශාසනා පත්‍රය අප ඉදිරියේ දිග හැරෙනු ලබයි. ඒ අනුව ධර්මදානය අංක එකේ තේමාව බවට පත්වේ. කතෝලික සභාවේ ධර්මදානීය පැතිකඩ ඉස්මතු කරලීමට දැන් හොඳම කාලය උදාවී තිබේ. විවිධ රටවල තිබෙන සංස්කෘතිකමය අභියෝග හා තර්ජන මධ්‍යයේ ඒ ඒ සභා සංඝයන් අතර තිබෙන ප්‍රභේද පවා හොඳාකාරව අවබෝධ කරගෙන සසුන් පියා මෙකී අනුශාසනා පත්‍රයෙන් පොදු ක්‍රියාවලියකට එළඹෙන ලෙස විශ්වාසයේ ක්‍රියාධරයනට ඇරයුමක්ද කරනු ලබයි.

මෙකී අනුශාසනා පත්‍රයෙහි අදහස් ගැඹුරුය. ප්‍රකාශ කිරීම සරලය. උලුප්පාලන අදහස් ආගන්තුකද නොවේ. විශ්වාසය පිළිබඳ අටුවා ටීකා ටිප්පණී සඳහනක් නොව විශ්වාසය ප්‍රකාශ කරන්නට යොදා ගන්නා සරල වාග් මාලාවම මෙකී අනුශාසනා පත්‍රයෙහි අඩංගු බැවින් එය ගිහි විඥානය සැනෙකින් ගෝචර කර ගන්නට සමත් වෙන බව වතිකාන මාධ්‍ය සංසදයේ අගරදගුරු අතිඋතුම් මාරියෝ චෙල්ලි හිම්පාණෝ සඳහනක් ද කරති. එය සැබෑය. අවැසි වන්නේත් එයයි. විශ්වාසය සැදැහැවතුන් අතර ඇත. එය ප්‍රකාශ කිරීමේ පොදු ධර්මතාවයක් බෙහෙවින්ම අද අවැසි යුගයකි.

සම්ප්‍රදායානුකූල වාග් මාලා අද විශ්වාසය ප්‍රචලිත කිරීමේදී ආගන්තුක බවක් දනවයි. එම නිසාම සුභාරංචියට අනුගත නොවන රටාවක් එහි ඉස්මතු වී තිබුණ බව පෙර කල සැදැහැවතුන්ගේ අවබෝධය වු බවද සමහර තැන්වල සඳහන්ව තිබුනි. ඒ සියළු ගැටලු නිරාකරණය කිරීමට "ධර්මදානීය සොම්නස" අනුශාසනා පත්‍රය සමත්වී තිබේ. දෙවීත්වය හා මිනිසියාව පිළිබඳව සඳහන් අප විශ්වාසයේ අරමුණු කෙතරම් පවිත්‍ර වුවත්, ශුද්ධවත් වූවත් එය ප්‍රකාශ වන අන්දම සරල නොවුවහොත් පැන නඟින ගැටලු විසඳාලන්නට ශත වර්ෂ ගණනාවක් ගතවේ. අතීතයේ සිදු වූයේද එවැන්නකි. එය සරලව ගත නොහැකිව ජනතාව අන්දමන්ද වූ තැනට ලොල් වැටුනේ විශ්වාසය මාර්කට් කළ මූලධර්මවාදි අතලොස්සකි. එය ක්‍රිස්තියානි පැවැත්ම නොවන බව සසුන් පියා අවධාරණය කරයි. ඇතුළාන්ත සිත් හැරීමක් තුළ ගැඹුරු අත්දැකීම් රාශියක් නිරූපණය කරමින් රචිත අති උත්තම ප්‍රැන්සිස් සසුන් පියාගේ මේ අනුශාසනා පත්‍රය ප්‍රබලවම කතෝලික සභාව අවදිකරන බවට වතිකානය සුබ ලකුණු අනාවරණය කරයි.

නව ධර්මදානය අඩපණ කරවන බලවේග හා දුර්පරීක්ෂා, වත්මන් ලෝකයේ විශ්වාසයට ඇති තර්ජන, ධර්මදානයේ නව ප්‍රවනතා, නව ධර්මදානයේ සමාජීය පැතිකඩ යන විවිධ අංශ ඔස්සේ විකාශනය වන මෙම "ධර්මදානීය සොම්නස" අනුශාසනා පත්‍රය වත්මන් කතෝලික ලෝකයේ ගුණාත්මක තත්ත්වය දෙගුණ තෙගුණ කරලීමට සැබවින්ම සමත් වෙන බවට කිසිදු සැකයක් නොමැත. බෞතීස්මය ලැබූ තැනැත්තා තුළ ඇති ජ්වලිත භාවය ප්‍රාණවත් කරන මෙන් සසුන් පියා පොදුවේ ආයාචනයක්ද කරනු ලබයි. ඒ ආයාචනය සැබවින්ම ධර්මදානීය තත්ත්වය තුළ සිට ඉටු කළ යුත්තකි. ලෝකයේ ඇති ප්‍රබල අනතුරු අවබෝධ කරගෙන ඒවා මැඩ පවත්වා ගෙන නව ධර්මදානයේ කොටස් කරුවන් වන්නට සියළු කතෝලිකයින්ට සසුන් පියා කරන ආරාධනයෙන් කිසිවෙකුටවත් පළා යා නොහැකිය. එය ශ්‍රී ලාංකේය කතෝලිකයාද අවබෝධ කර ගත යුත්තකි. ධර්මය නොමැති තැන අන්ධකාරය පැතිරෙයි. එයින් සිදුවන අවාසි ගැන තවත් කථා කුමකටද? "ධර්මදානීය සොම්නස" නුදුරු දිනක සිංහලයට පරිවර්තනය වූ විගසම එහි පිටපතක් සැම කතෝලිකයෙක් අත රැඳිය යුත්තේ එමනිසාම බව අපි අවධාරණය කරන්නෙමු.

# දිව්‍ය සත්ප්‍රසාදයේ කාන්තාව වන මරියෝත්තමාවෝ

**ක්‍රිස්තු වර්ෂ 2002 වප් මස 16 වැනිදා අති උතුම් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින් අනපේක්ෂිත ලෙසින් 2002 වප් මස සිට 2003 වප් මස දක්වා විශේෂ "ජපමාල වසරක්" ප්‍රකාශයට පත් කරන ලදි.**

මෙම ජපමාල වසර ප්‍රකාශයට පත් කරමින් එතුමන් විසින් "රොසාරියුම් වර්ජිනියා මරියේ" හෙවත් "අති ශුද්ධවූ ජපමාලය" නමැති අපෝස්තලික අනුශාසනාව නිකුත් කරන ලදි. එම ලියවිල්ල මඟින් භාග්‍යවත් කන්‍යාමරියෝත්තමාවන් හා සමඟ ඇයගේ පාසල තුළ හිඳ ක්‍රිස්තුන් වහන්සේගේ මුව මඬල පිළිබඳ ගැඹුරු මෙනෙහි කිරීමක යෙදෙන්නට අප සැමට ආරාධනය කරන ලදි.

මෙම ජපමාල වසර මැද දී 2003 වසරේ මහ බ්‍රහස්පතින්දා දින අති උතුම් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින් සිය දහ හතරවන විශ්ව ලේඛණය "එක්ලේසියා එයුකරිස්ටියා" "දිව්‍ය සත්ප්‍රසාදයේ සාන්ත සභාව" නමින් ප්‍රකාශයට පත් කරන ලදි. අති ශුද්ධවූ දිව්‍ය සත්ප්‍රසාදයේ අභිරහස සහ සාන්ත සභාව අතර පවතින අවියෝජ්‍ය හා සක්‍රීය සම්බන්ධතාවය පිළිබඳ කිසියම් ආලෝකයක් දෙන අදහසින් එතුමා විසින් මෙම ලියවිල්ල ඉදිරිපත් කරන ලදි.

මරියෝත්තමාවන්ගේ නිර්මල පිළිසිඳීම පිළිබඳ විශ්වාසය කතෝලික සභාව තුළ වේද සත්‍යතාවක් ලෙස ප්‍රකාශයට පත් වී වසර 150 ක් සපිරි සංවත්සරය සමරන අතරතුරේදී 2004 වසරේ පොසොන් මස දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍ය දින ශුද්ධෝත්තම පියතුමන් විසින් එම වසරේ වප් මස "දිව්‍ය සත්ප්‍රසාදයේ වසරක්" ඇරඹෙන වග නිවේදනය කරන ලදී.

ක්‍රිස්තු වර්ෂ 2004 වප් මස 7 වැනිදා ජපමාලයේ අප ස්වාමිදුවගේ මංගල්‍ය දින "දිව්‍ය සත්ප්‍රසාද වසර" වෙනුවෙන් "මානේ නොබිස්කුම් ඩෝමිනේ" හෙවත් "අප සමඟ නතර වුව මැනව" නමැති අපෝස්තලික අනුශාසනාව ප්‍රකාශයට පත් කරන ලදි. "එක්ලේසියා ඩෙ එයුකරිස්ටියා" යන විශ්ව ලේඛනය හා "මානේ නොබිස්කුම් ඩෝමිනේ" යන අපෝස්තලික අනුශාසනාව යන ලියවිලි දෙකෙහිම ශුද්ධෝත්තම පියතුමන් විසින් භාග්‍යවත් කන්‍ය මරියෝත්තමාවන් දිව්‍ය සත්ප්‍රසාදයේ කාන්තාව වශයෙන් හඳුන්වනු ලබයි. "සාන්ත සභාවට අත්‍යවශ්‍යයෙන් සම්බන්ධ වන සහ ඉන් (කිසි ලෙසකත්) විසන්ධි කළ නොහැකි දිව්‍ය සත්ප්‍රසාදීය අභිරහස මත (එය අවබෝධ කර ගැනීම සඳහා) ආලෝකය හෙලන අරමුණින් ශුද්ධවූ ජපමාල වසර අතරතුර මම "දිව්‍ය සත්ප්‍රසාදයේ සාන්ත සභාව" විශ්ව චක්‍ර ලේඛනය ප්‍රකාශයට පත් කළෙමි. දිව්‍ය පූජාව තුළදී හා ඉන් පිටත දී දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩ වසන ජේසුස් වහන්සේට මේ තරම් උත්කෘෂ්ඨ අභිරහසකට ලබා දිය යුතු වන්දනාව පුද කරන ලෙස ඉල්ලමින් දිව්‍ය පූජා යාගය (ගැඹුරු) ගරු භක්තියකින් සමරන ලෙස මම සියළුම සැදැහැවතුන්ගෙන් තරයේම ඉල්ලා සිටියෙමි. "දිව්‍ය සත්ප්‍රසාදයේ කාන්තාව" වන මරියෝත්තමාවන් එහි පරමාදර්ශය ලෙස පෙන්වමින් දිව්‍ය සත්ප්‍රසාදීය ආධ්‍යාත්මිකත්වයක අවශ්‍යතාවය නැවත වරක්, මේ සැමට ම ඉහළින් මම යෝජනා කළෙමි" (මානේ නොබිස්කුම් ඩෝමිනේ අංක 10).

මෙම ලිපිය තුළින් අප උත්සාහ කරනුයේ මරියෝත්තමාවන් දිව්‍ය සත්ප්‍රසාදයේ කාන්තාව වන්නේ කෙලෙසදැයි යන්න විග්‍රහයක යෙදෙන්නයි.

## මරියෝත්තමාවන්ගේ හදවත නමැති පාසල

භාග්‍යවත් කන්‍ය මරියෝත්තමාවන් දිව්‍ය සත්ප්‍රසාදයේ කාන්තාව යන සංකල්පය කිතුනු අපට නුහුරු නුපුරුදු එහෙත් විමර්ශනයට භාජනය කළ යුතු අර්ථයෙන් සපිරුණු සුවිශේෂ සංකල්පයකි. මරියෝත්තමාවන් හා දිව්‍ය සත්ප්‍රසාදය අතර ඇති සම්බන්ධතාවය මවක හා පුතකු අතර පවතින බැඳීම වේ. එය ඉතා ගැඹුරු සම්බන්ධතාවයකි.

මව්වරු සිය දරුවන්ගේ හොඳම ගුරුවරයෝ ය. සිය කුස තුළ දරුවා බිහි වූ දා පටන් ඔවුහූ සිය දරුවන් හඳුනති. ඔවුහූ සිය දරුවන් වෙත කළ හැකි සෑම සියළු දේ නොපිරිහෙලා ඉටු කරති. ඔවුන්ට සාත්තු කරමින්, ඔවුන් නාවමින්, ඔවුනට සුව පහසුව ගෙන දෙමින්, ඔවුන්ට සවන් දෙමින් ඔවුන් සුවසේ රැක බලා ගනිති. ලොව අන් කිසි කෙනෙකුට වඩා ඔවුහූ සිය දරුවන් ගැන හොඳින් හඳුනති. ක්‍රිස්තියානි සම්ප්‍රදාය විසින් මාංශගතවීමේ අභිරහස තුළින් අපට උගන්වන්නේ දෙවියන් වහන්සේද මෙම අවශ්‍යතාවය අවබෝධ කරගෙන සදාකාලික වචනය කන්‍ය මරියෝත්ත මාවන් තුළින් මාංශගත කළ වගයි. උන්වහන්සේව රැක බලා ගැනීම සඳහා එතුමිය සිය ජීවිතයම කැප කළාය. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ සිට සිය ශ්‍රාවකයන් වෙත එතුමිය ඔවුන්ගේ මව වශයෙන් බාර දෙන ලදි. ප්‍රේමවන්ත ගෝලයා මඟින් උන්වහන්සේ පවසා වදාළේ ඔවුන්ගේ මෑණියන් ලෙස එතුමිය ඔවුන්ගේ නිවසට කැඳවා ගන්නා ලෙසයි (ජුවාම් 19:25-27).

සිය පුතනුවන්ට එතුමිය උගැන් වූ ආකාරයටම දැන් එතුමිය උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට, සාන්ත සභාවට සිය පුතනුවන් ගැන උගන්වනු ලබයි. සාන්ත සභාවට ඇය කියා දෙන පාඩම් අතරින් එකක් වන්නේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ඇති සම්බන්ධතාවය තුළ තමන් අත්පත් කර ගත යුතු නිවැරදි හා යෝග්‍ය නැඹුරුවයි. එහි පරමාදර්ශය වන්නේ නිශ්චිත වශයෙන්ම එතුමියගේ ඇතුළාන්ත නැඹුරුව වන පිවිතුරුබව හා නිහතමානිකමයි.

"එක්ලේසියා ඩෙ එයුකරිස්ටියා" යන විශ්ව චක්‍ර ලේඛනය තුළ, මරියෝත්ත මාවන්ගේ සුවච බැතිමතකු වූ අති උතුම් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින් කන්‍ය මරියෝත්තමාවන් හා දිව්‍ය සත්ප්‍රසාදය අතර ඇති සම්බන්ධතාවය පිළිබඳව "මරියෝත්තමාවන්ගේ පාසලේ දිව්‍ය සත්ප්‍රසාදයේ කාන්තාව" යනුවෙන් නම් කර ඇති සයවැනි පරිච්ඡේදයේ විස්තර කරනු ලබයි.


ශුද්ධෝත්තම පියතුමා විසින් සඳහන් කරනු ලබන මෙම පාසල කුමක්ද? කොටහේනේ යහපත් එඬේරාගේ කන්‍යාරාමය නැතිනම් වෙන්නප්පුවේ ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය වැනි විදුහල් ද? කොහෙත්ම නැත. එය මරියෝත්ත මාවන්ගේ හදවත නමැති පාසලයි. ක්‍රිස්තුන් වහන්සේ ගැන අභිරහස් ගැන දැන ගැන්මට ඉගෙන ගැනීමට ඇති උසස්ම විදුහල මරියෝත්ත මාවන්ගේ හදවතයි. ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් පැවතුනු ප්‍රේමයේ පාසල, ආදරයේ විදුහල මරියෝත්තමාවන්ගේ නිර්මල හදවතයි. ශුද්ධවූ ජෙම්මා ගල්ගානි මුනිතුමිය මෙසේ පවසා ඇත. "කිසියම් තැනැත්තෙකු විසින් දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩ වසන ජේසුස් වහන්සේට ආදරය කරන්නට ඉගෙන ගන්නා ස්වර්ගීය පාසලක් ඇත. එම පාසල නම් මරියෝත්ත මාවන්ගේ හදවත නමැති ශාලාවයි. එහි විෂය දිව්‍ය සත්ප්‍රසාදය වන අතර, ගුරුතුමිය මරියෝත්තමාවන් වේ."

සිය සිසුවන් සඳහා කන්‍ය මරියෝත්තමාවන්ගේ "පාඩම් සටහන" වන්නේ සිය පුතනුවන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහසයි. "රොසාරියුම් වර්ජිනියා මරියේ" හි අති උතුම් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා පවසන ආකාරයට කිසි දෙයකට සමකළ නොහැකි, විශ්වාසයේ වන්දනා ගමන නමැති උදාහරණය අපට ඉදිරිපත් කරමින් හා ශුද්ධාත්මයාණන් වහන්සේගේ තිළිණයන් බහුලව අප වෙත ලබා දෙමින් මරියෝත්තමාවන් අපට උගන්වන බවයි. (අංක 14). සැබෑ දිව්‍ය සත්ප්‍රසාදීය ශ්‍රාවකත්වයේ සුපිරි ආදර්ශය එතුමියගේ ජීවිතය ලෙස සැලකිය හැකිය.

12 පිටුවට »

ගරු විලියම් ඉවාන්ස් පියතුමා
ජාතික දෙව්සත්හල - අම්පිටිය

## කැම්ලස්ගේ — තිත්ත ඇත්ත



# සුදතුම් වරම කැඳවීමේ මෙන්ම කැපවීම මුහුකුරා යන අවස්ථාවක්

## කාදිනල් හිමිපාණෝ කළුඅග්ගලදී පවසති

වැඩිහිටි වයසේ තමන්ගේම කැමැත්තෙන් ක්‍රිස්තුස් වහන්සේ අනුගාමි වන්නට අද මේ දරුවෝ තීරණය කර තිබෙන නිසා මේ දවස මට වාසනාවන්ත දවසක් බවත්, නලලේ ශුද්ධ වූ තෛලය ආලේප කිරීම තුළින් ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබගේ ජීවිතයට විශේෂාකාරයෙන් ඇතුලු වන බවත්, මෙය කැඳවීමේ අවස්ථාවක්, කැපවීම මුහුකුරායන අවස්ථාවක් බව අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් කොළඹ අගරදගුරු හිමිපාණෝ හංවැල්ල මීසමේ දුවා දරුවන් දෙසිය හැටපස් දෙනකුට අභිෂේකාලේපය දානය කරමින් කළුඅග්ගලදී ප්‍රකාශ කළහ.

මේ අවස්ථාවට අතිඋතුම් මැක්ස්වෙල් ග්‍රැන්විල් සිල්වා අගරදගුරු පදවි සහයක රදගුරු හිමිපාණන්ද සහභාගිවූ අතර එදින දිව්‍ය පූජාවෙන් පසු දුවා දරුවෝ කාදිනල් හිමිපාණන්ගේ උපන් දිනයට සුබ පැතුම් එක් කළහ. සවස් භාගයේ කාදිනල් හිමි සහ සහයක රදගුරු හිමිපාණෝ මීසම් ධර්ම සේවා කමිටු සහ ඒකාබද්ධ මීසම් සභාව හමුවූහ.

මේ කටයුතු හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස්, සහයක ගරු රෝෂාන් චමින්ද පියතුමන් සමගින් දහම් ගුරු මණ්ඩලය විසින් සංවිධානය කරන ලදි.

ඇන්තනි හෙට්ටිආරච්චි



මඩු දේවස්ථානයේ මංගල මහා දේව මෙහෙය අවසානයේ මඩු මෑණියන්ගේ ප්‍රතිමාව රැගත් පෙරහර දේවස්ථානය ඉදිරිපිට වීදි සංචාරය කළ අයුරු.

බොනිපස් සිල්වා

## මොරටුවට නව මීසම් සභාවක්

මොරටුව මීසම් සේවක ගරු බර්ට්‍රම් රන්ජිත්, සහයක ගරු ශිරාන් දසා පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් නව මීසම් සභාවක් පත් කිරීමේ කටයුතු සිදු විය.

සනී ප්‍රැන්සිස් ප්‍රනාන්දු මහතා දෙවන වරටත්, මීසම් සභාවේ ලේකම්වරයා ලෙස පත් වූ අතර ශිරාන් ප්‍රනාන්දු මහතා උප ලේකම්වරයෙකු වශයෙන් පත්විය. එදින සියළුම සාමාජික සාමාජිකාවන් සහභාගී වූ අතර, අදහස් සහ යෝජනා කිහිපයක්ම ඉදිරිපත් කෙරුනි.

රන්ජිත් කුරේ

## ගොඩැල්ල නව සේවක මංඩල නියෝජිත පුහුණු සැසිවාරය



ගොඩැල්ල මීසමේ ගොඩැල්ල තඹරවිල මොරුක්කුලිය සහ දන්කොටුව දෙව් මැඳුරු හතරේ ඉදිරි වසර තුන සඳහා තේරී පත් වූ සේවක මණ්ඩල සාමාජික, සාමාජිකාවන් සඳහා පුහුණු සැසිවාරයක් හලාවත පදවි අනුනායක අතිගරු පීටර් චාල්ස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් ගොඩැල්ල සා. සෙබස්තියන් දෙව් මැඳුරේදී පැවැත්විණ.

එදින අනුනායක පියතුමන් විසින් සේවක මංඩල සාමාජිකයන්ගේ වගකීම හා කාර්යයන් පිළිබඳ පුලුල් අවබෝධයක් ලබා දුන් අතර, කණ්ඩායම් සාකච්ඡා හා මත විමසීම්ද ඊට අයත් විය. සැසිවාරය අවසානයේදී අක්ත පත්‍රයක් මගින් සේවක මංල පත්වීමේ සහතික පත්‍රය සියළුම සාමාජිකයන්ට ලබාදෙන ලදි.

මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමා මාස කීපයක් මුලුල්ලේ මීසමේ සියළුම කොට්ඨාස වෙත ගොස් දිව්‍ය පූජා සිදුකරමින් මව, පියා, පුතා, දුව තෝරා ගත් අතර සමිති සමාගම් නියෝජිතයන් හා පියතුමාගේ පත්වීම්ද සමග සම්පූර්ණ සේවක මංඩල හතර සඳහා සාමාජික සාමාජිකාවෝ 190 ක් ඉදිරි වසර තුන සඳහා නව පත්වීම් ලැබුහ. සහයක ගරු ධනුෂ්ක ප්‍රනාන්දු පියතුමාද නව සේවක මංඩල පිහිටුවීමේදි විශාල කාර්යයක් ඉටුකර ඇත.

එච්. ඒ. සිරිල් පෙරේරා



පමුණුගම ශු. ජුසේ මුනිඳුන්ගේ දෙව්මැදුර නවීකරණය හා අලුත්වැඩියා කිරීම ආරම්භයේදී මීසම වු බාරය ඉටුකරමින් දුප්පත් පවුලකට නිවසක් සාදා දීමේ ව්‍යාපාරයක් මීසම් සේවක ගරු ආනන්ද විතාන පියතුමාගේ මෙහෙයවීමෙන් ආරම්භ කරන ලදි. තම ජීවිතයේ අලුත් බලාපොරොත්තුවක් ඇතිකර ගනිමින් ගරු පියතුමාගේ ආශීර්වාදයෙන් මෙම දෙපල තම නිවසට මුල්ගල තැබීම මෙම සේයාරුවෙන් දැක්වේ. මෙම පවුලට නොමිලේ ඉඩම් කොටසක් පරිත්‍යාගශීලි මහතකු වීසින් පිරිනමන ලදි.

බෙන්ජමින් කිරිහෙට්ටි

## දුනකදෙණිය 133 වැනි මංගල උලෙළ

අපේ ජීවිත පුරාවට දෙවියන් විසින් අප වෙත දක්වන ප්‍රේමයට සාක්ෂි දැරීමට අවස්ථාවක් කරගන්න. දිව්‍ය සත්ප්‍රසාදය තුළින් අප ලබන පන්නරය ගැඹුරු කරගන්න. දෙවියන්ට මහිමය ඇතිවන ලෙස ලෝකය භාවිත කරන්න ලිං මැඩි ගෝත්‍රයට අසු නොවන්න.

දුනකදෙණිය මීසම් සේවක ගරු ක්‍රිස්ටි ලෙනාඩ් පියතුමා එසේ ප්‍රකාශ කර සිටියේ නාලවලාන අග්‍රදූත ශු. මිඛායෙල් තුමාගේ දේවස්ථානයේ පැවති මංගල සැඳෑ මෙහෙයේදීය. මීසම් සේවක වින්සන් ප්‍රනාන්දු පියතුමාගේ සහ නාලවලාන කිතුනු, බොදුනු හැමදෙනාගේ මෙහෙය වීමෙන් වාර්ෂික මංගල මෙහෙය උත්සවාකාරයෙන් නිමාවිය.

ජේ. විල්ප්‍රඩ් සමරසිංහ



තුඩැල්ල ක්‍රිස්තු රාජ ජාතික පාසලේ 70 වැනි ජුබිලි මංගල්ලය අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුනි. ගුරුවරුන් විසින් ප්‍රතිමාව ඔසවාගෙන යන අයුරු මෙහි දැක්වේ.

## දුම්මලදෙනිය ශාන්ත නිකුලා දෙව්මැඳුර

පුදබිමක අසිරිය



වසර 125 කට අධික කාලයක් පුරා විරාජමානව බැබලෙන මේ පුණ්‍ය භූමිය කොළඹ පුත්තලම මහා මාර්ගයේ දුම්මලදෙනිය ග්‍රාමයේ මුදුන් මල්කඩයි. දැනට පවතින දෙව්මැඳුරේ ආරම්භය 1880 ලෙස සඳහන්ව ඇති හෙයින් වසර 125 ජුබිලි සංවත්සරය ක්‍රි.ව. 2005 දී උත්සවාකාරයෙන් පැවැත්වීය. ඊට පෙර පොල්අතු මඩුවක් ලෙසින් ඉදිකර තිබූ දේවස්ථානයට ඊට වඩා වැඩි ඉතිහාසයක් ඇත.

මුලින් 20 ක් පමණ වූ කතෝලික පවුල් සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවනවිට දේවස්ථානයක අවශ්‍යතාව ඇති වූයෙන් එවකට සිටි දානපතීන් මෙම භූමිය පරිත්‍යාග කරන ලදුව දැනට පවතින දෙව්මැඳුර සෑදීමට පෙර කුඩා පොල්අතු මඩුවක් ලෙසින් මෙම පුදබිම තුළ දෙව්මැඳුරක් ආරම්භ වී ඇත. ඊට සමගාමීව ඉදිවූ රෝමානු කතෝලික විදුහල 1869 දී ආරම්භ වූ බව සනිටුහන් වේ. ගරු චුනවෙල් පියතුමා 1880 නොවැම්බර් 21 වන දින මෙම දෙව්මැඳුර සඳහා මුල්ගල තැබීය.

වර්තමාන මීසම් සේවක ගරු ජස්ටින් වර්ණකුල, සහයක ගරු මාලන් විජේන්ද්‍ර පියතුමන්ගේ මහත් කැපවීමෙන් දේවස්ථානයේ මෙන්ම මීසම් ජනතාවගේ අවශ්‍යතාවන් ඉටුකැරේ. බ්‍රහස්පතින්දා දින ශු. නිකුලා මුනිඳුන් වෙනුවෙන් කැප කර ඇති අතර දහම් පාසල ද නිකුලා මුනිඳුන් වෙනුවෙන් නුවානය ද පැවැත්වේ. දරුවන්ගේ ආරක්ෂාව පතා යදින දෙමව්පියන් ද, විවාහ දිවියට ඇතුළු වීමට බලාපොරොත්තු වන්නන්ද, විවාහ වී දරු ඵල නොමැති වූවන්ද බොහෝ දුර කතර ගෙවාගෙන උන්වහන්සේගේ පිහිට පතා මේ දේවස්ථානයට පැමිණ සහනය අත්කර ගැනීම නොරහසකි.

අද වන විට දේවස්ථානයට අයත් පවුල් 600 ක් පමණ වෙති. දෙසැම්බර් 08 දින දුම්මලදෙනිය ශා. නිකුලා දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට සියළු කටයුතු සූදානම් කර ඇත.

## පන්නිපිටිය දහම් පාසල් සේවා නවතාවයක්

පන්නිපිටිය මීසමේ දෙව්මැඳුරු හයේ ක්‍රියාත්මක වන දහම් පාසල් අතර සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම උදෙසා දහම් ගුරුවරුන්, දෙමාපියන් සහ ළමුන් ඒකාබද්ධ කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ.

සියලු දහම් පාසල් ගුරුවර ගුරුවරියන් එකමුතුකොට ඔවුන්ගේ සේවා කටයුතු වලට නව අරුතක් ලබාදීම මීසම් සේවක ගරු ටිරෝන් පෙරේරා සහ සහයක ගරු දිනේෂ් කීර්තිසිංහ පියවරුන් විසින් කරනු ලබයි. දහම් පාසල් බාරව කටයුතු කරන දොමිනිකාන නිකායික පැවිදි සොහොයුරියන් වෙතින්ද මෙම වැඩ පිළිවෙල සඳහා පූර්ණ සහය ලැබේ.

ක්‍රිස්ටෝපර් රණසිංහ



රටවල් රාශියක් පුරා පවත්වන තෝරාගැනීම (cnoice) ජාත්‍යන්තර තරුණ වැඩමුළුව කන්ජුක්කුලිය මීසමේ තරුණ තරුණියන් 42 ගේ සහභාගිත්වයෙන් පුරා දින දෙකහමාරක් උඩයන්දළුව කුඩාමඩු දේවස්ථානයේදී පැවැත්විය. ගරු ජූඩ් නික්ලස් පියතුමා, ගරු රෝස් පැවිදි සොහොයුරිය, සිංගප්පූරු ජාතික ඩේවිඩ් මහතා සහ තවත් 6 දෙනෙකුගෙන් යුත් මෙහෙයවීමේ කණ්ඩායමක් මෙය සිදුකළ අතර තරුණ දරුවන් සහ දෙමාපියන් යොමු කරමින් කන්ජුක්කුලිය මීසම් සේවක ගරු ජුඩ් ඩයස් සහයක ගරු රනිල් ඉන්දික පියතුමන් සහ ගරු ප්‍රියන්තා වාස් පැවිදි සොයුරිය විශාල දායකත්වයක් දැක්විය.

ෂෙහානි තත්සරණී ද මැල්



වැල්ලබඩ ශුද්ධ වූ ජූඩ් මුනිඳුන්ගේ වාර්ෂික මංගල්‍ය දිව්‍ය පූජා මෙහෙය ලොයලා විදුහල්පති ගරු තිලකසිරි ප්‍රනාන්දු පියතුමා පැවැත්වූ අතර එහිදී මීසම් සභාවේ බී. කේ. එම්. එස්. රුද්‍රිගු මහතා පඬුරු පිළිගැන්වූ අයුරුයි මේ.

එස්. කේ. ජේ. කුරේරා



සීදුව මීසමට අයත් බණ්ඩාරවත්ත අකම්පාල දේව මාතාවන්ගේ දෙව් මැඳුරට අවශ්‍යව තිබූ මීසම් ගෘහයක් සඳහා මුල්ගල තැබීම මීසම් සේවක ගරු ඇන්ටන් ප්‍රේමලාල් පියතුමා අතින් සිදු විය.

ජූඩ් ප්‍රනාන්දු

දේව වචනයෙන් හික්මීම් ප්‍රදීපය ධර්ම සංග්‍රහය

# මේ "මරිය වසර" තුළදී දෙව්මවුන්ට වඩ වඩාත් සමීප වෙමු

## කුමරි මරියාවන් වටා ගෙතුනු දුර්මත දුරලමු

**පසුගිය සතියෙන්...**

ජේසුස් වහන්සේ මරිය මාතාවගේ කුළුඳුල් පුතනුවන් නිසා ඇයට තවත් දරුවන් සිටින්නට ඇති බවට කෙනෙකුට තර්කයක් ඉදිරිපත් කිරීමට පුළුවන. එයද පදනම් විරහිත ආකල්පයකි. ප්‍රථ කාන්තාවකගේ කුසය විවර කරන පළමු දරුවා "කුළුඳුලා" ලෙස ඊශ්‍රායෙල් ජනතාව හඳුන්වති. ප්‍රථම දරුවා කුළුඳුලා ලෙසින් අමතන්නට දෙවෙනි දරුවා ලැබෙන තෙක් බලා සිටීමට මවකට කිසි ලෙසකින් හෝ වුවමනා වූයේ නැත. යම්කිසි පවුලකට එක් දරුවකු බිහිවුණද එම දරුවා කුළුඳුල් දරුවා ලෙසින් ශුද්ධවූ බයිබලය හඳුන්වා තිබෙන බවට සාක්ෂි තිබේ. ජෝෂුවා 17:1 ඊට නිදසුනකි.

මරියතුමිය කන්‍යාවක් වන බව ශුද්ධවූ බයිබලය මෙන්ම අපෝස්තුළුවරුන්ගෙන් පැවත එන ඉපැරැණිවූත් අඛණ්ඩවූත් සභා සම්ප්‍රදාය පිළිගෙන තිබේ. මරිය වහන්සේගේ කන්‍යාභාවය පිළිගනු ලැබූ බොහෝ පුද්ගලයන් අතර කීප දෙනෙක් ඒ සම්බන්ධව ලියා තිබෙන බවට සාධක ඇත. ශුද්ධවූ ජස්ටින් මුනිතුමා (ක්‍රි.ව. 150) "Dialogue with Tripho" Chap 76+ 78 "First Apology Chap 1:33, සාන්ත ඉරේනියුස් මුනිතුමා (ක්‍රි.ව. 125-202) "Adverses Hereses" 6k3( chap 21:4; chap 4:33 හිප්පොලිකස් (ක්‍රි.ව. 215 - 217), "Apostalic Tradition" No: 21, ශුද්ධවූ අතනාසියුස් (ක්‍රි.ව. 358-362). "Discourses Against the Arians" chap 2:70

ඉහත සඳහන් සෑම පුද්ගලයෙක්ම මරියාවන් සදා කන්‍යාවක් වූ බව තහවුරු කරයි. ක්‍රි.ව. 374 දී එපිපානුස් විසින් ගෙන හැර දැක්වූ විශ්වාස ලක්ෂණයෙහි "කන්‍යා මරියාව" යනුවෙන් මරියතුමිය හඳුන්වා දී ඇත. ඉන් අනතුරුව ක්‍රි.ව. 381 දී පැවති කොන්ස්තන්තිනෝපල් මන්ත්‍රණ සභාවේදී එය "ශුද්ධාත්මයාණන්ගේ ආනුභාවයෙන් කන්‍යා මරියාවන්ගෙන් මිනිස් බව ගෙන උන්වහන්සේ මනුෂ්‍යයා වූ සේක ලෙසින් සභා සම්මතව ප්‍රකාශයට පත් විය.

එපමණක් නොව එපිපානුස් මෙලෙස නිරූපණය කරයි. එනම් "කන්‍යා" නමැති නාම විශේෂණය නොයොදා මරිය මව ඇමතූ කෙනෙක් සිටීද? "කන්‍යාව" ලෙස නිතර ඇමතූ එතුමිය කන්‍යාවක් ලෙස ජීවිතාන්තය දක්වා කල් ගත කළාය. ඒ නිසා එතුමියගෙන් එම ගරුතර නාමය ඉවත් නොකෙරේ. අද වුවද දිව්‍ය පූජා යාගය සඳහා යොදා ගන්නා ස්තෝත්‍ර යාගික යැදුම් දීර්ඝ ඉතිහාසයකට සම්බන්ධයක් දක්වයි. "තේජවත් මැණියන් වූ නිත්‍යකන්‍යා මරියෝත්තමාව" ලෙස මරිය වහන්සේ හඳුන්වයි.

අප මරිය වහන්සේට වන්දනා නොකරන අතර ගෞරවය, භක්තිය, ආදරය දැක්විය යුතුය. එතුමිය ජීවමාන උත්තමාවකි. ශුද්ධාත්ම බලයෙන් පිරිපුන් තැනැත්තියකි. ඒ නිසා මරියෝත්තමාවන් වෙතින් අපට වුවමනා දේවල්, වරප්‍රසාද අයැදිය යුතුය. එය වරදක් නොවේ. එතුමියට එරෙහිව සිටින සැමට පැමිණෙන දුර්විපාක ස්ථිරය. එබැවින් අප විසින් කළ යුතු දෙයක් ඇත. එනම් එතුමිය වෙත නිරන්තරයෙන් සමීප වෙමින් මාතෘක රැකවරණය, සෙනෙහස අත්දැකීමයි. එය අපට පැවරෙන වගකීමකි. දූත මෙහෙවරකි.

ඒ නිසා එම යථාර්ථයට අවදි වී මරිය වහන්සේගේ නොවරදින සුළු මැදිහත්වීම හඳුනා ගැනීමයි. ඊට බද්ධ විමයි. සංවේදී වීමයි. මෙයට ප්‍රතිචාර දැක්වීමට අප දිවි හිමියෙන් පරිත්‍යාගශීලි විය යුතුය. කැප විය යුතුය. එවිට අපට ජේසු ක්‍රිස්තුන් වහන්සේ මතු දිනෙක උරුම කර දෙන ස්වර්ගික අමන්දානන්දයට සාක්ෂි දරන්නට හැකි වනු නියතය.

-නිමි-

✍ මලින්ත බෝපෙආරච්චි




## මරිය වසර සුව ගෙන දෙයි

දිව්‍ය සත්ප්‍රසාදීය දශකය තුළ — මෙම
දෙව් මව් ගුණ සුවඳ පැතිර යන අතකම — හැම
මරිය වසර තුළදී සොමිනස විඳ නැති — නිම
දොරටුව හැර ගනිමු යදින්නට දෙව් මව් — පෙම

බාධක හමුවේ මතුවන නොබලන්නට — හැරී
අපහට උරුම වේ මව වෙතින් නොමඳව — දිරී
දෙව් පුතු වෙත දෙව් මව තුළ පැවතුන පෙම — පිරී
අප වෙත එනු ඇත නිසැකව නිරතුරුවම — පෙරී

අවනත වී හැමවිටකදී දේව වදන — වෙත
විශ්වාසය තුළ රැඳෙමින් ගෙවමින් දිවි — පෙත
ජයගන්නට හැම අභියෝගය පාරන — සිත
මරිය වසර තුළින් සැමට දොරටු ඇරෙනු — ඇත


**පස්කල් ජයමාන්න - උස්වැටකෙයියාව**



දහම් කිතිවිල්ල

"සැබෑ ධර්මිෂ්ඨකම රදා පවතින්නේ ආගමික බාහිර චාරිත්‍ර වාරිත්‍ර පිළිපැදීම මත නොව සැබෑ සිත් හැරීම මතය." (කුලියාපිටියේ රීටා සේනානායක)

## මරිමවුන් පාමුල



ගිලිහිලා වට තුසර — බිඳුවයි
සැලෙන අතු අග දිලෙන පහන් — සිලයි
මරි මවුන් පාමුල දැල්වෙනා ඉටි — පහනයි
මහදට ගෙනෙන්නේ — සහනයක්මයි

සුරලොව වෙත නගිනා — ඉණිමගය
මවුනි අප අතැගිලි රැඳෙනා — ජපමාලය
එකට යදින පවුල එකට හිඳිනා — බලය
දෙව්පුතුගෙන් ලබනුයේ — දේවාසිරිමය

ජේසුගේ විමුක් මග මෙනෙහි — කරන්නට
සැදැහැ සිතින් ජේසු වගේ — වෙන්නට
දිනෙක සුරලොව කිරුළ — දිනන්නට
අප ගෙන යනු මැන නිමල මරිය — රැජිණියේ

**ශ්‍රියානි මානෙල් පෙරේරා - ගිරිඋල්ල**

## ස්තෝත්‍ර යාගික යැදුම් II. III හා IV සඳහා සා. ජුසේ මුනිඳුන්ගේ නාමය ඇතුළත් කිරීම

**අති උතුම් සොළොස්වන බෙනඩික් විශ්‍රාමික සුදතුම් පියාණන්ගේ අභිලාෂය සිහි කැඳවමින් හා අති උතුම් ෆ්‍රැන්සිස් වත්මන් සුදතුම් පියාණන්ගේ අනුමැතිය මත දේව වන්දනාව සහ සක්‍රමේන්තු විනය (කටයුතු) පිළිබඳ ශුද්ධාසනීය පර්ෂදය විසින් රෝමානු දිව්‍ය පූජා සංග්‍රහයේ භාවිත කරනු ලබන ස්තෝත්‍ර යාගික යැදුම් II, III සහ IV සඳහා සා. ජුසේ මුනි නාමය ඇතුළත් කරන ලෙසින් 2013. 05. 01 දින නියෝගයක් පනවන ලදි.**

පටෙර්නාස් විශේස් නම් වූ එම (ආඥාත්තියක්) නියෝගයට අනුව "දේවමාතාවන් වහන්සේගේ අති පිවිතුරු දම්පතීන් ලෙසින් මෙන්ම විශ්විය සභාවේ ස්වර්ගීය උපකාරකයන් ලෙසින් සන්තතික භක්තිය සා. ජුසේ මුනිඳුනට දක්වමින්, සමස්ත කතෝලික සභාවේ විශ්වාසිකයෝ, එතුමන්ගේ ස්මරණයට ගාම්භීරව සහ නිරන්තරයෙන් ගරු කරන්නෝ ය."

මෙම භක්තියට ප්‍රතිචාර දක්වමින් වර්ෂ 1992 නොවැම්බර් මස එනම් දෙවන වතිකාන මන්ත්‍රණ සභාව ආරම්භ වීමෙන් මසකට පසු රෝමානු දිව්‍ය පූජා නියමය තුළට සා. ජුසේ මුනි නාමය ඇතුළත් කරන ලෙස එවකට සසුන් පියා වූ භාග්‍යවත් විසිතුන්වන ජුවාම් සුදතුම් පියා විසින් නියෝග කරන ලදි.

ලොව පුරා විසිර පැතිර සිටින සැදැහැවතුන්ගේ ඉල්ලීම් වලින් අනුප්‍රාණය ලැබ, අති උතුම් සොළොස්වන බෙනඩික් විශ්‍රාමික සසුන් පියා විසින් සා. ජුසේ මුනි නාමය ස්තෝත්‍ර යාගික යැදුම් තුළට නිල වශයෙන් ඇතුළත් කිරීමට මූලික අනුමැතිය ලබා දෙන ලදුව එහි අවසාන තීරණය ගැනීම සහ එය ක්‍රියාත්මක කිරීම තම අනුප්‍රාප්තිකයාණන් වෙත ඉඩ හරින ලදි.

ඒ අනුව මෙම මොහොතේ සිට බලාත්මක කෙරෙන පරිදි II, III සහ IV යන ස්තෝත්‍ර යාගික යැදුම්වල පහත සඳහන් වෙනස්කම් ඇතුළත් කොට ඇත.

⋆ ස්තෝත්‍ර යාගික යැදුම් II

දේව මාතාවන් වන කන්‍යා මරියාවන් ද, එතුමියගේ දම්පතීන් වූ භාග්‍යවන්ත ජුසේ තුමා ද, භාග්‍යවන්ත අපෝස්තුළුවරුන් ද...

⋆ ස්තෝත්‍ර යාගික යැදුම් III

දේවමාතාවන් වන අති භාග්‍යවත් කන්‍යා මරියාවන් ද, එතුමියගේ දම්පතීන් වූ භාග්‍යවන්ත ජුසේ තුමා ද, භාග්‍යවන්ත අපෝස්තුළුවරුන් ද විරෝදාර ප්‍රාණ පරිත්‍යාගිවරුන්ද....

⋆ ස්තෝත්‍ර යාගික යැදුම් IV

දේව මාතාවන් වන භාග්‍යවත් කන්‍යා මරියාවන් ද, එතුමියගේ දම්පතීන් වූ භාග්‍යවන්ත ජුසේ තුමා ද, භාග්‍යවන්ත අපෝස්තුළුවරුන් ද....

✍ ජාතික ජනවන්දනා අධ්‍යක්ෂ
**ගරු ඉග්නේෂස් වර්ණකුලසිංහම් පියතුමා**

# දිළිඳුන් හට වඩාත් ගුණාත්මක ජීවිතයක් ළඟා කළ හැකිවන්නේ කා හට ද?

**අද ඉතා ස්වල්ප දෙනෙක් පමණක් දිළිඳුකම ආශිර්වාදයකැයි පවසති. දිළිඳුකම සදාචාරාත්මක අයහපතක් බවට පත්ව ඇති අතර එය ප්‍රීතිමත් ජීවිතයේ ප්‍රබල සතුරෙකි.**

දිළිඳුකම මිනිස් නිදහස විනාශ කරමින් යහපත් ගති පැවතුම් සහ ගුණ දහම් ජීවත්වීම දුෂ්කර කරයි. ඒවා ප්‍රායෝගික නොකරයි. සමකාලීන තරඟකාරී ලෝකයෙහි ජීවත් වන බොහෝ දිළින්දෝ බල රහිත පුද්ගලයෝ වෙති. පාගා දමනු ලබති. පීඩාවට පත් වෙති. නොසලකා හරිනු ලබති. තරඟකාරී සමාජයේ අවමානයන්ට එරෙහිව තමන් ආරක්ෂා කරගනු සඳහා අවශ්‍ය සමාජ බලය, සමාජීය ගරු නම්බුව, සහ බලපෑම ඔවුන් සතු නොවේ. සමහර දිළින්දෝ සිය අවංකකම ආරක්ෂා කර ගනිමින් සමාජ බලය සහ ගරු නම්බුව සොයන සමාජය විසින් පහත් කොට සලකනු ලැබීමට පවා කැමැත්තක් දක්වති.



**ජේසුස් වහන්සේ සහ දිළින්දෝ**

ජේසුස් වහන්සේ දිළිඳුන් දුටුවේ දේව දරුවන් සහ දෙවියන් වහන්සේ විසින් ආශිර්වාද කරනු ලැබූවන් ලෙසයි (ලූක් 6:20). උන්වහන්සේ සිය ජීවිතයත් දූත කාර්යයත් මගින් දිළිඳුන් කෙරෙහි වූ දේව ආදරය සහ සැළකිල්ල පෙන්වා දුන් සේක. දෙවියන් වහන්සේ විසින් තමන් එවන ලද්දේ දිළිඳුන් හට සුභාරංචිය දේශනා කිරීමට බව ප්‍රකාශ කළ සේක (ලූක් 4:18). තමන් මුළුමනින්ම දිළිඳුන් සමඟ අනන්‍ය කරගනු සඳහා සිය ප්‍රේමය මගින් මෙහෙයවනු ලැබූ සේක (මතේව් 25:40-45). දිළිඳුන් හා තමන් අනන්‍යකර ගැනීම සඳහා උන්වහන්සේ පොළඹවනු ලැබුවේ ඔවුන්ගේ දුක් වේදනාය. ජේසුස් වහන්සේ මෙලෙසින් දිළිඳුන් කෙරෙහි වූ දෙවියන් වහන්සේගේ කොන්දේසි විරහිත ප්‍රේමය පෙන්වා දුන් අතර සත්‍ය වශයෙන්ම සුභාරංචිය වූයේද එයමය. ජේසුස් වහන්සේ දිළිඳුන්ගේ සුබ සෙත වෙනුවෙන් ඇප කැපවූවා සේම සිය ශ්‍රාවකයින් හට ද දිළිඳුන්ට ප්‍රේම කිරීමට ඉගැන්වූ සේක.

ජේසුස් වහන්සේගේ ඉගැන්වීමට අනුව "ප්‍රේමය" යනු මිත්‍රත්වය තුළ පෙන්වන හුදු සෙනෙහෙබර චිත්තවේගයක් නොවේ. එය මිතුරන් එකට එක් කරන ප්‍රේමයකි (ලූක්11:5). අසල්වැසියා තුළ දකින අවශ්‍යතාවයට වඩා සංවේදී වෙමින් ක්‍රියාකාරී පිළිතුරු සපයන ඵලදායක සැළකිලිවන්තවීමේ ප්‍රේමයක් පිළිබඳවද ජේසු සමිඳුන් පැවසූ සේක (ලූක් 10:29-37). ඵලදායක අගාපීය ප්‍රේමය යනු ඉතා ගෞරවාන්විතව අසල්වැසියා හට යහපත කිරීමයි (ජී. එම්. සොආරෙස් ප්‍රභු - ජේ.නි.). පොහොසතුන් වෙතට වඩා විශේෂාකාරයෙන් දිළිඳුන් වෙත යොමුවන ප්‍රේමය අනුකම්පාවයි. නැති බැරි කමින් සහ අසරණ කමින් පීඩා විඳින්නෝ දිළිඳුන් බැවින් ඔවුහු අනුකම්පා සහගත හැඟීම් ජනිත කරවති. (ඇල්බට් නෝලන්)

ජේසුස් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද අනුකම්පාව (ලූක් 6:36) මගින් දිළිඳුන්ගේ ද්‍රව්‍යාත්මක සහ සමාජීය අවශ්‍යතාවයන්ට පිළිතුරු දීම ඉල්ලයි. පීඩිතයින් වෙත විමුක්තියේ සුභාරංචිය රැගෙන යාමද (මතේව් 11:5) පීඩිතයින් නිදහස් කිරීමද (ලූක් 4:16-18) කළ යුතු වෙයි.

දෙවියන් වහන්සේ දිළිඳුන් හට විශේෂ වටිනාකමක් දානය කරන්නේ සකල මිනිස් වර්ගයාට සිය ආදරය ද, දුක් විඳින්නන් හට අනුකම්පාවද දක්වනු සඳහා තමන් වහන්සේ ජේසු සමිඳුන් තුළ මනුෂ්‍යයා වූ හෙයිනි. ජේසුස් වහන්සේ දිළිඳුන් වෙත දෙවියන් වහන්සේගේ ආදරය ප්‍රකාශ කළේ කෙසේදැයි සුවිශේෂ මගින් අපට කියා දෙයි. වැන්දඹුවගේ එකම පුත්‍රයා මිය ගිය පසු නැවත නැගිටුවාලමින් අනුකම්පාව දැක්වූ සේක (ලූක් 7:12-14). සාගිනි වූවන් මග දිගේ ක්ලාන්තවේ යයි සිතූ ජේසුස් වහන්සේ ඔවුන් සාගින්නෙන් නොයවා සිත් සේ අනුභව කිරීමට අවශ්‍ය ආහාර දානය කළ සේක (මතේව් 15:32). දිළිඳුන් කෙරෙහි වූ සැළකිල්ල ජේසු සමිඳුන්ගේ ජීවිතයෙහි කැපී පෙනුන ලක්ෂණයක් විය.

☛ ලබන සතියට

✍ **ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා**

ජන වන්දනාව

# "සූදානම් වන්න, තවමත් සුනංගු නැත"

ඉරුදින මෙනෙහි කිරීම



## ආගමන සමයේ පළමුවන ඉරුදින

ස්වාමින් වහන්සේ අපගේ ජීවිතයට බලපාන ඔවුන් වහන්සේ අපට කතා කරන ආකාරය එකිනෙකාට වෙනස් වූවත් අනිවාර්යයෙන් ඔවුන් වහන්සේව අත්දකින්නට සලස්වයි. ඒ හඬට පිළිතුරු දීම අපගේ වගකීමයි. ඔවුන්වහන්සේ මහිමාන්විතව නැවත වඩින දිනයේ දී ඔවුන් වහන්සේට වග උත්තර බඳින්නට අපට නිසැකයෙන්ම සිදුවේ. ඔබ සූදානම් ද? මොහොතක් මෙනෙහි කරන්න.

නෝවා ලහි ලහියේ නැවක් සූදානම් කරන විට මිනිසුන් සිතුවේ ඔහුගේ මනස විකෘති වී ඇතැයි කියාය. නැත්නම් "මේ නියං කාලයේ මොන නැවක් ද?" නෝවා දෙවියන් වහන්සේගේ අණට කීකරු වී විනාශයට මුහුණ දීමට සූදානම් වන විට මිනිසුන් කා බී ප්‍රීතිවෙමින් ලෞකික සැප සම්පත සමරන්නට විය. නමුත් අපගේ මිනිස් මනසින් සිතන දෙය දෙවියන් වහන්සේගේ සිතිවිලි මෙන් නොවේ. එහෙයින් අවසානයේ දී නොදන්නා මොහොතක ජලගැල්ම පැමිණි විට ඉන් ගැලවෙන්නට නෝවාට හැකි වූයේ දේව හඬට කීකරු වූ නිසාය. අන් අයට විනාශය අත්දකින්නට සිදු වූයේ තමන්ගේ ලෝකයේ තමන්ගේ ආශාවන්ට වහල් වූ නිසාය. ඒ හෙයින් දෙවියන් වහන්සේගේ හඬට කීකරු වීම හා අකීකරු වීම යන්න පදනම් කොට ගෙන සදාකාලික ස්වර්ග රාජ්‍යයත් සදාකාලික නිරයත් අපට හිමි වේ. අද සුපුවත පෙන්වා දෙන ආකාරයට හොරා නොදන්නා පැයකදී නිවසට කඩා වැදී විනාශයක් කර යයි. ඔහු කිසිවිටෙකත් දැනුම් දීමක් කර නිවසට කඩා වදින්නේ නැත. ඒ නිසා නිවෙස් හිමියා සැමවිටම සූදානම්ව සිටිය යුතුයි. ඔහු සූදානම්ව සිටින්නේ නම් විනාශය මග හරවා ගත හැකිය. නමුත් ඔහු සූදානම්ව නොසිටී නම් විනාශය ප්‍රබල වේ.

ජීවිතය වෙනස් කරගන්නට කිසිවකු කිසිවිටෙකත් සුනංගු නැත.



නමුත් අවදිව සිටීම ඉතා වැදගත් ය. ඒ මන්ද නොදන්නා මොහොතක නොදන්නා ආකාරයෙන් ස්වාමින් වහන්සේ අපට කතා කරනු ඇත. ලෞකික ආශාවන් තුළ ඇලී ගැලී නොසිට ජීවිතයේ සැබෑ අරමුණ වන ශුද්ධවන්තකම නිතර මතක තබා ගත යුතුයි. අද සුපුවත තුළින් ස්වාමින් වහන්සේ "සූදානම්වීම" ගැන ඉතා බලවත් ලෙස හෙළිදරව් කරයි. මොකක්ද මේ "සූදානම් වීම" කියන්නේ.

අලුත් ආරම්භයකට මුල පුරන මේ නව ජනවන්දනා වසරේදී ස්වාමින් වහන්සේ අපට පවසන්නේ දයාවේ ක්‍රියාවන් වල යෙදෙමින් සූදානම් වන්නටයි. රළු හදවතක් වෙනුවට මානව දයාවෙන් පිරුණු හදවතක් ඇතිකරගන්නටයි. යහපත් සමරිතානුවරයා මෙන් අනෙකාගේ අවාසනාවන්ත මොහොතේ දී ඔහු තනිකර නොයන්නටයි.

සූදානම් වීම යනුවෙන් ස්වාමින් වහන්සේ අදහස් කරනුයේ සමාවදීමේ ආදරය ජීවිත තුළ ඇති කරගනිමින් ඔවුන් වහන්සේගේ මහිමාන්විත පැමිණීමට සූදානම් වීමටයි. හිතේ තදකරගෙන සිටින අසමගියේ කටු සටහන්, වෛරයේ අඟුරු මතක ආදරය නමැති මෙවලමින් මකාදැමීමටයි. එවිට නොදන්නා මොහොතක පැමිණෙන මහිමාන්විත ස්වාමින් වහන්සේ ආදරයෙන් පිළිගන්නට අපට හැකිවේවි.

සූදානම් වීම යනුවෙන් ස්වාමින් වහන්සේ අදහස් කරනුයේ සාමයේ ක්‍රියාවන් තුළ නිරතවීමයි. අන් අය භේද භින්න කරනවා වෙනුවට සාමයේ, ආදරයේ මෙවලමක් වන්නටයි.

සූදානම් වීම තව පැත්තකින් බලන විට යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීමයි. නොදන්නා මොහොතක පැමිණෙන ස්වාමින් වහන්සේ පිළිගන්නට නිරන්තර යාච්ඤාවේ ජීවිතයක අවශ්‍යතාව උන්වහන්සේ පවසයි. ඒ නිසා සූදානම් වන්න. ඔබ තවමත් සුනංගු නැත. මේ මොහොතේ, මේ දැන් එය ආරම්භ කරන්නට අදිටන් කරගන්න.

ජාතික දේවසත්හලේ ගොන්සාල්වෙස් සිංහල ආයතනයේ
**ගරු රවින්ද්‍ර පීරිස් සහෝදරතුමා**

## පූජා සතිය
## දෙසැ. 01 සිට දෙසැ. 08 දක්වා

| | |
|---|---|
| දෙසැ. 01 ඉරිදා | **ආගමන සමයේ පළමු ඉරුදින**<br>(දම්) යෙසායා 2:1-5<br>ගීතාවලිය 122:1-2,4-5,6-9<br>රෝම 13:11-14<br>මතෙව් 24:37-44<br>ලූක් 23: 35-43 |
| 02 සඳුදා | (දම්) යෙසායා 4:2-6<br>ගීතාවලිය 122:1-2, 4-5, 6-9<br>මතෙව් 8:5-11 |
| 03 අඟහරුවාදා | (සුදු) **සාන්ත ප්‍රැන්සිස් සාවියර් මුනි මංගලෝත්සවය**<br>ජෙරමියා 1:4-9<br>ගීතාවලිය 117:1-2<br>1 කොරින්ති 9:16-19,22-23<br>මාක් 16:15-20 |
| 04 බදාදා | (දම් හෝ සුදු) **සාන්ත ජෝන් ඩැමසින් මුනි**<br>යෙසායා 25:6-10<br>ගීතාවලිය 23:1-2,3-4,5-6<br>මතෙව් 15:29-37 |
| 05 බ්‍රහස්පතින්දා | (දම්) යෙසායා 26:1-6<br>ගීතාවලිය 118:1, 8-9, 19-21, 25-27<br>මතෙව් 7:21,24-27 |
| 06 සිකුරාදා | (දම් හෝ සුදු) **සාන්ත නිකලස් මුනි අනුස්මරණය**<br>යෙසායා 29:17-24<br>ගීතාවලිය 27:1,4, 13-14<br>මතෙව් 9:27-31 |
| 07 සෙනසුරාදා | (සුදු) **සාන්ත අම්බ්‍රෝස් මුනි අනිවාර්ය අනුස්මරණය**<br>යෙසායා 30:19-21, 23-26<br>ගීතාවලිය 147:1-6<br>මතෙව් 9:35-10:1,6-8 |
| 08 ඉරිදා | (දම්) **ආගමන සමයේ දෙවන ඉරුදින (බයිබල් ඉරුදින)**<br>යෙසායා 11:1-10<br>ගීතාවලිය 72:1-2,7-8,12-13,17<br>රෝම 15:4-9<br>මතෙව් 3:1-12 |

# පතුරන්න පෙරමඟට මරිය භටයිනි එන්න



කොන්දේසි විරහිතව දෙව් වදන බාරගෙන
දෙව්පියගෙ කැමැත්තම මුළු දිවියෙ දරාගෙන
මනුලොවේ විමුක්තිය තම කුසේ හොවාගෙන
මංගලම් පණිවුඩෙන් ඇරඹී දෙව් මව් ගමන

එවන් වූ දිරිය මව නූතන මනු ලොවේ
නිගාවට ලක් කරන අදමිටුවො අභිමුවේ
දෙව් මවගෙ ගුණ මහිම ගැයෙන්නට සැම මුවේ
පෙළගැසෙමු මරිය වසරට එයයි හදසුවේ

දෙව් පියගෙ හද දිනුව අපිරිමිත ගුණ පිරුණ
දේව අම්මා නමට වර්ෂයක් නම් කෙරුණ
කාදිනල් පිය හිමිගෙ සංකල්පෙන් දෙරණ
පතුරන්න පෙරමුණට මරිය භටයිනි එන්න

අගරගුරු පදවි මරිය හමුදා උසස් පාලක සභාවේ ලේකම්
**බෙනී ජයමාන්න**

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

### දෙවන සතිය සිකුරාදා උදා යාම යැදුම

### 51 වැනි ගීය

**පසුගිය සතිය හා සබැඳේ...**

### 147 වැනි ගීය

<u>දීනයන් ඔසවන සේක.</u>
පීඩිත ජනයන් ඔසවාලමින් දුදනන් පහතට හෙළමින් දෙව් සමිඳුන්ගේ සාධාරණ විනිශ්චය ඉටුවීම ගීතාවලියේ මූලික තේමාවක් සේ දිස්වේ (ගීතා 1:6, 146:8-9)

**(ආ) වගන්ති 7-11**

මෙම දෙවැනි කොටස තුළින් දෙවියන් වහන්සේ සලසන සංරක්ෂණය මුළු මිනිස් දිවියම ආවරණය කරන අයුරු ගීතිකා කතුවරයා පෙන්වන්නේ අලංකාර භාෂා ශෛලියක් උපයෝගී කර ගනිමිනි.

<u>ගී ගයන්න :</u>
දෙව්මැඳුරෙහි දේව වන්දනාවට එක් රොක් වූ ජනතාවට දෙව් සමිඳුන්ගේ ප්‍රඥාව හා ආදරය පිරි සැලැස්මට ප්‍රතිචාරය දැක්වීමට කෙරෙන ඇරියුමකි (ගීතා 119:172)

<u>අහස ආවරණය කරන සේක:</u>
මින් ඇරඹෙන වැකි කීපය තුළ මුළු නිරූපණය වන්නේ මුළු සොබා දහමත් ලොකු කුඩා සැම මනුෂ්‍යයෙක්මත් දෙවියන් වහන්සේගේ ප්‍රඥාව හා කරුණාව පිරි සංරක්ෂණය තුළ වර්ධනය වීමයි. (ගීතා 104:13-14, ජෝබ් 38:41)

<u>එතුමන්ට කම් නැත :</u>
මෙලොව බලසම්පන්න දැ සියල්ල අභිමුව දෙව් සමිඳාණන්ගේ ආධිපත්‍යය ප්‍රකාශ වන අන්දම ප්‍රබල තේමාවක් ලෙස ගීතාවලියෙහි ද දිවැසාවලියෙහිද දැක්වේ. (ගීතා 18:30, 33:16-17, ආමොස් 2:15, 1 සාමු 17:47). තවද උන්වහන්සේ කෙරෙහි ගරු බිය පාන්නෝ නිරතුරු උන්වහන්සේගේ බලය සහ කරුණාව අත්දකින්නෝය. (යෙසායා 40:29-31)




ශුද්ධ ලියැවිලි වසර

**(74)**

ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා

☛ ලබන සතියට

# අභිවෘද්ධි ආලේපය

අභිවෘද්ධි ආලේපයේ ඓතිහාසික පසුබිම සම්බන්ධව ඉතා සරළව සහ සංක්ෂිප්ත ලෙස සාකච්ඡා කිරීම ද මෙහිදී ප්‍රයෝජනවත් වනු ඇත. විශේෂ කොට කිතුනු දිවිය (පෙරදිග) ආරම්භක පිළිවෙත සම්බන්ධව අවධානය යොමු කිරීමේදී ස්නාපන පිළිවෙතට අනතුරුව ආලේපන පිළිවෙත සඳහනක් සෘජු ලෙසම නැති වුවද, ජෙරුසලමේ සා. සිරිල් මුනිතුමාගේ උපදේශනාත්මක ලියැවිලි ඔස්සේ මුණගැසෙන සාක්ෂි කිසිසේත්ම නොසැලකිය නොහැකිය. මෙහි "ආලේපනය" ඔස්සේ දායාද වන ශුද්ධාත්ම පන්නරය ඉඟි කරනු ලැබේ. තවද පෙරදිග සභාව මඟින් ස්නාපනයට අනතුරුව ඒ සමඟම ක්‍රිස්මා තෛලයේ ආලේපය දානය කරනු ලැබීමට පූජකවරුනට ඉඩ සලසා තිබුණ ද මෙම ආලේපනය ආශිර්වාද කරනු ලැබිය යුත්තේ රදගුරු තුමා විසිනි.

පස් වන සියවස ආරම්භයේ දී පවරන අභිවෘද්ධි ආලේපය දානය කිරීම ස්නාපන පිළිවෙතින් වෙන් වන්නට යොමු වූයේ ප්‍රායෝගික හේතූන් මතය. (රදගුරුතුමා ජීවත් වූ දෙව්මැඳුරේ (වසරකට වරක්) පාස්කු පූර්ව රාත්‍රි පිළිවෙතේ දී සිදු කළ කිතුනු දිවියට අවතීර්ණ වීමේ පිළිවෙතක්, අභිවෘද්ධි ආලේපය රදගුරුතුමා විසින්ම ප්‍රදානය වීම සමඟය.) අභිවෘද්ධි ආලේපය ලබා ගනු වස් රදගුරුතුමා සිටි දෙව්මැඳුරට යාම මෙන්ම රදගුරුතුමා විසින් බැහැදැකීමට පැමිණීම ප්‍රායෝගිකව දුෂ්කර විය.

එමෙන්ම 13 වන සියවසේ සිට මෙම පිළිවෙත තුළ යම් වෙනස්කම් කිහිපයක් සිදුවුනද රෝම පිළිවෙත සමස්තයක් ලෙස පැවැති බව පැහැදිලිව පෙනේ. "හිස මත අත් තැබීම, ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම" යන්න පිළිබඳව අවධානය යොමු වූයේ මෙයින් ප්‍රමුඛ වන්නේ කුමක් ද විමසීමෙනි.

1971 දී පමණ අභිවෘද්ධි ආලේපය සක්‍රමේන්තුවක් ලෙස යම් සංශෝධනයකට ලක්වීම පිළිවෙතේ කැපී පෙනෙන වෙනසක් විය. ඒ පිළිබඳව නිකුත් කරන ලද උපදෙස් මාලාවේ වැදගත් සංශෝධන කිහිපයක් සිදුවී ඇති බව පැහැදිලිය.

"පොළොව හිස්ව පාළුව තිබිණි. මහ සයුර මත අන්ධකාරය විය. දේවාත්මානුභාවය ජලය මතු පිට හැසිරුණේය" (උත්. 1/2).


"ස්වාමින් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසාද දිළිඳුන් හට සුබාරංචිය දේශනා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ සේක" (ලූක් 4:18).

☛ ලබන සතියට

අගරදගුරු පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ
**ගරු ඉන්ද්‍රා රත්නසිරි පියතුමා**

# සතියේ මුනිවරයා

ගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා විසිනි




සා. ප්‍රැන්සිස් සේවියර් මුනිතුමා 1506 දී ස්පාඤ්ඤයේ ඉතා ධනවත් වංශවත් පවුලකට දාව උපන්නේ ය. ප්‍රංශයේ පැරිස් නගරයේ උසස් අධ්‍යාපනය හැදෑරූ එතුමා, 1534 දී සාන්ත ඉග්නේසියස් ලොයොලා මුනිතුමා ජේසු නිකාය අරම්භ කරද්දී එහි ආරම්භක සාමාජිකයන් පස් දෙනාගෙන් එක්කෙනෙකු විය. සා. ප්‍රැන්සිස් සේවියර් මුනිතුමා හඳුන්වනු ලබන්නේ ඉන්දියාවේ හා ජපානයේ අපෝස්තුළුවරයා වශයෙනි.

ක්‍රිස්තුන් වහන්සේ තෝරාගත් දොළොස් දෙනාට අමතරව අනෙක් අයත් අපෝස්තුළු යන නාමයෙන් හැඳින්විය හැකිද? අපෝස්තුළුවරයා යනු දේව රාජ්‍යය ප්‍රකාශ කිරීම සඳහා යවනු ලැබූ නොහොත් පිටත්කර හරින ලද පුද්ගලයා ය. ක්‍රිස්තුන් වහන්සේ අපෝස්තුළුවරුන් පිටත් කර වසර සිය ගණනකට පසු 1541 දී සා. ප්‍රැන්සිස් සේවියර් මුනිතුමාවද දේව රාජ්‍යයේ ජීවමාන සාක්ෂිකරුවකු ලෙස තම ජනතාවට උන්වහන්සේව හඳුන්වාදීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ විසින්ම ඉන්දියාවේ ගෝව රාජ්‍ය වෙත පිටත් කර යවන ලදි.

වචන වලට වඩා තමන්ගේ ජීවිතාදර්ශයේ දේශනාව වැදගත් හා බලගතු බව වටහා ගත් ප්‍රැන්සිස් සේවියර් මුනිතුමා, එම ජනතාව විශේෂයෙන් දිළිඳු ජනතාව සමඟ ජීවත් වෙමින්, ඔවුන්ගේ ජීවිත රටාවට හැඩගැසෙමින්, ඔවුන්ගේ දුක සැප බෙදා ගැනීමේ ජීවිතාදර්ශය නිසා දහස් ගණනක් ජනතාව කිතුනු දහම වැළඳ ගත්හ.

1547 දී ප්‍රැන්සිස් සේවියර් මුනිතුමා ජපානය බලා නැව් නැගීම එතුමාගේ ධර්මදූතික ජ්වලිතකම කොතෙක්දැයි කියා අපට තේරුම් ගත හැකිය. එහිදීද එතුමාගේ උනන්දුව හා කැපවීම නිසා දහස් ගණනක් ජනතාව කිතුනු දහම වැළඳ ගත්හ. එයින් නොනැවතුන එතුමා 1555 දී චීනය බලා පිටත්ව ගියත් දෙවියන් වහන්සේගේ සැලැස්ම එය නොවීය. අතරමඟදී රෝගාතුර වූ උන්වහන්සේ වයස අවුරුදු 46 දී, උපන් දේශයෙන් බොහෝ දුරස්ව, නමුත් තම ස්වාමියාණන් ගැළවුම්කරුවාණන්ට ඉතා සමීපව ජීවිතයේ අවසන් හුස්ම හෙළීය. 1622 දී එතුමාව ශුද්ධාසනය විසින් සාන්තුවරයට ඔසවමින් ධර්මදූතවරුන්ගේ ආරක්ෂක ශුද්ධවන්තයා ලෙස නම් කරන ලදි. එතුමාගේ නොදිරන දේහය, එතුමාගේ ශුද්ධවන්ත ජීවිතය මනාව පෙන්නුම් කරන සාක්ෂියකි.

ප්‍රසාද ස්නාපනය මඟින් අප හැම කෙනෙක්වමත් දෙවියන් වහන්සේ අපෝස්තලික සභාව ගොඩනැගීම සඳහා තෝරා පත් කර ඇත. අප හැම කෙනෙක්වමත් දේව රාජ්‍යයේ ජීවමාන පණිවුඩකරුවන් ලෙස පිටත් කර යවා ඇත. එසේ නම් කිතුනු දහම යනු එකිනෙකා තම තමාගේ ආත්මය ගලවා ගැනීම නොව, ජනතාව දෙවියන් වහන්සේ වෙතට යොමු කිරීමේ දේව කැඳවීම බව හොඳින් අවබෝධ කර ගන්නට උත්සාහ කරමු.

# නත්තලේ අරුත



**කතුතුමනි,**

නොවැම්බර් 24 වන දින, 'නත්තල' සම්බන්ධනේ ප්‍රදීපයේ පළවු කත වැකියට කතු පියතුමාට තුති පුදමු. නත්තල් උත්සවය ලංවෙත්ම පටු වාණිජ පරමාර්ථ මුදුන් පත් කැර ගැනුමට වෙර දරන වෙළඳ ප්‍රජාවට කල්තියාම මෙවැනි වටිනා ඔවදනක් ඉදිරිපත් කිරීම කාලෝචිතය.

සල්ලි තියෙනවානම් හැමදාම නත්තල් යැයි අද වත්මන් සමාජයේ නිරන්තරව දෙසවනට ඇසෙන සුපුරුදු වචනයකි. නොවැම්බර් මාසයේ සිට නත්තල් සීයා රූපවාහිනියේ පුවත් පත්වල මෙන්ම ගමේ නගරයේ තාප්පවල එල්ලෙන්නේ නත්තලට සල්ලි සූදානම් කර ගන්න කියන්නාක් මෙන්ය. ඒ තරමටම නත්තල අද වානිජකරණයට ලක්වී හමාරය. මේ තත්ත්වය යම් පමණකට හෝ වෙනස් කිරීමට කිතුනු අපි උත්සාහ දැරිය යුතු වෙමු.

ජේසුස් වහන්සේගේ උපන් දිනය සැමරිය යුත්තේ, කා බී ප්‍රීතිවීමට එහා ගිය සැබෑ අධ්‍යාත්මකි නවෝදයක් තුළිනි. මේ සඳහා අප නායක එඬෙරාණන් වන අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ඉල්ලා සිටින පරිදි මෙවර නත්තල වෙනදාටත් වඩා "බෙදා හදා ගන්නාවරප්‍රසාදීක නත්තලක්" කැර ගැනීම දේව රාජ්‍යයේ වටිනාකම ක්‍රියාවට නැංවීමක් මෙන්ම, අනාගමිකයන් ඉදිරියේ අප ප්‍රේමයේ දහමේ හරය බෙදා දීමක්ද වන්නේය.

එහෙයින් මෙවර නත්තල හුදෙක් වසරකට වතාවක් කිතුනුවන් විසින් සමරනු ලබන විශේෂ උත්සවයකට සීමා නොකොට එය මාංශ ගතවු දේව පුතණුවන්ගේ දහම ක්‍රියාවට නංවන සැබෑ නත්තලක් බවට පත් කැර ගනිමු.

**ලූෂන් ෂර්ලි එඩ්වඩ්**
ගෝනවල

# මරිය වසර මරියොත්තමාවන් විසින් දුන් "තිළිණය" ක් ලෙසින් ගෞරව පෙරදැරිව පිළිගනිමු !

**කතුතුමනි,**

"මරිය වසර" ප්‍රකාශයට පත් කරන්නට ආසන්න ය. මරිය බැතිය පිළිබඳව ශ්‍රී ලාංකේය කතෝලික සැදැහැ ජනකාය ඉමහත් උනන්දුවකින් පසුවන බව රහසක් නොවේ. ආගමික වතාවත් පිළිබඳව එතරම් උනන්දුවක් නොදක්වන අයකු වුවද, මරියොත්තමාවන් පිළිබඳව දැහැමි හැඟීමකින් පසුවන බව පෙනී යයි. අපේ මුතුන්මිත්තන්ගෙන් අපට නිසගයෙන්ම උරුම වූ ඇදහිල්ල සමග දිව්‍ය ගැලවුම්කාර ජේසු සමිඳාණන්ගේ මව වීමට දෙවිපියාණන් විසින් තෝරාගත් කුමරි මරියාවන් පිළිබඳ උත්කෘෂ්ට හැඟීමකින් පසුව බව ද අපේ අත්දැකීම යි.

කතෝලිකයා මරි මවුන් කෙරෙහි කොතරම් භක්ති ආදරයකින් පසුවන්නේ ද යන්න, අප රට පුරා ඉදිවී ඇති දේව මාතාවන්ට කැප කර'ති දෙව්මැඳුරු වලින් සාක්ෂාත් වන්නේය. සාන්තුවර - සාන්තුවරියන්ට වඩා ඉහළ තලයක ලා සුදු සබය මරියාවන්ට ගෞරව කරයි. ඒ බව "මරිය වසර" ප්‍රකාශයට පත් කිරීමෙන් මොනවට පැහැදිලි වෙයි.

අපේ ජීවිත කාලය තුළ මරියාවන්ට ආමන්ත්‍රණය කරමින් "නමෝ මරියනි........!" යන සරළ යැදුම කොතරම් වාර ගණනක් උච්චාරණය කර ඇත්ද? දීර්ඝ යාච්ඤාවලියක නියැලෙන්නට නොහැකි අවස්ථා වලදී අප නිසඟයෙන්ම යොමු වන්නේ "ස්වාමිවාක් ආරාධනාව" හා "නමෝ මරියනි" යැදුමත් "සාන්ත කුරුසේ......." යැදුමත් වෙතය. අප බසයක, දුම්රියක හෝ ගුවන් යානයක ගමනේ යෙදෙන මොහොතක වුවද ඉහත කී යැදුම් සිතින් උච්චාරණය කරන්නට අපි පෙළඹෙන්නේ වෙමු.

රෝගීව යහනක දිගැදී සිටින අවස්ථාවලදී අපි කොතරම් වාර ගණනක් මේ යැදුම් උච්චාරණය කරන්නෙමුද? මරියොත්තමාව අප ජීවිත කාලය ඇතුළත කොතරම් වාර ගණනක් අපට සරණය වී ඇද්දැයි මෙනෙහි කර බැලීම වටී. මරිය තුමිය හා නිතරම ඇඳී බැඳී පවතින, 'ජපමාලය' නමැති යාච්ඤා දාමය අපට කිසිසේත් අමතක කළ නොහැකිය. තරමක උදාසීනතාවයකින් අද සමහරුන් සලකන 'පවුල් ජපමාලය' යළි ශ්‍රී ලාංකේය දේව ජනතාව තුළ 'ජීව ගන්වන්නට" සභාව දරණ වෑයම වෙනදාට වඩා ඵලදායක වී ඇතැයි අපට හැඟේ. රූපවාහිනිය විසින් ශ්‍රී ලාංකේය කතෝලිකයන් පාලනය කෙරෙන තත්ත්වයෙන් අප මිදිය යුතු කාලය උදාවී ඇතැයි අපට හැඟේ. 'මරිය වසර' 'ආවෝ ගියෝ' තත්ත්වයෙන් සම්පූර්ණයෙන්ම මුදා ගත යුතුය. 'පවුල් යාච්ඤාව' සඳහා 'අඩ පැය' ක් වෙන් කර ගැනීමට මරිය වසරේ එළිපත්තේ සිටින කතෝලිකයන් සිතට ගත යුතුය.

'ජපමාල මාසය' එම මාසයට පමණක් සීමා කර, යළි සුපුරුදු පරිදි 'යාච්ඤාවේ නොයෙදීමේ' රටාවෙන් මිදෙන්නට අපට තවත් වසරක් තිළිණ කරත. 'මරිය වසර' තිරසාරව ම පවුල් තුළ යාච්ඤාවේ ජීවිතය ප්‍රගුණ කරන්නට අපට ලැබෙන කදිම ආශිර්වාදයක් ලෙස සලකමු! මරියොත්තමාව දෙවිසමිඳාණන් වෙත අප ගෙනයන මධ්‍යස්ථකාරිය බව රහසක් නොවේ. ජේසු සමිඳාණන් මව්කුසයේ පිළිසිඳ ගන්නටත් පෙර දෙවිපියාණෝ මරිය තුමිය තෝරා ගත් සේක. එසේම ගවහලේ උපතේ සිට ශු. කුරුසියේ මරණය දක්වා ම ජේසු සමිඳාණන් අත් නොහැර ආරක්ෂා කර ගනිමින් උන්වහන්සේ සමගම සිටි මරිය මෑණියන් තරම් මධ්‍යස්ථකාරියත් අපට තවත් කොහෙන්ද?

'මරිය වසර' අපේ ජීවිත වෙනස් කර ගැනීම සඳහා මරියොත්තමාවන් විසින්ම දුන් 'තිළිණය' ක් සේ ගෞරව පෙරදැරිව පිළිගනිමු! 'පවුල' නමැති සමාජයේ කුඩාම ඒකකය තුළ යළි 'පවුල් ජපමාලය' නමැති යාච්ඤා දාමයේ 'හඬ' සවස් යාමයේ ඇසෙන්නට සලස්වමු! අපේ පවුල් එවිට ශුද්ධාත්ම ආලෝකයෙන් පිරෙනු නිසැකය!

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**
පේරලන්ද

# භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු හා අතිඋතුම් විසිතුන්වන ජුවාම් මුනි ශුද්ධවර ප්‍රදානෝත්සවය සජීවීව විකාශය කරන්න

**කතුතුමනි,**

ලබන වසරේ දේව දයාවේ ඉරුදින සාන්ත සභා මාතාවට සසුන් පිය ශුද්ධවන්තයන් දෙදෙනෙකු එක්වනු ඇත. මෙය සභා ඉතිහාසයේ තවත් එක් ශ්‍රේෂ්ඨ සන්ධිස්ථානයක් වනවාට සැක නැත. අපේ කාලයේ ජීවත් වුණ සාන්තුවරයන් දෙදෙනෙකු අතිඋත්තම ප්‍රැන්සිස් සුදතුම් පියාණන්ගේ මූලිකත්වයෙන් ශුද්ධවරයට එසවීම සියැසින් දැක බලා ගැනීමට ලක්ෂ සංඛ්‍යාත ජනකායක් පාස්කු සමයේ වතිකානයට රොද බඳිනු ඇත.

අපගේ ඉල්ලීම වනුයේ එම අවස්ථාව රූපවාහිනිය හරහා සජීවීව අප සිරිලක් කතෝලිකයන්ටද නැරඹීමට අවස්ථාව සලසා දෙන ලෙසයි. මේ සඳහා දේශීය කතෝලික සභාවත් - ජාතික රූපවාහිනි මාධ්‍යයනුත් සහයෝගයෙන් කටයුතු කර අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

**ඩී. ආර්. පෙරේරා**
දළුගම

# දහම් පාසල් තෑගි බෙදන්නට ගුරුවරුන් මව්පිය මිස වෙන කවුරුද?

**කතුතුමනි,**

සියළුම කිතුනු දෙව්මැඳුරු ආශ්‍රයෙන් පවත්වන දහම් පාසල් තුළ ඉගනුම ලබන දරු දැරියන්ගේ දස්කම් අගයන, දහම්පාසල් තෑගි පිරිනැමීමේ උත්සවයන් එළඹෙන දෙසැම්බරයේ පවත්වන්නට මේ වන විටත් සංවිධාන කටයුතු සූදානම් කරනු ඇතැයි සිතමු.

ඒ. ඒ. දරු දැරියන් දහම් පාසල තුළින් ලබාගන්නා දැනුම අගයමින් ඉහලම සාමාර්ථයක් ලබන දරු දැරියන්ට තිළිණ ප්‍රදානය කරන වාර්ෂික දහම් පාසල් තිළිණ පිරිනැමීමේ උත්සව අවස්ථාව දරුවන්ට මෙන්ම ඔවුන්ගේ දෙමාපියන්ටත් දහම් ගුරුවර ගුරුවරියන්ටත් ඉහලම සතුටක් ඇතිකරවයි. එහෙත් සතියකට වරක් වෙහෙස මහන්සිය නොබලා තම දරුවන් දහම් පාසල් වෙත යවන දෙමාපියන්ටත්, තම ශ්‍රමයත්, කාලයත් කැපකර, දරුවන්ට දහම කියාදෙමින් දහම් දැනුම දරුවන්ගේ තරමට උතුරා යනසේ ඔසවා තබන්නට දායක වෙන දහම් ගුරුවර, ගුරුවරියන්ටත් තම දැතින්ම දරුවකුට තිළිණයක් ප්‍රදානය කිරීමේ අවස්ථාවක්, මීලග දහම් පාසල් තිළිණ ප්‍රදානය කිරීමේදී ලබා දෙන්නේ නම්, දහම් පාසල් තිළිණ ප්‍රදානය උත්සව වේදිකාව මත අපට දැකගත හැකිවෙන්නේ, දෙමාපියන්ගේ සහ ගුරුවර ගුරුවරියන්ගේ හදවත් දරුසෙනහසින් ඔකඳ වෙන සංවේදී දසුනකි.

**පී. වී. ඩී. ලූවී මයිකල්**
කපුවාගාර

# ශුද්ධිකාගිනිස්ථානයේ දුක්විඳින ආත්මයන් මුදවමු !

**කතුතුමනි,**

අප මිනිසුන් ලෙස මේ ජීවන ගමනේදි දැනුවත්ව හෝ නොදැනුවත්ව බොහෝ සේ පාපයට නැඹුරුව ජීවත්වන බව අපි දනිමු. පාපයේ පල විපාක වලට බය නිසා සමහරුන් එයින් ඈත් වී ජීවත්වීමටත්, පාපය ප්‍රතික්ෂේප කිරීමටත් උත්සහ කරති. තව සමහරුන් පාපයට බය නොමැති නිසා පාපයෙ ඇලි ගැලී පාපය තුළ ජීවත් වෙති.

අප කෙසේ ජීවත් වූවත් අපගේ මරණින් පසු ශුද්ධිකා ගිනිස්ථානයට අපගේ ආත්මයන් ගමන් කරයි. එහිදි අපගේ ආත්මයන් එහි ඇති නොනිවෙන ගින්නේ දැවි දැවි ජීවත් වෙයි. එහි ජීවත් වන ආත්මයන් එයින් මිදීමට ජීවතුන් වන අපගේ පින් කුසල් බලාපොරොත්තු වේ. එම කාලය දරාගත නොහැකි දැවෙන කාලයන් වේ. ශුද්ධිකාගිනි ස්ථානයේ ජීවත්වන ආත්මයන් එයින් මුදවාලීමට හැකියාව ඇත්තේ ජීවතුන් වන අපටය, යාච්ඤාවලදි දාන මාන දීම තුළින් එම ආත්මයන් වෙනුවෙන් දිව්‍ය පූජා ඔප්පු කිරීමෙනි. එමගින් දුක් විඳින ආත්මයන් විශාල පිරිසක් නිදහස් වී යයි. එම නිසා ශුද්ධිකාගිනි ස්ථානයේ දුක්විඳින ආත්මයන් වෙනුවෙන් යදින්න ජීවතුන් වන අප සැම විට උත්සහ කරමු.

**ඉරාන් සංජීව**
අමන්දොළුව

# ජනතාවට සෙත සැළසෙයි.....!

**කතුතුමනි,**

මැති සබයට නැවත අපේ තව නවයක් වුනා
සතුටට පත්විය යුතුවේ ඒ වෙනුවෙන් සැම දෙනා
සැකයක් නැත පොදු ජනතාවට බව සෙත සැලසෙනා
නටමු ගයමු අපමණ සොම්නසින් තනම් තම්දෙනා

අසන ප්‍රශ්න වලට නියම ලෙස පිළිතුරු දෙනු ඇත
ඝනපූරණයද සබයේ අඩුවක් වන්නේ නැත
සජීවීව එය දැකගන්නට හැකිවෙයි සැමවෙත
තවත් ආශ්චර්යයක් පවතීවිද මිහිමත

සුදුස්සාට දිය යුතුමය කොයිකවදත් නිසිතැන
එක කොටසක් වෙත සීමා කළයුතු නැත මෙම පින
දරාගැනීමට නොහැකිව අද මොනවාටද බැන
නුදුනොතින් තැන යන්නට පිළිවන දවසක පැන

කළ මෙහෙවර අමතක නොකරමින් කරනුබැරි සම
පියෙන් පියට ඉහළ යන්න හැකියාවන් ලෙස තම
ඉඩදෙන විටදී ලෙසටම අද කළගුණ සැළකුම
තැකිය යුතු නොවේ වැයවන නඩත්තුවට සොච්චම

**පස්කල් ජයමාන්න**
උස්වැටකෙයියාව


# ගිහි සහභාගීත්වය දුරස්කරලීමක්!

**කතුතුමනි,**

ඉහත ශීර්ෂය යටතේ, නොවැම්බර් 17 වෙනි දින තියබෝල්ඩ් සමරතුංග ලේඛකයා විසින් ප්‍රදීපයේ පළකර තිබූ ලිපියෙන්, සියලු කරුණු පැහැදිළි කර, නිවැරදි දැක්ම එළිගන්වා තිබුණි. එය ඉතා අගය කටයුතුය. කාලයක සිට, සෑම මීසමක වාගේ, දිව්‍ය පූජා සංවිධානය කිරීම ගිහි ජනතාවට පවරන ලද්දකි. එය අඛණ්ඩව සිදුවන්නකි. නිසි පරිද්දෙන් ගිහි ජනතාවගෙන් එම සේවාව ලබා ගැනීම පූජක පක්ෂයේ වගකීමක්ද වේ.

මීසම් තුළ, ගිහි සේවාවන් ප්‍රගුණ කළයුතු වකවානුවක තියෙන සේවාවන් කප්පාදු කිරීමට මාර්ග සෙවීම අනුමත කළ හැකිද? සභාව ඉදිරියට ගෙන යාමේ වැඩිවගකීම ඇත්තේ ගිහියාටයි. මෙවැනි ප්‍රකාශනයක් අරුත්සුන් බවට පත්වන්නට ඉඩ නොහැර, ගිහියාට හිමි තැන ආරක්ෂා කර දෙමින්, ඔවුන්ගේ සේවාව අගයමු.

**රිචඩ් වික්‍රමසිංහ**
බටගම



# කිතුනු සිත් දෙවිඳු වෙත යොමු කරවන 'සුපුවත් අරණ'

**සුපුවත් අරණ**
විශ්‍රාමික අති
2007 දී අග
ලද යාච්ඤා
ගෘහයකි. ත
සෞන්දර්ය

වසර 2013 දෙසැම්බර් මස 11 වන දින කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්, මෙම ශුද්ධවූ භූමිය ආසිරි ගැන්විමෙන් අනතුරුව දෙවිඳුන් හට තුති දීමක් වශයෙන් එදින සවස 7.00 ට දිව්‍ය පූජා යාගයක් පුදනු ලබයි.

ආධ්‍යාත්මික, මනෝවිද්‍යාත්මක සහ සාමාජීය වශයෙන් පිරිපුන් පුද්ගලයින් ලෙස ජනතාව හැඩගැස්වීම සඳහා ඇපකැපවූ ආයතනයකි.

දේව ආදරයේ අත්දැකීම තුළින් ජීවිත ගැලවීමේ මාර්ගයකට යොමුකරන දේව වරප්‍රසාද නොඅඩුව ලබා ගැනීමට 'සුපුවත් අරණ' තෝතැන්නක් වේ.


'සුපුවත් අරණ', සතියේ සෑම දිනකම යාච්ඤාව සහ භාවනාව සඳහා විවෘතව ඇති අතර, සැමට ශාන්තිය සහ ඇතුළාන්ත සුවය අත්දැකීමට ඉවහල් වන පරිසරයක් මෙම භූමිය තුළ නිර්මාණය කර ඇත.

සුපුවත් අරණට පැමිණෙන ඔබට අවශ්‍ය උපදෙස් විමසීම් කාර්යාලයෙන් ලබා ගත හැකි අතර විස්තර සඳහා අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න.
www.supuwatharana.org

සෑම බදාදා දිනකම සවස 7.00 ට ප්‍රශංසාත්මක මෙහෙය සමග දේව වචනය බෙදා ගැනීම සහ සෑම සිකුරාදා දිනකම උදේ 7.00 ට දේව වචනය බෙදා ගැනීම සමග දිව්‍ය පූජාව පැවැත්වේ.

කොළඹ අගරදගුරු පදවියේ බොහෝ කතෝලික ආගමික සංවිධාන හා ආයතන උත්සව, භාවනා වැඩසටහන්, ඥානකාන්ති හා වෙනත් ආධ්‍යාත්මික වැඩසටහන් රැසක් පැවැත්වීම සඳහාද මේ වන විට 'සුපුවත් අරණ' තෝරා ගැනීම සුවිශේෂී කරුණකි.

පරිසර හිතකාමී ලෙස නිමවා ඇති 'සුපුවත් අරණ' මධ්‍යස්ථානය සොබා දහමට ඇළුම් කරන්නන්ටත් නිසල නිස්කලංක පරිසරයට කැමැත්තක් දක්වන්නන්ටත් සිය ආධ්‍යාත්මය නිවා සනසා ගැනීමට අපූරු තෝතැන්නකි. වෙනත් අයුරකින් පැවසුවහොත් එය දෙවිඳුන් හා මිනිසුන් යා කරනු ලබන ඉතා අගනා සොබා දහම් පාලමකි.



**ණ** - කොළඹ අගරදගුරු පදවිය යටතේ අපෝස්තලික සේවාවක් ලෙස වර්ෂ 2000 දී අගරදගුරු
ි උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ආශිර්වාදය ඇතිව ආරම්භ කරන ලදුව, වසර
රදගුරු විශ්‍රාමික අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසින් ආශිර්වාද ගන්වා විවෘත කරන
මධ්‍යස්ථානයකි. අද එය සැදැහැවතුන් රාශියකගේ සිත් සතන් සොරා ගන්නා ඉතා අපූරු යැදුම්
වත් ලෙසකින් එය අපූරු කලා නිර්මාණයන්ගෙන් පිරි දේව ආදරය අත්දැකිය හැකි ආගමික
මධ්‍යස්ථානයකි.



## ඇයි...?

පිපුනු නෙක මල් විල මැද්දේ
විසිරුන පැතුම් පොදි ගොන්නේ
එක්කර තනන්නට වන්නේ
සොයා යා යුතු වෙයි මේ ගමනේ...
දිවිය සොයනා..... සතුට සොයනා...
ගමන් ගන්නා ජීවිතේ...
අරුත නොදැනා...
ඔහේ යන්නා...

**ජේ. කේ. ඉල්මිණි දයාත්මා**
යකඩපත

## යළිත් එනතුරු ළමා දිනයක්

සැමරුවෙමු ළමා දිනය මහත් හරසරින්
මල්වැනිය දූ පුතුන් පිවිතුරුය සුකුමාලය
රැක ගත යුතුය ඔවුන් පණ නළ ලෙසින්
ලියති පිටු ගණන් කියති හර බර දෙසුම්
කරති සෝෂා සති ගණන්.....
වැසිලා දෙනෙත් යළිත් ගිලිහෙන මතකය සමඟින්
යට කරගෙන යති නැතිව වගක්
පරවෙලා, මල් කැකුළු මඟතොට.....
හඬා වැටෙති, දහසක් සිත් - නැතිව පාසලක්
අකුරු කරන්නට.....
කරති ගැරහුම් පන්නා නිවහනින්
සමත් නොවුනු ශිෂ්‍යත්වය....
බැරි බර උහුලති වහලුන් ලෙස
නොදන්නවුන් හය හතර උසස් තැන්වල.....
පෙන්වන මඟ සුරංගනා ලොවක් මවන
දකින මත්කුඩු මත්විත සමග වැටෙති රහසින්
තැලෙන මල්කැකුළු යළි නොපිපෙනා ලෙස...
තබා ඇත 'මතට තිත' දනිති මුළු ලොවම
හඬා වැටෙති ලක් මැණියන් ඉකි ගසා
රජ වන මුසාව සමග බොඳවෙන අනාගතය

**ඉන්ද්‍රාණි ප්‍රනාන්දු**
දියලගොඩ

## විපරිතලෝ...

වෙළෙඳ උන්මාදයෙන්
පෙලෙන උන්මන්තකයෝ
රිංගලා තිඹිරි ගෙට
බිළිඳුන් විකුණන් කන්නෝ

කාසියට ලොල් වෙලා
මව් සෙනෙහෙ ගල් වෙලා
මුදු ගුණ දිය වෙලා
නරුමයින් බිහිවෙලා

ලොවම විපරිත වෙලා
දියත යයි වැනසිලා
මව් පියන් ලෝ තුළින්
යාවිදෝ වඳවෙලා

බාලයින් ඔබ වෙතට
එවනුයේ කෙලෙසදෝ
මයේ කිතු සමිඳුනේ......!

**ෆ්‍රැන්සිස්කා ගුණතිලක**
වත්තේගම



## ජම්ම දොසින් නිදොස් මවුනි!

තරිඳු මඬල මතෙහි සුමුදු දෙපිය රැඳවිනී
ළහිරු සුසුදු කිරණ ගතෙහි වතසෙ බැබළිනී
ඔටුන්නකින් දොළොස් තරුවෙ සිරස සැරසිනී
හිරුට සඳුට වැඩිම දිදුල පතළ මහිමෙනී

ජම්ම පවෙහි දොසින් මුතුව ඔබ පිළිසිඳුනී
නමෝ ප්‍රසාද පූර්ණවන්තිනීයැ පසැසිනී
ජේසු දිනිඳු පෙරටු උදය තාරකාවෙනි
මාංසගතව ජනිත වාක් ප්‍රසාද ගැබයෙනී

දවිඳු ගොතිර මහිම වොරැදි මාලිගාවෙනී
සගෙහි සැපට විවට කතකමය දුවාරෙනී
ගතෙහි සිතෙහි මනසෙ ලෙඩට ඔසු නිදානෙනී
දෙවන් කිරුළු පැලැන්ද වුණු මහේසිකාවෙනී

ඒව මවට බැඳුණු සපුගෙ හැකිලි බිඳිමිනී
උපත ලැබුව ජේසු පුතුගෙ පෙමැති දිනිතිනී
දැනුදු මරණ වෙලාවෙහිදු පතළ කුලුණෙනී
සරණ වෙන්න දුබල අපට සදා සහ නෙනී

**වෙන්නප්පුවේ පයස් ප්‍රනාන්දු**

## චොගම් එකෙන් චූං වෙලා

චොගම් පෙත්ත කැරකෙනවා
කොළොම් තොටම බැබලෙනවා
චොගම් එකේ හැඩ බල බල
අපි නැලවෙනවා

ලෝකෙට ලෝක්කන් එනවා
ලංකාවම බැබලෙනවා
හිත්වල ඇති දුක් කරදර
අමතක වෙනවා

සුදුම සුදුයි අර ලොක්කා
කළුම කළුයි මේ ලොක්කා
ඒ වුනාට ඒ ඔක්කොම
හරි පිං පාටයි

චොගම් ජොලිය නිම වෙනවා
ලුනු ගෙඩිය උඩ යනවා
හැටට හැටේ පොල් නැග්ගත්
අපට දැනුනෙ නෑ

කන්ට බොන්ට හිඟ වෙන කොට
චොගම් ලොක්කො නෑ පෙනෙන්ට
රූං පෙත්ත ගැලවී
දෙවියන් සිහිවෙනවා

**වැලිවිට එම්. ජෝ. පාරිස්**

## අවවාද

අරුත් සපුරන විරිත එළිවැට රිද්මයකි සිත සනහලන්නට
නැතිව ගෙතුවද ගීතවත් පද පෙළක් සමත වෙයි හඬක් දෙන්නට
උපන් ගෙයි මිට මොළව ගත් හැකියා දිගැර දෙමු ලොව නගන්නට
සඳැස් නිසඳැස් වාද කුමකට අවැසි වෙයි මෙහෙවර අදත් හෙට

එකෙකු පරයා නැගෙන්නට හිණි මගේ දඟලයි තවත් එකෙකුත්
සමාජයෙ විස නසන්නට ඕනෑම වෙයි නෙක වදන් හරවත්
ගොතා පදවැල් කියන්නට ඇති දේ අවදි කර දනන් හදවත්
සාහිතේ හෙළ කෙහෙළි බැන්දේ මේ දෙකෙන්මයි වෙමින් ඔපවත්

**ග්‍රේස් පොන්වීර**
නාගොඩ

## හැරී බලන්

සුවඳ දැනී - පියේ ඔබේ
ළං වූයෙමි ගතට ඔහේ
කිසි අහිතක් නොසිතා වගේ
හසරැල් මුව පුරා ඔබේ

ලෙන්ගතුකම දෝරේ ගලා
උණුසුම හරි - හරියට පා
මට ආසයි ඔබම වගේ
ඉන්නට ඒ අසුන් අරා

දෘශ්‍යමාන ජේසුනි ඔබ
සියුමැලි හිස පිරිමැදි විට
ඇත්තම, ඇත්තයි කියන්නෙ
සිදුවුණු පෙලහරක මහත

නටා, ගයා නොමැති මෙමට
එය කළ හැකි වුණා ජයට
තව දවසක් එන්න පියේ
අපි හමුවෙමු මෙලෙස සෙනේ

**රේණුකා නාවුරුන්නගේ**
නාගොඩ



## ආදර මරිමව්නි

අරුණ උදයේ ගගන සිප එන
රිදී හිරුගේ දිලෙන රැස් තුළ
දුටිමි අම්මේ ඔබේ රුව ගුණ
හදේ දැල්වුණ නිමල සෙනෙහස....

ලෙලෙන දිලෙනා තාරකා මල්
අතරෙ නැග එන කසුන් සඳ වත
මවයි අම්මේ ම'නෙතු අද්දර
ඔබේ නිමල වූ දයා පිරි රුව....

**රෝසි සුදම්දි විරසිංහ**
මාවිල

## සමිඳුන් පසසමු

ජන්ම පාපයට දඬුවම් ලෙස මරණය හිමි කරලා
පත් කෙරුවා දිවි ගෙවුමට දුක තුළ දහදිය හෙළලා
එනමුත් නොමැතිය සමිඳුන් සදහට අප අත හැරලා
පාපෙට වන්දිය ගෙව්වා තම පුතු මෙලොවට එවලා

කුරුසියකට ඇණ ගැසුවා නොකළ නමුත් කිසි වරදක්
මරණෙ මරා ජය ගත්තා ගතවු පසු තුන් දවසක්
ජේසු පුතුගෙ මස් සහ ලෙය කෙරුව දිව්‍ය අවුසදයක්
ලොවේ කොහේ හෝ යාගය සිදුවෙයි නෑරම මොහොතක්

**ඇන්ටනි රුද්‍රිගු**
යක්කඩුව


## සොහොනක් කවියක්!

දෙව් දරුකම පෙනෙන සොහොවුරු දම බැඳෙන
මනසින් කයින් වදනින් වරදක් නොදෙන
සාමය සමානත්වය සමගිය රඳන
'මිනිසත් පවුල' නම් මේ විස්මිත සොහොන

දිවි තරගයේ දුවලා හති වැටෙන තුරු
නැවතී ඉසුඹු ලන නිදහස් සුවය පිරූ
නොමැරෙනවුන් සේ සිතුවත් මැරෙන තුරු
මරණයේ මිහිර දනවන තැන සොහොන ගරු

ජීවිතෙ දිග පළල තුලනය වන යෙහෙන
මානුස දුබලකම් මතු නොකරන වහන
කළ හොඳ සදා නොමැරෙන සැමරුම් ගහණ
අබිදම් අරුත් රස දෙන කවියකි සොහොන

**කිවිසුරු පුෂ්පානන්ද පීරිස්**
පල්ලන්සේන



## නිකුලා මුනිඳුනී!

බෝපිටි ගමේ මැද සිංහාසනය දරා
රදගුරු තේජසින් ඉන්නේ අපව බලා
දෙව් මැඳුරේ ආලෝකය දසත පුරා
ජන ගඟ ගලන්නේ මුනිඳුගෙ පිහිට ලබා

දරුවන් නැතිව අම්මාලා ඔබ අයදින්නේ
වරම් ලැබේ සැමදා අප සිත් සැනසෙන්නේ
බලය ඔබ තුළයි මුනිඳුනි සැම එන්නේ
මේ රන් තරුව බෝපිටියේ බැබලෙන්නේ

එදත් අදත් සිත තුළ ඇති භක්ති යෙන
නැර ආමි ඔබෙ පිය සෙනහස ලබා ගෙන
අද දින ඔබට කවියෙන් මම පුද මින්න
වැඳ වැටි පුදමි ඔබෙ පාමුල සැම දාම

**ටයිටස් සපරමාදු**
බෝපිටිය

## තක්සේරුව

නොතබා වේලක්වත් කුසගින්නේ අපව
ඉඳහිටක පැණි රස ද අපි ආසම කරන
රැගෙනැ'විත් දී......
ඉමහත් දරු සෙනෙහසින්
දහඩිය හෙළා අප වෙනුවෙන් ම.....
හිසට වහලක් පමණක් නොව
පියකරු ගේ පොඩ්ඩක් ද තනාගෙන
පාසලට පොත් ටික ද
ගමනට බිමනට ඇඳුම් ද අරන් දී
රහ මෙරට, සූදුවට, දුම්වැටියට නොවෙයි
වත්ත පිටියේ ගහකොළට මිතුරු වී
විහිලු කර කර අපේ අම්මා එක්ක
බත්, මාලු ඒදා ලිප තැබූ
කාටවත් කරදරයක් නොකර
සතුටින් ම ජීවිතය ගතකළ
අපේ ආදරණීය තාත්තා.....
හදිසියේම දෙනෙත් පියාගත්තා....

බොහෝ දෙන ගුණ ගී ගය ගයා
තාත්තා ගේ නිසල දේහයට වැන්දා
ඉඳහිටක 'කසුකුසුව' ඇසුනා....
"මෙච්චර කරලත් මේ මනුස්සයට
මැරෙන්න ඉස්සරින්
බිමට ටයිල්ස් ටිකක්වත් දා ගන්න බැරිඋනානේ...."
අත තියාගෙන කම්මුලේ සුසුම් හෙලුවා.....

අලිය පිටේ තියාගෙන මාව
සිමෙන්ති පොළවේ තාත්තා දණගාපු හැටි
මහ හඬින් හිනැහුන තාත්තා ගේ සිනා හඬ
මගෙ කඳුළු වියළවා දැම්මා......!

**ගරු මේරි මර්සි නෙත්සිංහ පැවිදි සොයුරිය**
දේවසංරක්ෂණයේ දියණියෝ
පළඟතුරේ



## යුගදිවි සැමරුම්

තිස් හතර වසරකි අපගේ යුග දිවිය
එදත් අදත් ඇත එකමුතු සමගිය
සිනහ කඳුළු සමග ගෙවුණු ජීවිතය
මරි මව්නි ඔබයි අපට තිබූ සවිය

දුක සැප බෙදා ගත්තා එක්ව සතුටින්
නැණ ගුණ දහමින් සිටිනව දරුවන්
අප එක් කළේ අපගේ දෙව් පියාණන්
තුති ගී ගයමි හද බැතිව සිතින්

**ආතර් හිලරි ප්‍රනාන්දු**
මාරවිල

## නොදකින ඇත්ත

එකල පටන් ඇත සිරිත
බඹරුන් එයි පසුපස......
වෙනස්වන ලොව තුළ
පොහොට්ටු යයි බඹරු පසුපස
ඇයිද මේ වග
නොදැනෙන්නේ මිනිසුන්ට
මල් නොව පොහොට්ටුය
මිලීන වන්නට පොරකන වග

**සුවනි සමරතුංග**
සීදුව

## දයාබර සොයුරාණෙනී

කාලය කෙමෙන් කෙමෙන් වියැකී යයි
දැනෙයි අද ඔබ අප අතර නැති බව
ඔබ දයාබර සොයුරෙක්ම විය සැමදා
ඔබ රුව සැරසු ගුණදම් අපමනය

අවිහිංසක සිනහවකි රැඳුනේ ඔබ මුවග
අපගේ අවැසිතාවයන්ට නිරතුරුවම අවදි විය
කිසිදින පසුබා ගියේ නැත උදව් පිහිට නොම වී
ඔබෙන් දුටුවේ සොයුරකුගෙ දයාබරත්වයයි නිබඳවම

සංවේ දී ආදරබර හදකට උරුම කියු ඔබට
මරණය ඇයි අකාරුණික වූයේ මෙලෙසින්
සඟවන්නට ආදරබව ඔබ රුව අප අතරින්
කෙලෙස සිතන්නද ඔබ අප අතර නැති වග

ඔබ අප හා ගෙවූ ඒ සුන්දර මතකයන්
සැමදා රැඳේවි වේදනාවේ සුසුමක්ම වී
දයාබර සොයුර කොන්රඩ්.....
යදින්නෙමි දෙවිඳුන් ලබනට ස්වර්ගීය සම්පත......

**ගරු ශිරානි පොන්සේකා පැවිදි සොයුරිය**

# රැකවල් දූත ආරක්ෂාව පැතුවාට සසුන් පිය තුති



ආර්ජන්ටිනියානු ජාතික 16 හැවිරිදි නිකොලාස් මරාස්කෝ දරුණු මොලේ ආබාධයකින් පෙළෙයි; ඔහුට කථා කළ නොහැක; ඇවිදීම අසීරුය. එහෙත් ප්‍රැන්සිස් සසුන් පියා කෙරෙහි ඔහුට ඇත්තේ ඉමහත් සෙනෙහසකි. එම නිසාවෙන්, තමන්ට අකුරු කරණය බැරි වූවත්, සිය දෙමාපියන්ගේ මාර්ගයෙන් ලිපියක් සසුන් පියා වෙත යොමු කොට ඇත. ඊට පිළිතුරක් ද ඔහු වෙත ලැබී තිබේ.

ඔහුගේ ලිපියේ දක්වා ඇත්තේ, තමාගේ රැකවල් දූතයා විසින් සසුන් පියා ආරක්ෂා කරනා ලෙසට ඔහු නිරන්තරයෙන් ඉල්ලා සිටිනා බවය. නිකොලාස්ගේ ලිපියේ මෙලෙසින් ද දක්වා ඇත. "මට ලියන්නට බැරි නිසා දෙමාපියන් මාර්ගයෙන් මෙම සටහන ඔබ වෙත ඉදිරිපත් කරමි. එයුසේබියෝ නම් මගේ රැකවල් දූතයාගෙන් මා ඉල්ලා සිටින්නේ, ඔබ තුමාට නිරන්තරයෙන් ආරක්ෂාව සළසන ලෙසටයි. මම කවදා හෝ ඔබේ ළඟට පැමිණ ඔබේ ආශිර්වාදයත්, ස්පර්ශයත් අත්දැකීමට බලාපොරොත්තුවෙන් සිටිමි."

සසුන් පියා විසින් නිකොලාස් වෙත යවන ලද පිළිතුරු ලිපියේ මෙලෙස ද සඳහන් කොට ඇත. "ඔබ කරන යැදුම් වලට මම ඔබට තුති පුදනවා. ඔබේ යැදුම් නිසා මගේ සේවාවන් යහපත් අයුරින් කරගෙන යාමට මට හැකි වෙනවා. ඔබව මට බෙහෙවින්මැ වටිනවා; මා ද ඔහු වෙනුවෙන් දෙවිඳුන් යදිනවා. ජේසුස් වහන්සේ ඔබ නිරන්තරයෙන් ආශිර්වාද කරන සේක්වා; තවද ජේසු අම්මා ඔබව රැකබලාගෙන ඇත." සසුන් පියාගේ වදන් හා ප්‍රකාශිත ආදරය දරුවාට පමණක් නොව දෙමාපියන්ට ද දිරිය ලබාදෙනු ලබන බැව් නිකොලාස්ගේ මවද අවධාරණයෙන් පැවැසුවාය. කලින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා සිටි නිකොලාස්, නොවැම්බර් මස 09 වෙනිදා අභිවෘද්ධි ආලේපය ලබා ගත්තේය.

# නයිජීරියානු කිතුනු වනිතාවන් වහලියන් කර ගනිති



නයිජීරියාවේ "බොකෝ හරාම්" නමැති ත්‍රස්ත කංඩායම විසින් කිතුනු කාන්තාවන් පැහැරගෙන ගොස්, ඔවුන් දූෂණයට පාත්‍ර කරමින් වහලියන් සේ අලෙවි කරනා බැව්, පසුගිය සතියේ, රොයිටර් පුවත් ඒජන්සිය වාර්තා කළේය.

එපමණක් ද නොව එම කිතුනු කාන්තාවන් බලෙන් ඉස්ලාම් දහමට හරවා ගැනීම ද සිදු කැරෙනා බැව් වාර්තා කරත. හමුදා කණ්ඩායම් විසින් එම ත්‍රස්ත කංඩායමේ සාමාජිකයන් ලුහු බඳිනා හෙයින්, ඔවුන් සැඟවී සිටි කාන්තාර පෙදෙස් වලින් ඉවත් වී මන්දාරා කඳුකරයේ සැඟවී කිතුනු කාන්තාවන් පැහැර ගැන්ම දිගින් දිගට කරගෙන යනු ලබයි. රොයිටර් පුවත් ඒජන්සිය ප්‍රකාර කිතුනු දැරියන් සිය ගණනක් පැහැර ගනු ලැබ ඇත.

එලෙස පැහැර ගනු ලැබූ දේව අනුහසින් ජීවිතය බේරා ගනු ලැබ ඇති තරුණියන් මෙලෙස පවසයි. "ඔවුන්ගේ පාපිෂ්ට ක්‍රියාවන්ට අවනත නොවුනොහොත් ඔවුන් සිත් පිත් රහිතව පහරදෙනු ඇත. කරුණාව ඉල්ලා සිටියොත් කට පියා ගන්නා ලෙස අණ කරමින් පහර දෙති. මා මෙන් තවත් කිතුනු තරුණියන් ද ඉස්ලාම් දහම වැළඳ ගැන්ම ප්‍රතික්ෂේප කළහොත් මහත් පීඩාවන්ට පාත්‍ර වීමට අපට සිදුවනු ඇත. විශේෂයෙන්, මා ඉස්ලාම් දහම වැළඳ ගැන්මැ ප්‍රතික්ෂේප කළ හෙයින්, මා මරා දමනා බවට දින වකවානු දී ඇති පරිසරයක මට උන්ගෙන් ගැළවී යාමට හැකියාව ලැබිණි." මෙම සාක්ෂිය ද ජාත්‍යන්තර මාධ්‍ය විසින් තහවුරු කර තිබිණි.

# හොංකොං හී චීන කිතුනු සභා පීඩනය හෙළා දකී

කාදිනල් ෂේන් ෂෙ කියුං වර්ෂ 2002 සිට 2009 ක්වා, හොංකොං හි රදගුරු වශයෙන් සේවය කළ සේක. එම කාල පරාසය තුළදී මෙන්මැ ඊට පසුව ද චීන රජය විසින් එහි කිතුනු සභාව කෙරෙහි නිරන්තරයෙන් කරනු ලබන පීඩන කෙරෙහි ලොවැ හමුවේ නොබියව ප්‍රකාශ කරන සේක.

පසුගිය සතියේ වතිකානයේ පුවත් සාකච්ඡාවකට මුහුණ දෙමින් එතුමා සිය අදහස් මෙලෙසින් ප්‍රකාශ කළ සේක. "චීන ආඥාදායක ප්‍රතිපත්ති මත ක්‍රියා කරමින්, සුළු ආර්ථික ප්‍රගතියකට මුවා වී, දේශපාලික හා ආගමික නිදහස වළලා දැමීමේ ක්‍රියාදාමයක් දැඩිව කරගෙන යනු ලබයි. සභාව හා රදගුරු හිමිවරුන් හා පූජකවරුන් දැඩි කනස්සල්ලට පාත්‍ර කරනු ලබනවා.

ඇතැම් පූජකවරු වසර 10 කට වැඩි කාලයක් සිරගත වී සිටි අවස්ථා ද වේ. මේ අමානුෂික කිතුනු පීඩාවන් පිළිබඳ කරුණු කාරණා හෙළි දැක්වීම කළ යුතු වෙනවා."

හොංකොං හී විශේෂයෙන් කතෝලික සභා පීඩනය. ලොවට ප්‍රකාශ කිරීම නවතාලීම සඳහා යම් යම් උපක්‍රමයන් "ඊනියා චීන දේශාභිමානී කතෝලික සංවිධානය" විසින් ක්‍රියාත්මක කැරෙනා බැව් ද එතුමා විසින් අවධාරණය කරනු ලැබීය. විවිධ රටවලින් හොංකොං වෙත පැමිණෙන කතෝලික පූජකවරුන් හා රදගුරු හිමිවරුන් හා එම සංවිධානයේ පැවිදි වරුන් මිත්‍රශීලි බැව් හුවා දක්වමින් ලොවට වැරදි පණිවුඩයක් ගෙනදීමට ද උත්සහයක් දරණා බැව් ද එතුමා විසින් අවධාරණය කරනු ලැබීය. එබැවින් කාදිනල් ෂෙන් ෂෙ - කියු විසින් දැඩි ලෙස ඉල්ලා සිටියේ, හොංකොං කරා පැමිණෙන කතෝලික පැවිදි වරුන් සසුන් පිය නායකත්වය නොපිළිගන්නා එම චීන සංවිධානයේ රැවැටිලි ක්‍රියාකාරීත්වයන්ට හසු නොවනා ලෙසටයි.

# ඉස්ලාම් දහම කෙළෙසුවායි දෙඅත් කැපූ ගුරුවරයා නිදහස්

ටී. ජේ. ජෝශප් නම් කිතුනු ආචාර්යවරයා කේරලයේ මහත්මා ගාන්ධි විශ්ව විද්‍යාලයට අනුබද්ධිත නිව්මන් විදුහලේ ආචාර්ය වරයෙකු වශයෙන් සේවය කරමින් සිටියේය. සිසුන් හා සාකච්ඡාවකදී මොහොමද් තුමාට අවමාන වන පරිද්දෙන් අදහස් ප්‍රකාශ කරනු ලැබුවේය යයි යම් පාර්ශවයක් විසින් අර්ථ විරහිත චෝදනාවක් කරනු ලැබීය. තමා මොහොමද් තුමාට අගෞරව වන පරිද්දෙන් හිතා මතා කිසිවක් නොකිව්වත්, යම් වදනකින් එවැන්නක් සිදුවූයේ නම්, සමාව ඉල්ලා සිටිනා බැව් ඔහු විසින් ප්‍රකාශ කොට තිබිණි. එහෙත් පිරිසක් ඔහු වෙත කඩා වැද ඔහුගේ දකුණු අත මුළුමණින්මැ කපා වෙන් කොට දමා අනික් අතට ද බරපතල හානි සිදු කළෝය. මෙම සිද්ධිය වූයේ වර්ෂ 2010 දීය.

මෙම දරුණු තුවාල කිරීමෙන් ඔහු කාලයක් රෝහල් ගතව සිටිය ද, පසුව සුවය ලබා ගත්තේය. එහෙත් ඒ වන විට ඔහු රැකියාවෙන් පහ කොට තිබිණි. එමෙන්මැ ලැබිය යුතු විශ්‍රාමික වැටුප හා අනෙකුත් දීමනා ද අහිමි කර තිබිණි. මෙම අමානුෂික සියළු දඬුවම් කේරලයේ පහල උසාවිය විසින් පනවා තිබුණේ, එක් සාක්ෂියක් පදනම් කොට ගෙනය. ඔහු විසින් ඉන්දීය කිතුනුවන්ගේ ජගත් කවුන්සලයේ ආධාර ඇතිව මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබීය. පසුගිය සතියේ එම අභියාචනය ප්‍රකාර, මහාධිකරණය විසින් තීන්දුව දී තිබුණේ, ටී. ජේ. ජෝශප් කිතුනු ගුරුවරයා සියළු චෝදනා වලින් නිදහස් කරමිනි. මේ අනුව, ඔහුගේ රැකියාව ලබා ගැන්ම ද තහවුරු වී තිබේ. තවද, එම තීන්දුව අනුව පොලීසියේ පක්ෂපාති ක්‍රියාකාරිත්වය ද විවේචනයට ලක්වී ඇත. "ජෝශප් ගුරුභවතාගේ අදාළ සිද්ධිය කේරල ඉතිහාසයේ දැඩි අවාසනාවන්ත සිද්ධියක් බවට පත්ව ඇතත්, ඉන්දීය අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ මහත් ගෞරවයක් අත්කර දෙනු ලබන ඇත." මෙලෙස පැවැසුවේ, ඉන්දීය කිතුනුවන්ගේ ජගත් කවුන්සලයේ සභාපති සජාන් ජෝර්ජ් විසිනි.

# ස්පාඤ්ඤයේ දෙව් මැඳුරු තුළ බෝම්බ පිපිරුමක්

ස්පාඤ්ඤයේ උතුරු කරයේ සති කීපයකට ඉහත දී පරසෝෂා හි "ස්ථම්භයේ අප ස්වාමිදූගේ ආසන දෙව් මැඳුරේ" බෝම්බ පිපිරීමක් සිදු විය. දෙව් මැඳුරේ ගායනා කංඩායම් පෙදෙසේ ගෑස් සිලිංඩරයක අටවා තුබූ බෝම්බයක් පුපුරුවා හරිනු ලැබ ඇත.

රැස්ව සිටි බැතිමතුන් වෙත ජීවිත හානි සිදුවි නැතත්, සංගීත බඩු බාහිරාදිය හානියට ලක් වී තිබේ. මෙම ප්‍රහාරය ඉස්ලාමීය ත්‍රස්ත කණ්ඩායමක් විසින් බාර ගෙන ඇත. ඒ අනුව කළ පරීක්ෂණයන් ඔස්සේ පසු ගිය සතියේ විලියානු තරුණයන් දෙදෙනෙකු සිර බාරයට ගනු ලැබ උසාවිය වෙත ඉදිරිපත් කරනු ලැබීය. තවද මේ වසරේ පෙබරවාරි මාසයේදී මැඩ්රිඩ් හී ආසන දෙව් මැඳුරටත්, එහි අවට ප්‍රදේශයේ පිහිටි කන්‍යා රාමයටත් බෝම්බ ප්‍රහාර එල්ල කිරීම ද මෙම ත්‍රස්ත කණ්ඩායම විසින් කරැති බැව් ද හෙළි වී ඇත. මෙම ත්‍රස්තවාදි තරුණයන් පරීක්ෂණයට භාජනයට කිරීමේදී, ඔවුන් සතුව ඇති රහස් ලිපි ලේඛණ ද සොයාගෙන ඇත. ඒවායින් හෙළි දක්වනු ලැබ ඇත්තේ. තව තවත් දෙව් මැඳුරු වලට පහරදීමට සැළැසුම් කරැති බවය. ස්පාඤ්ඤය විසින් දකුණු ඇමෙරිකා දේශයන් යටත් විජිතයන් ලෙස සළකනු ලබන පරිසරයක් තුළ, ඒ සඳහා කතෝලික සභාවේ සහාය ස්පාඤ්ඤයට දෙනු ලැබේය යන චෝදනාවක් මත මෙම පහරදීම් සිදුකැරෙනා බැව් ද ප්‍රකාශිතය.

# බ්‍රිතාන්‍ය ඇමැතිනිය කිතුනු පීඩාවන් හෙළා දකී

බ්‍රිතාන්‍ය රාජධානියේ ආගමික හා ජන කොටස් පිළිබඳ රාජ්‍ය ඇමැතිනී මෙන්මැ පොදු රාජ්‍ය මංඩලීය රාජ්‍ය ඇමැතිනිය ද වන සයිඩා වෝර්සී එරටේ ජෝර්ජ්ටවුන් විශ්ව විද්‍යාලයේ දේශනයක් පවත්වමින් ලෝකයේ සිදුවන කිතුනු පීඩාවන් දැඩි ලෙස හෙළා දැක්කාය.

ඇමැතිනිය විසින් මෙලෙසින් ද ප්‍රකාශ කරනු ලැබීය. "විශේෂයෙන් මැදපෙරදිග සිදුවන කිතුනු පීඩනයන් හෙළා දකිමින් අතිශය වේදනාවට ද පත්ව සිටිම. එම දේශයන් හී ජීවත්වන කතෝලිකයෝ ද, ප්‍රෝතෙස්තන්ත හා ඕතොඩොක්ස් කිතුනුවෝ ද මහත් පීඩාවන්ට ගොදුරු වී සිටිති.

ඔවුන්ගේ කිතුනු ඇදැහිල්ලේ උපත වන එම ප්‍රදේශයන් හී පවා නොතිත් පීඩාවන්ට භාජනය වෙමින් සිටිත්. මේ නිසාවෙන් එම රටවලැ වෙසෙන කිතුනුවෝ දිගින් දිගට තමන්ගේ නිජබිම අතහැර යාමේ ප්‍රවනතාවයක් ද පවතී. එම නිසාවෙන් කිතුනු දහම උපන් සථානයන් හී පවා දහම නැතිව යාම සිදුවීම ද මහත් අවකාශයක් පවතී. බලහත්කාර ආගම වෙනස් කිරීම් ද, ශාරීරික හා මානසික පීඩාව ද, කිතුනු ස්ත්‍රී දූෂණයන් ද හා මිනිස් ඝාතනයන් ද විසින් මෙම කිතුනු පීඩාවන් උග්‍ර කොට ඇත."

තවද ඇ විසින් ආගමික නිදහස පිළිබඳව මෙලෙසින් සිය ස්ථාවරය දක්වනු ලැබීය; "ආගමක් ඇදැහීමේ නිදහස පෞද්ගලික වේ. තමන්ගේ ඇදැහිල්ල එකිනෙකාගේ තෝරා ගැනීම වේ: තම ආගම ප්‍රකාශ කිරීම හෝ නොකිරීම එකිනෙකාගේ කැමැත්ත වේ; ආගම බෙදා හදා ගැනීමේ නිදහස එකිනෙකාගේ කැමැත්ත වේ; ආගම වෙනස් කිරීම ද පුද්ගලයාගේ කැමැත්ත වේ. ආගමක් නොඇදහීම ද එකිනෙකාගේ නිදහස් කැමැත්ත වේ."

# වතිකාන ගිණුම් පරිපාලන විගණනය අර්නස්ට් යං විසින්




වතිකාන පරිපාලනය විසින් සිය ආර්ථික ක්‍රියාකාරකම් හා පරිපාලන කාර්යයන් විගණනය කරනු ලැබීම සඳහා, ලෝ ප්‍රකට ගිණුම් පරිපාලන සමාගමක් වන අර්න්ස්ට් යං සමාගම හා ගිවිසුමක් අත්සන් කොට ඇත.

මෙම ලෝ ප්‍රකට විගණන සමාගමේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත්තේ එංගලන්තයේ ලංඩන් නගරයේය. වතිකානයේ ආර්ථික හා පරිපාලනමය ක්‍රියා මාර්ගයන් සඳහා වෙනස්කම් කැරුම භාර දී ඇති නව සසුන් පිය කොමිෂන් සභාවේ කටයුතු විගණනය කිරීම මෙම ආයතනයේ කාර්ය භාරය වනු ඇත. අර්නස්ට් සහ යං සමාගම විසින් කැරෙන යෝජනා අනුව නව සසුන් පිය කොමිෂන් සභාව විසින් අවශ්‍ය වෙනස්කම් කැරෙනු ඇතැයි ද කතෝලික පුවත් විසින් වාර්තා කැරේ.

# සසුන් පියා විරූපි මිනිසා සිප වැළඳ ගනී !



ශාන්ත පීතර බැසිලිකා පරිශ්‍රයේදී, තමා වෙත ආ සිරුර පුරා ඉස්ම ගලන තුවාල වලින් යුත් ඉතාලි ජාතික 53 හැවිරිදි විනීසියෝ රිවා වැළඳ ගනිමින් සසුන් පියා තුවාල මුහුණ දිගින් දිගට සිපගත්තේය. "එකෙණෙහි මගේ මුළු සර්වාංග යම ප්‍රීති ප්‍රමෝදයකින් සහ සැහැල්ලුවකින් පිරී ඉතිරී ගියා.

යමක් කියන්නට මගේ හදවත පොර බැදුවා. කිසිදු වදනක් මගේ මුවින් පිට වූයේ නැහැ. එතුමා මා වැළඳ ගත්ත විනාඩියක් පමණ කාලයක් තුළ සිදුවූවක්, මට දැන් දැනෙන්නේ, එම සෙනෙහස අනන්ත බවය." ඔහුගේ එම වදන්, පසුගිය සතියේ ලෝක මාධ්‍යයන් හී හැඟීම්බර සිද්ධියක් ලෙසින් පැතිර ගියේය.

මුළු ශරීරය පුරා පැතිර පවත්නා තුවාල ජානමය රෝගයක් වන අතර, රෝගය ඔහු අත්දකින්නට පටන්ගෙන ඇත්තේ වයස අවුරුදු 15 දී පමණදීය. ඔහුගේ මවද, බාල සහෝදරිය ද මෙම රෝගයෙන් පෙළෙති. පසුගිය කාලයේදී ඔහු ලූර්දු වන්දනාවේ ගිය විටදී ඔහුගේ මිත්‍රයකු විසින් පවසා ඇත්තේ, ප්‍රැන්සිස් සසුනිසුරාණන් ද බැහැදැකිය යුතු බවයි. ඒ අනුව තමා සසුන් පියාගේ සෙනෙහස අත්දැකීමට රෝමය වෙත පැමිණියේ. "සුධොතුම් පියා අසළට ගිය විට, කිසිදු පැකිලීමකින් තොරව එතුමා මා සිප වැළඳ ගත්තා. මගේ තුවාල සහිත මුහුණ ස්පර්ශ කරමින් පිතෘක සෙනහසේ සුවය මම දානය කළා. මෙතෙක් මා මැරි මැරි ජීවත් වූවත්, ඉදිරියේ එම සුව සහන ස්පර්ශයෙන් කල් යැවිය හැකි යයි මා අදහ ගන්නවා." ඔහු එලෙසින් ද අවධාරණය කළේය.

බැසිල් ෆොන්සේකා විසිනි

විශේෂාංග

# දිව්‍ය සත්ප්‍රසාදයේ කාන්තාව වන මරියෝත්තමාවෝ

3 පිටුවෙන්

## මාතාව

ඉතිහාසය තුළ මරියෝත්තමාවන්ගේ හැම මැදිහත්වීමක්ම මාතෘකය. එතුමියගේ පෞරුෂත්වයේ හරය "මව" යන වචනය තුළ නිරූපණය වී ඇත. නිර්මල පිළිසිඳ ගැනීම, සදාකාලික කන්‍යාභාවය, පරලොවට වැඩීම, රාජකීයත්වය, ගැලවීමේ සහකාරිත්වය, සියලුම වරප්‍රසාදයේ මැදිහත්කාරිය වීම යන එතුමිය ලද හැම වරප්‍රසාදයක්ම ගලා එන්නේ අප ස්වාමිදුවගේ දිව්‍යමය මාතෘත්වයෙනි.

සදාකාලික වචනය නිදහසේ පිළිසිඳ ගැනීමේ සද්ගුණය හේතුවෙන් මරියෝත්තමාවන් දෙවියන් වහන්සේගේ හා අපගේ මව වන්නීය. (ලූක් 2:38 බලන්න.) මංගලම් කීමේ අවස්ථාවේදී මරියෝත්තමාවන් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මව බවට පත්වන අතර ඒ හා සමගාමීව එතුමියගේ දේව පුත්‍රයා තුළ "නැවත උපදින" සියල්ලන්ගේ මව බවට ද පත් වන්නීය. (ජුවාම් 3/3 බලන්න). නාසරෙතය, එක මොහොතේ දී එක විටම, දේව පුත්‍රයාගේ මාංශගතවීම සිදුවන ජවනිකාව සාන්ත සභාවේ උපත සිදුවෙන අවස්ථාව බවට පත්වේ. එහිදී මරියෝත්තමාවෝ සකල ක්‍රිස්තු දේහයේ මව බවට පත් වන්නීය.

හැම යහපත් මවක් මෙන් මරියෝත්තමාවන් ද හැම විටම දරුවන් අතර සමඟිය ඇති කරනු සඳහා සිය දරුවන්ගේ එකමුතුකම ගැන සැළකිලිමත් වේ. ක්‍රිස්තුස් වහන්සේ සමග සමඟි කරනු සඳහා එතුමිය අප සොයා අප පසුපස එන්නීය. එම නිසා මරියෝත්තමාවන් වෙත ඇති සැබෑ භක්තිය ගැඹුරින්ම ක්‍රිස්තුවේදි වේ.

ලෝකයේ ගැලවීම සඳහා වන දෙවියන් වහන්සේගේ සැලැස්ම තුළ මරියෝත්තමාවන්ගේ භූමිකාව වන්නේ ක්‍රිස්තුස් වහන්සේව ලෝකයට ප්‍රදානය කිරීමයි. ස්ථිර වශයෙන්ම හැම පුද්ගලයකුටම සහ කිතුනු සංඝයට ජේසුස් වහන්සේ දානය කළ හැකි ඉතා ඵලදායි ක්‍රමය වන්නේ දිව්‍ය සත්ප්‍රසාදය තුළින් උන්වහන්සේ දානය කිරීමයි.

ගලීලයේ කානා නුවර දී ජේසුස් වහන්සේ සිය ප්‍රථම "සලකුණ" ඉදිරිපත් කළේ මරියෝත්තමාවන්ගේ පෙළඹවීම තුළයි. ඊට හේතුව වන්නේ තවමත් උන්වහන්සේගේ "පැය" පැමිණ නොතිබීමයි (ජුවාම් 2:4 බලන්න). එය මොනතරම් අලංකාර, ප්‍රීතිජනක ප්‍රාතිහාර්යයක් ද? වතුර බූලි ගණන් ඉස්තරම් මිදියුෂ වලට හැරුණි. ලෙඩ රෝගීන් සුව කිරීම, අශුද්ධ ආත්මයන් පලවා හැරීම, දිවැසිවැකි දෙසීම, මළාවූ අය නැවත නැගිටීම පවා, අප ස්වාමින් වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්යය අතර අපට හමුවේ. එහෙත් එතුමාගේ කුළුඳුල් ප්‍රාතිහාර්යය මූලිකවම සාදයක් පිළිබඳ, ආදර අන්දරයක උත්සවයන් පිළිබඳ වීම මොනතරම් සංවේදී සිදුවීමක් ද? එය කතෝලික නොවන්නේ ද? එය මාතෘක නොවේද?

මෙම "මරියානු" ප්‍රාතිහාර්යයේ ප්‍රතිඵල මරියෝත්තමාවන්ගේ සියළුම දරුවන්ගේ යහපත වෙනුවෙනි. අලුතින් විවාහ පත් වුණ යුවළ ලැජ්ජාවෙන් ගැලවුණි. මංගල්ලයේ ආවතේව කරන්නා වෘත්තිමය අපකීර්තියෙන් ගැලවුණි. විවාහ මංගල උළෙලට පැමිණි අමුත්තන් වඩා හොඳ සහ වැඩි පුර මිදි යුෂ වලින් තෘප්තිමත් වුණි. ක්‍රිස්තුන් වහන්සේ උන්වහන්සේගේ මහිමය විද්‍යමාන කරන අතර උන්වහන්සේගේ ශ්‍රාවකයෝ උන්වහන්සේ ගැන විශ්වාසය ගොඩනඟා ගනිති (ජුවාම් 2:11 බලන්න) ගලීලයේ කානා නුවර එකම ජය මඟුලකි. කන්‍යා මරියෝත්තමාවෝ තමනට රිසි ලෙස සියල්ල සලසයි. එතුමියගේ දරුවෝ ප්‍රීති ප්‍රමෝදයට පත් වෙති.

අන්තිම රාත්‍රි භෝජනය අවස්ථාවේ ජේසුස් වහන්සේ "මා සිහිකිරීම පිණිස මෙය සිදුකරන්න"යි පැවසූ සේක. කිසි පැකිලීමකින් තොරව උන්වහන්සේට කීකරු වන ලෙසට මරියෝත්තමාවෝ ආරාධනාවක් දෙනු ලබන්නීය: "උන්වහන්සේ කියන කවර දෙයක් වුව ඉටු කරන්න" (ජුවාම් 2:5). කානා නුවර විවාහ මංගල්ලය අවස්ථාවේ දී තමා පෙන්වූ මාතෘක ලැදියාවෙන්ම මරියෝත්තමාවන් අපට පවසනු ලබන් නේ: "නොසැලී සිටින්න, මාගේ පුතනුවන්ගේ වචන කෙරෙහි විශ්වාසය තබන්න. ජලය මිදි යුෂ කිරීමට උන්වහන්සේට හැකි වුණා නම්, පූප සහ මිදියුෂ, ශ්‍රී ශරීරයට හා ශ්‍රී රුධිරයට හරවන්නට උන්වහන්සේට හැකියාව ඇත" යන්නයි.

## දිව්‍ය සත්ප්‍රසාදයේ කාන්තාව

මරියෝත්තමාවන් සැමවිටම දිව්‍ය සත්ප්‍රසාදය කරා අප සැම යොමු කරවයි. ශුද්ධවූ අල්තාරය මත ප්‍රස්තුත වන ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය හා රුධිරය, ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් මරියෝත්තමාවන් තුළ ජනනය වුනු ශරීරය හා රුධිරයමයි (ලූක් 1:35 බලන්න).

සාන්ත ජෝසේ මරියා මුනිවරිය මෙලෙස ප්‍රකාශකොට ඇත. දිව්‍ය පූජාව තුළ කිසියම් ආකාරයකින් භාග්‍යවත් කන්‍ය මරියෝත්තමාවන් සිටින වග මම දනිමි. ඊට හේතුව වන්නේ ශුද්ධවූ ත්‍රිත්වය සමඟ ඇති ඇයගේ සමීප සම්බන්ධතාවයත්, ඇය සැබෑ මනුෂ්‍යයා හා සැබෑ දෙවියන් වූ ක්‍රිස්තුන් වහන්සේගේ මව වන නිසාත් ය. අති පරිශුද්ධ මරියෝත්තමාවන්ගේ කුස තුළ ජේසුස් වහන්සේ පිළිසිඳගන්නේ කිසි මිනිස් ප්‍රාණියෙකුගේ සම්බන්ධකමකින් නොව ශුද්ධාත්මයාණන් වහන්සේගේම බලය නිසාම පමණක් වේ. උන්වහන්සේගේ නහර තුළ දිව යන්නේ එතුමියගේ රුධිරයයි. එම රුධිරය නම් කල්වාරියේ හා දිව්‍ය යාගය තුළ පිදෙනා ගැලවීමේ යාගයේ රුධිරයයි.

දිව්‍ය සත්ප්‍රසාද යාගය වනාහි එක වරක් පමණක් පිදූ කල්වාරියේ ගැලවීමේ යාගය සක්‍රමේන්තු ආකාරයෙන් (රුධිර වැගිරීමකින් තොරව) නැවත පරිස්මරණය කිරීමයි. කුරුසිය පාමුල කන්‍යමරියෝත්තමාවන්ගේ සෙනෙහෙබර ඉරියව්, ආකල්ප කිසියම් ආකාරයකින් සැම දිව්‍ය සත්ප්‍රසාදයකදීම විද්‍යමාන වේ.

යාගය තුළ පුද කළ ශරීරයත්, අල්තාරය මත සක්‍රමේන්තු ආකාරයෙන් පූප සහ මිදිරස තුළ විද්‍යමාන වෙන ශරීරයත් ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් පිළිසිඳගත් ශරීරයම වේ.


දහසය වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමා උගන්වන පරිදි කුරුසිය පාමුල මරියෝත්තමාවන් වැඩසිටියා සේ සාන්ත සභාව සමඟ හා සාන්ත සභාවේ මාතාව වශයෙන් හැම දිව්‍ය සත්ප්‍රසාද මෙහෙයකම එතුමිය වැඩසිටින්නීය. එම නිසා වෙන කිසිකෙනෙකුට වඩා හොඳින් විශ්වාසයෙන් හා ආදරයෙන් දිව්‍ය යාගය අවබෝධ කර ගන්නට හා ජීවත් වන්නට එතුමියට අපට කියාදිය හැකිය.

දිව්‍ය සත්ප්‍රසාදය තුළ අපගේ ශරීර හා ආත්මයන් තුළට ලබා ගන්නා ක්‍රිස්තුස් වහන්සේ මරියෝත්තමාවන්ගේ ශරීරයේ හා ආත්මයේ ජනිත වූ ක්‍රිස්තුන් වහන්සේමයි. මේ හේතූන් සියල්ල සැළකිල්ලට භාජනය කරන කල, සාන්ත ජෝසේ මරියා තුමිය විසින් දිව්‍ය යාගය "ප්‍රධාන මරිය බැතිය" ලෙස හැඳින්වීම සැබවින්ම වරදක් නොවේ.

## මරියෝත්තමාවන් සහ දිව්‍ය සත්ප්‍රසාදය

ශුද්ධවූ සභාව හා දිව්‍ය සත්ප්‍රසාදය අතර පවතින ගැඹුරු සම්බන්ධතාවයේ පොහොසත්කම අපට සොයා ගැනීමට කැමති නම් එම සභාවේ මාතාව වන කන්‍ය මරියෝත්තමාවන් අපට කිසිසේත්ම පැහැර හැරිය නොහැකිය. දිව්‍ය සත්ප්‍රසාදය සමඟ එතුමිය තුළ ඇති ගැඹුරු සම්බන්ධතාවය නිසාම අති ශුද්ධවූ සක්‍රමේන්තුව කරා අප සැම කැඳවාගෙන යන්නට ඇයට හැකියාව ඇත.

දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවමාන වැඩ සිටීම පිළිබඳ විශ්වාසය අපගේ කතෝලික ඇදහිල්ලේ කේන්ද්‍රීය සත්‍යයකි. අවාසනාවකට මෙන් අප වෙත ඒ තුළින් අත්පත් වී ඇති අසීමිත වරප්‍රසාද ගැන බොහෝ විට අපට අවබෝධයක් නැත. එසේත් නැතිනම් අප විසින් ඒවා අගය කරනු නොලබයි. වඩා හොඳ කතෝලිකයන් වීමට අප ආශා කරන්නේ නම් හා ස්වාමින් වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවය වැඩි දියුණු කර ගන්නට අවශ්‍ය නම් දිව්‍ය සත්ප්‍රසාදය වෙත ඇති අපගේ ආදර ගෞරවය ගැඹුරු කර ගත යුතු වේ. කෙසේ ද අපට එය කළ හැක්කේ? තවමත් එතරම් ප්‍රයෝජනයට නොගත් එක් හොඳ ක්‍රමයක් වන්නේ ජේසුස් වහන්සේගේ මාතාවන් වන කන්‍ය මරියෝත්තමාවන් වෙත හැරීමයි. ඇය ගැන දැන ගැනීමෙන් හා එතුමියගේ ජීවිතය අධ්‍යයනය කිරීම තුළින් දිව්‍ය සත්ප්‍රසාදය තුළ මුළුමනින්



වැඩවසන්නාවූ අප ස්වාමියාණන්ට වඩාත් සමීප විය හැකිය.

දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා, එක්ලේසියා එයුකරිස්ටියා නමැති විශ්ව චක්‍ර ලේඛනයේ සම්පූර්ණ පරිච්ඡේදයක් දිව්‍ය සත්ප්‍රසාදයේ කාන්තාව වන මරියෝත්තමාවන් වෙනුවෙන් වෙන් කරනු ලබයි. දිව්‍ය සත්ප්‍රසාදයේ මුළුමනින්ම වැඩ වසන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ගැන වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා එතුමියට අපට උදව්විය හැක්කේ කෙසේදැයි හැදෑරීම සඳහා එතුමාගේ සිතිවිලි එකක් දෙකක් පමණක් මෙහිදී විමර්ශනයට භාජනය කෙරේ.

## මරියෝත්තමාවන්ගේ ගැලවීමදායක කැමැත්ත : "ඔබ කී ලෙස මට සිදුවේවා"

ගාබ්‍රියෙල් දේවදූතයා විසින් මරියෝත්තමාවන්ට මංගලම් කී අවස්ථාවේ, මරියතුමී දුන් ප්‍රතිචාරය, ගැලවීමේ ඉතිහාසය තුළ හා විශේෂයෙන්ම දිව්‍ය සත්ප්‍රසාද අභිරහස දිගු හැරුම තුළ ඉතාම වැදගත් මොහොතක් විය. අප එම උත්තරීතර මොහොත හඳුන්වන්නේ "ෆියාට් හෙවත් "මරියාවන්ගේ ගැලවීමදායක කැමැත්ත, පූර්ණ ප්‍රතිචාරය: "ඔබ කී ලෙස මට සිදුවේවා" යනුවෙනුයි.

ගාබ්‍රියෙල් දේව දූතයා විසින් දෙවියන් වහන්සේගේ මව වීම සඳහා මරියෝත්තමාවන්ගේ කැමැත්ත විමසූ අවස්ථාවේදී එතුමිය එම ආරාධනයට පූර්ණ ප්‍රතිචාරයක් දක්වයි. එම ප්‍රතිචාරය විසින් පුදුම සහගත දෙයක් සිදුවීමට ඉඩ සලසයි. දෙවියන් වහන්සේ මිනිසත් බව ගැනීම, වචනය මාංශගතවීම එහිදී සිදුවේ. කල්වාරි කඳු මුදුන මත මරියෝත්තමාවන් නිශ්ශබ්දව වැඩසිටියාය. එම නිශ්ශබ්දතාවය තුළින් එතුමියගේ ගැළවීමදායක කැමැත්ත නැවත ප්‍රකාශවුණි. සාන්ත සභාව උපදින්නේ ගැලවුම්කරුවාණන්ගේ සිදුරුවුනු හදවතෙනි.

දෙවියන් වහන්සේගේ ආරාධනයට අහම්බෙන් හෝ එතුමිය බැහැයි කීවා නම් මොනවා වෙන්නට ඉඩ තිබුණිද? එසේ නම් අප තවමත් මෙසියස් කෙනෙක් එනතුරු බලා සිටිනවා විය නොහැකිද? මරියෝත්තමාවෝ නව ඒවය. පළමු ඒව විසින් දෙවියන් වහන්සේට කැමැත්ත නොදී ඉතිහාසයේ ගමන් මඟ වෙනස් කළාය. නව ඒව වන මරියාවන් විසින් දේව ආරාධනයට හිස නමා අවනත වී මිනිස් පවුල නැවතත් නිවැරදි මඟට යොමු කළාය.

ශුද්ධෝත්තම පියතුමා විසින් මරියෝත්තමාවන්ගේ කැමැත්ත හා දිව්‍ය සත්ප්‍රසාදය තුළ ස්වාමින් වහන්සේගේ ශරීරය ලබා ගන්නා අවස්ථාවේදී හැම විශ්වාසකයෙක් විසින්ම දෙනු ලබන පිළිතුර වන "ආමෙන්" අතර අලංකාර සම්බන්ධතාවයක් ගොඩනගයි. ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය තුළින් තමා විසින් පිළිසිඳ ගන්නා ලද තැනැත්තා හෝ "දේව පුත්‍රයා" විශ්වාස කරන්නට මරියාවන්ට ආරාධනය කෙරුණි. මරියෝත්තමාවන්ගේ විශ්වාසයට අනුව යමින් දිව්‍ය සත්ප්‍රසාද අභිරහස තුළ, ශුද්ධාත්ම බලය තුළින් මරියෝත්තමාවන් තුළ පිළිසිඳගත් තැනැත්තාණෝ දෙවියන් වහන්සේගේ පුත්‍රයා හා මරියෝත්තමාවන්ගේ පුත්‍රයා බව විශ්වාස කිරීමට අපට ආරාධනය කෙරේ. ජේසුස් වහන්සේගේ පූර්ණ මිනිසත් බව හා පූර්ණ දේවත්වය තුළින් පූප සහ මිදිරස නමැති සළකුණු තුළ ජීවමානව වැඩ වසන බව විශ්වාස කරන්නට අපට ආරාධනය කැරේ.

ලෝකය තුළ සිදුවෙන ශ්‍රේෂ්ඨතම ප්‍රාතිහාර්යය එයයි.

දිව්‍ය සත්ප්‍රසාද භෝජනය අවස්ථාවේදී පූපය ඉදිරිපිට අප "ආමෙන්" යැයි පවසන අවස්ථාවේදී අප නොකියා පවසන්නේ "මේ මොහොතේ මගේ හදවත තුළට පැමිණෙන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි මම විශ්වාස කරමි" යන්නයි. ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය - ආමෙන්. ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය - එසේය. ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය - ෆියාට්. එක සුළු වචනයක් මඟින් විශ්වාසයේ හා ආදරයේ චමත්කාරය ප්‍රකාශ වීමේදී එම වචනය මොන තරම් වැදගත් ද?

දිව්‍ය සත්ප්‍රසාදය සමඟ මරියෝත්තමාවන්ගේ සම්බන්ධතාවය නිරූපණය කරමින් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා මරියෝත්තමාවන් විසින් එළිසබෙත් තුමිය බැහැදකින්නට ගිය අවස්ථාව මැනවින් උපයෝගී කර ගනී. මරියෝත්තමාවන්ගේ මාංශගතවීමේ අභිරහස තුළ සාන්ත සභාවේ සත්ප්‍රසාදීය විශ්වාසය කලින් අපේක්ෂා කළ බව එතුමා සඳහන් කරයි.

මෙම අපේක්ෂාව මඟින් අර්ථ ගැන්වෙන්නේ කිමෙක් ද? හැම දිව්‍ය සත්ප්‍රසාද මෙහෙයකදීම විශ්වාසකයින් තුළින් සිදුවන දේ මරියෝත්තමාවන් විසින් මාංශගතවීමේ අවස්ථාව තුළ අපේක්ෂා කර ඇත.

එනම් අපගේ ජීවිත වලට ලබා ගැනීම සඳහා පූප සහ මිදි යුෂ තුළින් ක්‍රිස්තුන් වහන්සේ ජීවමානව වැඩසිටීමයි.

වයස්ගතව සිටි සිය ඥාති සොහොයුරිය වූ එළිසබෙත් තුමී බැහැදැකීමට මරියාවන් ගියාය. සැම දෙනා විසින්ම වඳ යයි සලකන ලද ඇය ඒ වන විට දෙවියන් වහන්සේ විසින් තිළිණ කරන ලද ගර්භනීබව තුළ හය මසක් පසුකර තිබුණි (ලූක් 1/36). මරියෝත්තමාවන් විසින්, ඇගේ කුස තුළ පිළිසිඳගත් ජේසුස් වහන්සේ රැගෙන ගියාය. එතුමිය තරුණ ළඳක් වූවත් ඇය බිය නොවුණි. ඊට හේතුව දෙවියන් වහන්සේ ඈ තුළ, ඈ සමඟ සිටීමයි.

එක විදිහකින් පැවසිය හැක්කේ එතුමියගේ චාරිකාව ඉතිහාසයේ පළමු "දිව්‍ය සත්ප්‍රසාද පෙරහර" බවයි. මරියෝත්තමාවන් එළිසබෙත් තුමිය බැහැදකින්නට ගිය අවස්ථාවේ ඇය ගේ කුස තුළ දරාගෙන සිටියේ මාංශගත වූ වචනයයි. එක අතකින් ඇයගේ කුස "සත්ප්‍රසාද කුඩුවක්" (නිවහනක්) බඳුයි. ඒ අනුව බලන කල ඉතිහාසයේ පළමු සත්ප්‍රසාද කුඩුව මරියෝත්තමාවන්ගේ කුසයයි. ඒ තුළ දේව පුත්‍රයා මිනිස් බැල්මට තවමත් අදෘෂ්‍යමාන වුණත් තමන් වහන්සේට ගරු බුහුමන් දැක්වීම සඳහා එළිසබෙත් තුමියට ඉඩ සලසයි. මරියෝත්තමාවන්ගේ දැස් තුළින් හා කටහඬ තුළින් උන්වහන්සේගේ ආලෝකය විහිදුවාලීමට ඉඩ සලසයි.

## දිව්‍ය සත්ප්‍රසාදයේ සහභාගිවීම

සිය දරුවන් මනා ලෙස පෝෂණය වීම කන්‍ය මරියෝත්තමාවන් අපේක්ෂා කරයි. මේ හේතුව නිසා දිව්‍ය සත්ප්‍රසාද භෝජනය තුළ උන්වහන්සේ නිතරම ලබා ගැන්මට ඇය ඔවුන් උනන්දු කරවයි. ස්වාමින් වහන්සේ අහස් නැගීමෙන් පසු, මුල් කිතුනු සංඝය "පූප කැඩීමේ" මෙහෙයයන් වලට කිතුනු සංඝය සමඟ මරියතුමිය ද සහභාගි වූ වග පොදුවේ පිළිගත් කරුණකි. අන්තිම රාත්‍රි භෝජනය අවස්ථාවේ මරියතුමිය නොසිටියද අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතට අනුව සංඝයේ හදවත එකට යාවී යැදුම තුළ පසුබට නොවී ඉදිරියට යන්නට ඇය උදව් කර ඇත.

අප අද දිව්‍ය පූජා යාගයට සහභාගි වන්නා සේ මරිය තුමියද ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රාවකයන් සමඟ දිනපතා දිව්‍ය යාගයට සහභාගි වන්නට ඇත. දිව්‍ය යාගය අවස්ථාවේදී සත්ප්‍රසාදීය ජේසුස් ඇගේ ඇස් ඉදිරිපිට ඔසවන විට මරිය තුමිය සිදු කළ භාවනාව ගැන අපට පරිකල්පනය කළ හැකිද? අන්තිම රාත්‍රි භෝජනයේදී ප්‍රකාශ කළ "මේ මාගේ ශරීරය" "මේ මාගේ රුධිරය" යන වදන් ජුවාම්, පේදුරු, ජාකොබ් සහ අනෙකුත් අපෝස්තුළුවරුන් විසින් උච්චාරණය කරන විට, මරිය තුමියට මොනවා සිතෙන්නට ඇද්ද? ඒ මරියතුමියගේ කුසය තුළ පිළිසිඳගත් ශරීරයමයි. ඒ මරිය තුමිය ජීවය දුන්, මිනිසත් බව ගත් දේව වචනයේ රුධිරයමයි. සිය දිව්‍ය සත්ප්‍රසාදිය පුතනුවන් කෙරෙහි මරියතුමියගේ හදවතේ ඇති වූ ආදරය, බැතිබර භක්තිය තේරුම් ගන්නට අපට හැකියාව ඇද්ද?

**(මෙම තේමාව පිළිබඳ වැඩිපුර විස්තර තව නොබෝ දිනකින් එළි දැක්වෙන "දිව්‍ය සත්ප්‍රසාදයේ කාන්තාව වන මරියෝත්තමාවෝ" යන ම විසින් රචිත පොත තුළ අඩංගු කොට ඇත. - ගරු විලියම් ඉවාන්ස් ලියනාරච්චි පියතුමා )**

# බදු කබලෙන් ජනතාව ලිපට ද?

**ලංකාවේ නීති පද්ධතියට බදු අය කිරීමේ අධිකරණයක් අවශ්‍ය ඇයි? එක පැත්තකින් ධනය හා බලය ඇති පිරිස බලහත්කාරයෙන් බදු ගෙවීම පැහැර හරිමින් සිටිති. අනෙක් පැත්තෙන් රජය තමන්ගේ උවමනාවෙන්ම කුප්‍රකට ව්‍යාපාර උදෙසා බදු සහන නිවේදනය කරයි. නොදැන බදු ගෙවමින් සිටින ජනී ජනයා බදු වංචාකරුවන් අල්ලා නීතියෙන් දඬුවම් කරනු ඇතැයි බලා සිටිනු ඇත. බදු වංචා කරන පිරිස එසේම සිටිය දී මහජනතාව මානසිකව රවටන පිළිවෙතකින් රටට ඇති පලක් නැත.**

රජයට ආදායම් ලැබෙන ක්‍රම ගණනාවකි. ආදායම් බදු එයින් ප්‍රධාන තැනක් ගනී. මෙරට බදු ආදායම අනුව වැඩිම බදු ප්‍රතිශතයක් ලැබෙන්නේ වක්‍ර බදු මගින්ය. එය සියයට අසූවක පමණ ප්‍රතිශතයකි. සෘජු බදු ඉතිරි සියයට විස්සයි. වක්‍ර බදු යනු මහජනතාව තමන් බදු ගෙවන බව නිසි ලෙස නොදැන කරන ගෙවීමයි. අද වන විට වෙළඳපොළේ ලොකු ලූනු කිලෝවක් රුපියල් 180 වන අතර, මෙරට ලොකු ලූනු වග ාකරුවන් ආරක්ෂා කරන්නට රජය අය කරන කිලෝවකට රුපියල් හතලිහක බද්ද සමග ආනයනික ලොකු ලූනු මෙවැනි වැඩි මිලකට හේතු වී ඇති බව ජනතාව දන්නේ නැත. අර්තාපල්, සීනි එළවළු තෙල් ඇතුළු නොයෙකුත් දේ වෙනුවෙන් පමණක් නොව එදිනෙදා කනබොන අඳින පළඳින සෑම දෙයකින් ම විශාල බද්දක් ජනතාව ගෙවති. සෘජු බදු ගෙවන පිරිස සීමිතය. ආණ්ඩුවේ ආදායමට කෙළින් ම බදු ගෙවන පිරිස 897.000 ක් බව රේගු දෙපාර්තමේනතුවේ දත්ත දක්වයි. ලක්ෂ පහමාරක් පමණ වන උපයන විට බදු ගෙවන පිරිස අත්හැරිය විට ලක්ෂ තුනහමාරක පමණ පුද්ගලයෝ පිරිසක් රටට ආදායම් බදු ගෙවති. මිලියන විස්සක් අතරින් ලක්ෂ තුනහමාරක් පමණක් කෙළින්ම ආදායම් බදු ගෙවන බව දක්වන නමුත් රටේ ග ැවසෙන ධනය සහ පරිහරණය කරන වාහනවලින් එය ඊට වැඩිවිය යුතු බව පැහැදිලිය. බදු නොගෙවන පිරිසක් සිටිති. බදු නොගෙ වන පිරිස සොයන්නට ආණ්ඩුවේ බදු දෙපාර්තමේන්තුව විශාල මෙහෙයුමක් කරයි. එහෙත් එහි පැටලෙන්නේ සාමාන්‍ය පිරිසය. අතිවිශාල ධනවත්තු බදු නොගෙවා මහා සාඩම්බර ආකාරයට සමාජයේ ජීවත් වෙති. මෙම පිරිස සොයා නඩු පවරා දඬුවම් කරන්නට අධිකරණයට හැකියාව තිබේද?

1995 වසරේ දී ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල ආදායම ඇමරිකානු ඩොලර් 790 කි. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 20.4 ක බදු ආදායමක් උපයා ගත හැකිවිය. 2009 වසරේ දී ඒකපුද්ගල ආදායම ඇමරිකාන ඩොලර් 2053 ක් වනවිට බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 14.6 ක් සහ 2012 දී ඒකපුද්ගල ආදායම ඇමරිකාන ඩොලර් 2300 ක් වනවිට බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 13.5 ක් තෙක් අඩුව ඇත. රට දියුණු වන විට බදු ආදායම අඩුවීම යහපත් ලක්ෂණයකි. සාමාන්‍ය ජනතාව ගෙවන බදු අඩු වී ඒවා තුනී වී යෑම අවශ්‍යය. එහෙත් ලංකාවේ සිදුවන්නේ එය නොවේ. ඉසුරුමත් පුද්ගලයන් බදු සහන ලබන අතර තවත් පිරිසක් බදු වංචා කරති. මෙහි බලපෑම කෙළින් ම එකතු වන්නේ සාමාන්‍ය දුගී දුප්පතුන්ටය. අත්‍යවශ්‍ය දේ වෙනුවෙන් වක්‍රව බදු පනවන විට ඒවා නොගෙවා සිටින හැකියාවක් පොදු ජනතාවට නැත. පෙනෙන ආකාරයට ලංකාව තුළ විවිධ නම්වලින් සහ විවිධ අදියරවලදී මහජනතාවගෙන් අයකරන බදු වර්ග ගණන විසිපහකට අධිකය.


2013 අවුරුද්දේ පළමු මාස හතර ඇතුළත පරිභෝජනය මත අයකරන බදු රුපියල් බිලියන 88.8 තෙක් සියයට 6.2 කින් වැඩිවී තිබේ. ආනයනය ආශ්‍රිතව අයකරන බදු රුපියල් බිලියන 129.5 දක්වා සියයට 14.1 කින් අඩු වී ඇත. මෙම කාලය තුළ රජයේ වියදම සීමාවීමක් සිදුනොවීය. පුනරාවර්තන වියදම් රුපියල් බිලියන 471 දක්වා සියයට 2.33 කින්, වැටුප් වියදම රුපියල් බිලියන 126 දක්වා සියයට 13.23 කින් සහ ණය වෙනුවෙන් ගෙවන පොලි වියදම රුපියල් බිලියන 176 දක්වා සියයට 1.4 කින් වැඩිවී ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තා පෙන්වයි. රජයේ වියදම වැඩි වන විට එය පියවා ගන්නට බදු බර එකතු වී ඇත්තේ පොදු ජනතාවගේ කරපිටටය. ඒකපුද්ගල ආදායම වැඩිවන විට පොහොසතුන් වැඩිවිය යුතු නමුත් රජයට කෙළින්ම ආදායම් බදු ගෙවන පිරිස සීමා සහිතය. සංවර්ධනය යනුවෙන් කෙළින්ම පෙනෙන්නේ දුප්පතුන් තවදුරටත් දුප්පත් කිරීමේ කලාවක් බව අවබෝධකර ගත හැකිය.

රේගු බදු වාර්තා අනුව නිතිපතා මෙරටට කරන ආනයනවලදී විශාල වශයෙන් වංචා සිදුවෙයි. නොයෙක් කූට උපක්‍රම මගින් අඩු මිල ගණන් දක්වමින් කරන ආනයනවලදී දිනකට රුපියල් මිලියන 300 ක පමණ වංචාවක් සිදුවන බව නිල වශයෙන් කියැවෙයි. මෙයට අමතරව නොයෙකුත් වෘත්තීන්වල නිරත වෘත්තිකයන් තම සැබෑ ආදායම පෙන්වන්නේ නැත. විශේෂයෙන් මහජනතාවට සේවා සපයන ටියුෂන් ගුරුවරයාගේ සිට, වෛද්‍යවරුන්, නීතිවේදීන්, ගිණුම් සම්පාදකයන් සහ සැලසුම් ශිල්පීන් යනාදී වශයෙන් නොයෙක් ස්ථරවල සේවය කරන ලක්ෂ සංඛ්‍යාත පිරිසක් නිසි ආකාරයට තමන්ගේ ආදායම් පෙන්වන්නේ නැත. එය රටට සිදුවන බරපතළ හානියකි.

මේ අනුව බලන කල අලුතින් බදු අධිකරණයක් පිහිටුවනු ලැබුවහොත් රටට අත්පත්විය හැකි ඉරණම මෙයට වඩා වෙනස් වෙතැ'යි තක්සේරුවකට යෑමට ඉක්මන් විය යුතු නැත. දැනටත් රටට අධිකරණ පද්ධතියක් තිබේ. මහජනතාව එහි යුක්තිය පතා බලාපොරොත්තු සහගතව සිටිති. ඉඩම් නඩු, නඩත්තු, වන්දි නඩු වශයෙන් නොයෙක් අපරාධ පරම්පරා ගණන් විභාග වෙයි. මෙම නඩු ධන උල්පත් බවට පත්ව ඇත්තේ නීතිඥයන්ටය. මෙරට ඇතැම් නීතිඥයන් පුද්ගලික කුලී ගුවන් යානාවලින් රටේ දෙතුන් තැනට යමින් එකම දිනය තුළ නඩු ගණනාවකට පෙනීසිටින තරමට නීති අංශය සංකීර්ණ වී තිබේ. විනිසුරුවරුන් තමන්ගේ දීමනා වැඩි කරගන්නට නිලධාරීන් හමුවේ ලිපි ලියන අතර නීතිවේදීන් ගුවනින් යමින් නඩුවලට පෙනීසිටින තරමට පොහොසත් යුගයක අලුතින් පිහිටුවන බදු අධිකරණයකින් මුලින් වට කළයුතු ඔවුන්ම ය. එසේ විය හැකියැ'යි කල්පනා කළ හැකිද? බදු නොගෙවන නීතිඥයන් ගැන නොයෙක් මතවාද ඇති පසුබිමක බදු අධිකරණයක් පිහිටුවා ඔවුන්ට දඬුවම් කළ හැකිද?

මෙයින් පෙනෙන්නේ මෙම අධිකරණ හුදෙක් දැනට පෙළෙන ජනී ජනයාගේ සිත් සතුටු කරවන වෑයමක් පමණක් වනු ඇති බවය. බදු නොගෙවන පිරිසට වඩා බදු නොගෙ වන බලය ඇති පිරිස වැඩි රටක නීතියට කළ හැකි වැඩි යමක් නැත. එය අපට පෙන්වන යථාර්ථයයි.

ප්‍රථමයෙන් රට තුළ සාධාරණ බදු ප්‍රතිශත තිබිය යුතුය. බදු ගෙවන විට මෙම බදු ගෙවන්නේ තමන්ට වඩා හොඳ සේවයක් සැලසීම සඳහා බව මහජනතාවට ඒත්තු යන්නට අවශ්‍යය. අද එවැන්නක් නැත. මෙයින් අවුරුදු දෙකකට කලින් ජනාධිපති බදු කොමිසමක් පත් කළ අතර එම කොමිසමේ නිර්දේශය වූයේ ද සාධාරණ අඩු බදු ප්‍රතිශත අයකරන අතර එය කාර්යක්ෂම විය යුතු බවය. එහෙත් ආණ්ඩුව තමන්ගේ වියදම වැඩි කරගෙන සිටින පසුබිමක සහ වියදම දිනෙන් දින වැඩිවන බව පැහැදිලිව පෙනෙන විට බදු අඩු කළ හැක්කේ කෙසේද? වියදම් වැඩිවන විට තවත් බදු පනවන අතර ඒවා වැඩි කොටසක් වක්‍ර බදු වශයෙන් මහජනතාවගේ ආදායම උදුරා ගනී. එය සමහන් කරන්නට වංචනිකයන් අල්ලා ගන්නා බව ප්‍රකාශ විය හැකි අතර ඔවුන්ට දඬුවම් කරන්නට අධිකරණ පිහිටුවන බව ද අවධාරණය කරනු ඇත. වඩා අවශ්‍ය වන්නේ පැහැදිලි සරල යාන්ත්‍රණයකි. මහජනතාව තම් යුක්තිසහගත ලෙස බදු ගෙවන බවට විනිශ්චයකට යා යුතුය. එවිට තව තවත් යාන්ත්‍රණ අනවශ්‍යය.



## මාසික ආර්ථික විමසුම

ඉදිරිපත් කිරීම ප්‍රවීන ආර්ථික විශ්ලේෂක

**වින්සන් මර්වින් ප්‍රනාන්දු**

# අය වැය වැලක නව වැනි අයවැය

**නිදහසින් පසු බලයට පත් රජයන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අයවැය ගණන 67 කි. වත්මන් රජය 2005 බලයට පැමිණි පසු ඉදිරිපත් කළ අයවැය කථා සංඛ්‍යාව 9 කි. 2014 අයවැය ලෙස 2013 නොවැම්බර් 21 දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ එම නව වැනි අයවැයයි. එම අයවැය කරුණු කිහිපයක් නිසා වැදගත් වේ.**

පළමුව පොදු රාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායක සමුළුවේ (චොගම්) නව සභාපති ශ්‍රී ලංකාවේ ඉදිරිපත් කරන පළමු අයවැය එය වේ. දෙවනුව, ත්‍රස්තවාදයට තිත තබා, උතුරේ මැතිවරණයක් පවත්වා එහි පළාත් සභාවකට උතුරේ ජනතාවට කැමැති කෙනකු පත් කිරීමට ඉඩ කඩ ලබාදී ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමෙන් පසු පවත්වන පළමු අයවැය කථාවද මෙය වේ. තෙවැනුව 1976 වසරේ නොබැඳි සමුළුවෙන් පසු දකුනු ආසියාවේ ප්‍රථමවරට රටවල් 53 ක් රැස් කරමින් 23 වැනි පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව අවසන් වීමත් සමග රටට නව අභිමානයක් අත්කර දීමට හා ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට හානි කිරීමට අර අඳින ජන කොටස්වලට අතුල් පහරක් එල්ල කිරීමට පැවැත්වූ අතිසාර්ථක උළෙළකින් පසු පැවැත්වෙන පළමු අයවැය ද මෙය වේ.

සාම්ප්‍රදායිකව අය වැය ලේඛනවලින් ජනතාව බලාපොරොත්තු වනුයේ විවිධ ආකාරයේ පෞද්ගලික සහන පමණි. එනම් තමන් රජයේ සේවකයකු නම් ඔහු බලන්නේ වැටුප කීයකින් වැඩිවේද යන්නයි. තමන් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය කෙනකු නම් ඔහු බලන්නේ තමන්ගේ විශ්‍රාම වැටුප කීයක් වැඩිවේද යන්නයි. තමන් ගොවියකු නම් ඔහු බලන්නේ පොහොර සහනාධාර, ගොවි විශ්‍රාම වැටුපක් වැනි දෑ ය. ධීවර ජනයා බලන්නේ ධීවර කර්මාන්තයට ලබා දෙන සහන පිළිබඳවය. එය වැරදි නැත. ඒ බව තේරුම් ගෙන 2014 අයවැයෙන්ද යම් යම් සහන ලබා දී තිබේ. ඒ අනුව රාජ්‍ය සේවකයින්ට රුපියල් 1200/= ක ජීවන වියදමක් ද 2006 ට පෙර විශ්‍රාම ගිය අයට රු. 500/= ක්ද අනිකුත් විශ්‍රාමලාභීන්ට රුපියල් 350/= ක් ද වශයෙන් දීමනා වැඩිකර ඇත. එය සමච්චලයට භාජනය කරමින් දිනකට පාන් 1/2 ක් වත් කෑමට වැඩිකළ දීමනාව මදියයි ද පවසනු පෙනේ. එහෙත් අප කල්පනා කළ යුත්තේ එවැනි ප්‍රමාණයක්වත් ලබාගත නො හැකිව දුක්වෙන ස්වයං රැකියා කරන හා ඇතැම් පෞද්ගලික අංශයේ රැකියා කරන ජන සංඛ්‍යාව මුළු ශ්‍රම බලකායෙන් 81% ක් (ලක්ෂ 65 ක්) සිටින බවය. රජයේ සේවකයින් සිටින්නේ ලක්ෂ 13 කි. එනම් රජයේ සේවකයින්ට දැනෙන ජීවන බර එම ලක්ෂ 65 ට ද දැනුනත් ඔවුන්ට පිහිටවන ක්‍රමයක් අයවැයෙන් සෘජුව ලබා දිය නොහැකිය.

එහෙත් රටක ජීවත්වන සෑම කෙනකුටම පොදුවේ සහන ලබාදිය හැකි ක්‍රම කිහිපයක් තිබෙන අතර ඒවා සපුරාලීමට වත්මන් රජයේ අයවැය 9 පුරාම කටයුතු කර තිබෙන බව පැහැදිලිය. මුල් කාලයේ අයවැය ලේඛනවලින් උත්සහ කළේ වසර 30 ක් තිස්සේ පැවැති යුද්ධය නිම කොට රටට සාමය අත්පත් කර දීමට හා රටේ ආර්ථිකය වේගවත් කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමටය. එය මේ වන විට අතිශයින්ම සාර්ථක වී ඇත. රට තුළ ත්‍රස්තවාදී ක්‍රියා සිදු නොවීම සමස්ත ජනයා ලැබූ යහපතකි. එය මුදලින් මැනිය නොහැකිය. එදා තම රැ කියාවට ගිය ස්වාමි පුරුෂයා, පාසලට ගිය දරුවා යළි ගෙදර එන තුරු ඉතා ම බයෙන් සිටි බිරින් දෑ වරුන්ට මවුවරුන්ට අද ඒ බිය නැත. එය අයවැය හරහා කළ දැවන්ත ආරක්ෂක වියදම්වල ප්‍රතිඵලයක් නිසා සහ කාර්යක්ෂම ලෙස යුද්ධය මෙහෙය වීම නිසා සිදු වූ ප්‍රතිඵලයක් නොවේද එම සහනය රුපියල් සතවලින් නම් මැනිය නො හැකිය. ඉදිරියට එවැනි තත්ත්වයක් ඇති නොවීමට ද ආරක්ෂක වියදම් ඉහළ මට්ටමකින් තබා ගැනීම අවශ්‍ය වේ.

නිදහස ලබා අවුරුදු 60 ක් යනතුරු ශ්‍රී ලංකාවේ අධිවේගි මාර්ගයක් ඉදිකිරීමට රජයක් සමත් වූයේ නැත. අද වන විට අධිවේගි මාර්ග දෙකක් රටට හිමිවූයේ අයවැය හරහා සිදුකළ ප්‍රතිපාදන (එනම් ණය ලබා ගෙන ඒවාට වාරික හා පොළී ගෙවීම) නිසාය. ඒ ඔස්සේ අද දකුණේ සිට කොළඹට ඉතාම කෙටිකාලයකින් ගමන් කිරීමට ව්‍යාපාරික කටයුතු කර ගැනීමට ඉඩ ප්‍රස්ථා ලබා දී ඇත. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ට හා ශ්‍රී ලාංකිකයින්ටද ඉතා කෙටි වේලාවක් තුළ කොළඹට ඒමට හැකියාව උදා වී ඇත. මේවා රටේ අනාගත පරපුර වෙනුවෙන් කළ දිගුකාලීන ආයෝජනයි. එම සහනයේ වැදගත්කම ද මිල කළ නොහැකිය. එවිට රට තුළ පැවති වරායන්, ගුවන් තොටුපල, විදුලිබලාගාර, පාසල්, රෝහල් වැඩිවීම හරහා ඒ ඒ ක්ෂෙත්‍රවල නියැලෙන අයට ලැබෙන සහනය ද මිල කළ නො හැකිය. ඒ නිසා රටක 'සහන' ලෙස අද වැදගත් කොට සලකනුයේ ඒකාලයේ පටන් අපේක්ෂා කළ සිල්ලර සහන නොවේ; මුළු රටටම දැනෙන තොග හා මහා පරිමාණ සහන වැඩ පිළිබඳවයි. ඒ හරහා ලැබෙන ආර්ථික වාසියයි ඒ හරහා ලැබෙන රැකියා තොගයයි. ඒ තුළින් රටේ ඒක පුද්ගල ආදායම ඉහළ යාමයි. රට ජාත්‍යන්තරයට ඔසවා තැබීමයි. රට විදේශ ආයෝජකයින්ට හා සංචාරකයින්ට ආකර්ෂණය කිරීමයි. ගම හා නගරය අතර පරතරය අවම කිරීමයි. කොළඹට කිරි ගමට කැකිරි වැනි කථාවලට තිත තැබීමයි. මේ සියලු ජන කොටස්වල ජීවන බර අවම වන ආකාරයට උද්ධමන පීඩනය අවම කිරීමයි. මේ සියල්ලම ගත වූ අයවැය 8 ක් තුළ සිදු වූ බව පිළිගත යුතු අතර, 2014 අයවැයෙන් කර ඇත්තේ එය තවදුරටත් ඉදිරියට ගෙන යාම යි. මෙම කරුණු සංඛ්‍යාත්මකව ද ඔප්පු කළ හැකිය. 2005 රජය බලයට පත්වන විට රටේ සමස්ත නිෂ්පාදිත වටිනාකම (GDP) ඩොලර් බිලියන 25 කි. එය අද වන විට බිලියන 60 ක් වී වසර 8 ක් තුළ දෙගුණයකට වඩා වැඩි වී ඇත. ඒ නිසාම රටේ ඒක පුද්ගල ආදායම 2005 වන විට ඩොලර් 1241 ක් වූ අතර අද වන විට ඩොලර් 3200 ක් දක්වා තුන් ගුණයකට ආසන්න වැඩිවීමක් පෙන්නුම් කරයි. රටේ උද්ධමන වේගය 2005 දී 10% ක් වූ අතර අද වන විට 6% කට අඩු වී තිබේ. රටේ අපනයන 2005 ඩොලර් බිලියන 6 ක් වූ අතර අද එය 10 ක් වී තිබේ. සංචාරක ඉපැයීම් එම කාලය තුළ ඩොලර් මිලියන 360 ක සිට 1300 කට වැඩි වී තිබේ. විරැ කියා අනුපාතිකය 7% සිට 4% කට අඩු වී තිබේ. රටේ දුප්පත්කම 15% සිට 6.5% කට අඩු වී තිබේ. විදුලිය පහසුකම් 75% සිට 93% කට වැඩි වී තිබේ. පරිගණක සාක්ෂරතාව 35% කි. අකුරු උගත්කම 98.5% කි. යුද්ධය නිම වීමෙන් පසු රටේ අයවැය හිඟය 10% සිට 5% කට අඩුකරගෙන තිබේ. රාජ්‍ය ණය දළ දේශිය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 86% සිට 74% කට අඩුකර ගෙන තිබේ. මේ සියලුම දත්තයන් වැදගත් වනුයේ රටට ලබාදුන් සහන ගැන දැන ගැනීමටය. ඒ නිසා රටක අයවැයෙන් එක් එක් අයට ලැබෙන සහන ප්‍රමාණයට අමතරව රට තුළ ඇතිවන ආර්ථික වර්ධනය, ආර්ථික ස්ථායිතාව, සංහිඳියාව යන ක්ෂෙත්‍ර ඔස්සේ ද වක්‍ර සහන ගණනාවක් ලැබෙන බව අමතක නොකළ යුතුය. අද අයවැය දෙස බැලිය යුත්තේ සූක්ෂම සහන මෙන්ම සාර්ව සහන ද සැලකිල්ලට ගැනීමෙනි.

එහෙත් රටේ ජනයාට මීට වඩා සහන ලබාදීමට දැනට සිදුවන යම් යම් දූෂණ අඩු කිරීමට පියවර ගත යුතුය. රජය ලබාදෙන සේවාවල ගුණාත්මක අගය වැඩිකිරීමට පියවර ගත යුතුය. රට තුළ විනය ගරුක බව වැඩි කළ යුතුය. නීතිය සාධාරණව ඉටුවිය යුතුය. ඉතාම දිළිඳු ජන කොටස් ගැන මීට වඩා කල්පනා කළ යුතුය. රට ගැන ජාත්‍යන්තරය දක්වන විවිධ චෝදනාවලට අවංක පිළිතුරු සැපයිය යුතුය. කොටින් ම රට තුළ යහපාලනය වැඩිදියුණු කළ යුතුය. ඇතැම් දේශපාලකයින් කරන වංචා, හොරකම්, ජඩකම් ශූන්‍ය කළ යුතුය. එම අඩුපාඩුද මඟ හරවා ගත හැකි නම් 2005 න් පසු ඉදිරිපත් කළ අයවැය හරහා බිහිවන රට නිදහසින් පසු හොඳම යුගය පැවැති කාල පරිච්ජේදය බවට ඉතිහාසගත වනු ඇත.

දැල්වෙන පහන්

## පූජක දිවියේ පනස්වැනි වසරට පා තබන

# ගරු ස්ටැන්ලි අබේසේකර පියතුමා


කෙනෙක් ජීවිතයේ වස්තුව, දේපල පසුපස හඹා යද්දී තව අයෙක් ඇලුම් කරන්නෙ අධ්‍යාත්මික ජීවිතයට. සැප සම්පත් සපිරි පවුලක ඉපිද ළමා වියේදීම සියල්ල හැරදමා පූජක දිවිය තෝරාගත් මේ සුසිල්වත් පියතුමා දක්ෂ විනය ගරුක විදුහල්පති තුමකු ලෙස සේවය කොට විශ්‍රාම ගොස් සිටින ගරු ස්ටැන්ලි අබේසේකර පියතුමාය. 2013 දෙසැම්බර් මස 21 වෙනි දිනට සිය පූජක දිවියේ 50 වෙනි වසර සපිරෙන ගරු ස්ටැන්ලි අබේසේකර පියතුමාගේ ළමා කාලයේ සොඳුරු මතකය අවදි කරමින්, මෙසේ අදහස් දැක්වූයේ, එතුමාගේ දයාබර සොයුරිය රීටා අබේසේකර මහත්මියයි.

එක් දහස් නවසිය තිස්පහේ පෙබරවාරි මස තුන්වැනිදා කඳානේ උපන් ඔහුට දොන් බර්නාඩ් ස්ටැන්ලි අබේසේකර යනුවෙන් ඔහුගේ මවුපියෝ නම් තැබූහ. ඔහුගේ පියා දොන් ජෝන් අබේසේකර. කොළඹ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ නඩත්තු අංශයේ ප්‍රධාන ලිපිකරුවන අතර, උග්‍ර කතෝලික බැතිමතෙක්. ඔහුගේ මව දෝන බියට්‍රිස් මාග්‍රට්, ඉතාමත් නිහතමානි කාරුණික අයෙක්. ඔවුන්ගේ නිවස පිහිටා තිබුණේ කඳානේ දේවස්ථානයට යාබදව, සහෝදර සහෝදරියන් හත් දෙනෙකුගෙන් යුත් පවුලේ දෙවැන්නා ඔහු. අක්කර හතරක්වූ වත්තේ ඔවුන්ට හිතේ හැටියට දුවන්න පනින්න සෙල්ලම් කරන්න නිදහස තිබුණා. කඳාන ගමේ පැවති නත්තල් සාදයකදී ජේසු බබාට රඟපානවිට එතුමාට වයස මාස තුනයි. එතුමා ළමා අවධියේ, අම්මාගේ සාරි පොරවාගෙන කෙසෙල් ගෙඩි පෙති කපා සුවාමි කෙනෙක් විදියට පවුලේ අයට ලබන්න දුන් අයුරු ඔහුගේ දයාබර නැගණිය රීටා අබේසේකර මහත්මිය සිහියට නගන්නේ ඉමහත් ප්‍රීතියෙනි.

වර්ෂ 1941 දී මුලින්ම ඇතුල්වුනේ කඳානේ කතෝලික සිංහල පිරිමි පාසලට. තුන්වැනි පන්තියේදී ඉංග්‍රීසි උගන්වන්න ඕනෑ කියලා ඇතුල් කළා කඳානේ ද මැසිනෝද් විද්‍යාලයට. ස්ටැන්ලි ශිෂ්‍යයා ඉගෙනුමට දක්ෂයි. වැඩිය සමත් ගණිතයට. හයවැනි ශ්‍රේණියේදී ඔහුට ද්විත්ව සාමාර්ථයක් ලැබුණා.

අටවැනි පංතියේ හොඳම යාළුවෙක් සුවාමිකෙනෙක් වෙන්න අස්ව ගියා. ස්ටැන්ලි සිසුවාටත් සුවාමි කෙනෙක් වෙන්න ඇත්නම් කියල හිතුණා. ඒ අදහස පියාට කීවිට පියා ඉහලින්ම කැමැත්ත දුන්නා. අම්මා මුකුත් කීවේ නෑ. අක්කා නම් හොඳටම ඇඬුවා. නංගිල මල්ලිලා සමග සතුටින් සැහැල්ලුවෙන් ගතකළ ජීවිතය අතහැරලා යනවිට ඔහුටත් දුක හිතුණා. තාත්තා සමග කොළඹ ඇවිත් ඇතුල්වුණා ශාන්ත ඇලෝසියස් දෙව්සත්හලට. ඒ වනවිට ඔහුගේ වයස අවුරුදු දාහතරයි.

1952 දී ස්ටැන්ලි ශිෂ්‍යයා සාමාන්‍ය පෙළ විභාගය සමත්වුණේ විශිෂ්ඨ සම්මාන හයක් හා සම්මාන දෙකක් ඇතුව. උසස් පෙළ ඉගෙනගන්න ඇතුල්වුණේ මරදාන ශාන්ත ජෝශප් විද්‍යාලයට. 1954 දී උසස් පෙළ විභාග දෙකටම පෙනී සිටියා. ලන්ඩන් උසස් පෙළ සහ ලංකා උසස් පෙළ, විභාග දෙකම ගණිත අංශයෙන්. ලංකාවේ විභාග ප්‍රතිඵල එන්න කලින් ලන්ඩන් උසස් පෙළ ප්‍රතිඵල ලැබුණා.



උසස්ම ආකාරයට විභාගය සමත්. ලන්ඩන් විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදි උපාධියට මෙහේ ඇක්වයිනාස් විශ්ව විද්‍යාල ආයතනයට ඇතුළත් වෙලා ඉගෙන ගත්තා. ද්විතීය පන්ති ඉහළ ගෞරව සම්මානයක් ඇතිව උපාධිය සමත් වුණා. ඒ 1957 දී, පූජාප්‍රසාදි වරයකු බවට පත්වන්නට වසර හතක් පුහුණු විය යුතුය. මහනුවර අම්පිටියේ ජාතික දෙව්සත්හලේ වසර තුනක අභිධර්ම අධ්‍යයනය, දර්ශන විද්‍යාව, දේවධර්ම ශාස්ත්‍රය හැදෑරුවා. අවසාන විභාගයෙන් රන් පදක්කම් වගේම රිදී පදක්කම් දිනා ගන්නට සමත් වුනා.

1963 දෙසැම්බර් මස 21 දා ස්ටැන්ලි සහෝදරතුමා පූජාප්‍රසාදි වරයකු බවට පත්වුණා. 1964 දී මරදාන ශාන්ත ජෝශප් විද්‍යාලයටම උප ගුරුවරයකු ලෙස සේවයට එක්වුණා. ඔහුගේ සුපුරුදු පාසල නිසා සතුටින් වැඩ ඇරඹුවා. සාමාන්‍ය පෙළ පන්තිවලට ගණිතය ඉගැන්වීමට එතුමාට බාරවුනා. කතෝලික පාසල් රජයට පවරා ගැනීමත් සමගම, ස්ටැන්ලි පියතුමා කෝට්ටේ ශාන්ත තෝමස් විද්‍යාලයේ විදුහල්පති පියතුමා ලෙස පත්ව ආවා. 1970-71 වසරවල ස්ටැන්ලි පියතුමා අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හැදෑරුවේ ශිෂ්‍යයන්ට හොඳ සේවාවක් ලබාදීමට, 1978 දී ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් අධ්‍යාපන විද්‍යාව පිළිබඳව විද්‍යාපති උපාධියක් ලබාගන්නට ස්ටැන්ලි අබේසේකර පියතුමාට අවස්ථාව උදාවුනා. එහි ප්‍රථම පරීක්ෂණය කොතරම් ඉහළින් සමත්වුණාදැයි කියතොත් එතුමාට දර්ශනපති උපාධියට පෙනී නොසිටම දර්ශනශූරී උපාධිය ලබාගැනීමට විශ්ව විද්‍යාලය අවසර දුනි. ඒ සඳහා එතුමා ඉදිරිපත් කළ පර්යේෂණ නිබන්ධය "ශ්‍රී ලංකාවේ ප්‍රාග් වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ඇගයීමක්". එය ඒ කාලේ අධ්‍යාපනඥයන්ගේ විශේෂ අවධානයට පාත්‍ර වුණා. එංගලන්තයේ අධ්‍යයන කටයුතුවල නියැලෙන අතරම එතුමා ධර්ම ප්‍රචාරක වැඩවලත් යෙදුනා.

1983 මැයි මස පළවැනිදා ස්ටැන්ලි අබේසේකර පියතුමාට මරදාන ශාන්ත ජෝශප් විද්‍යාලයේ විදුහල්පති පදවිය ලැබුණා. අධ්‍යාපනය, ක්‍රීඩා, කලා කුසලතා මෙන්ම භෞතික සම්පත් සංවර්ධනය කිරීම සඳහා සුවිශේෂී මෙහෙවරක් ඉටුකරන්නට එතුමා සමත්වුණා. අට වසර සිට උසස් පෙළ දක්වා ශිෂ්‍යයන් සඳහා විශාල ගොඩනැගිලි දෙකක්, ක්‍රීඩා පිටි දෙකක්, රමණීය ශ්‍රවණාගාරයක්, පරිගණක මධ්‍යස්ථානයක්, නවීන පන්නයේ ආපන ශාලාවක්, ගුවන් විදුලි මධ්‍යස්ථානයක් ඉදිකිරීමට එතුමා සමත්වූවා. එඬේරමුල්ල ශාන්ත ජෝශප් විද්‍යාලය එතුමාගේ පාලන සමයේ ඉදිවූවක්, එතුමා විසින් ඉදිකරවන ලද දැවැන්ත ක්‍රීඩා සංකීර්ණය එතුමාගේ පාලන සමයේ ඉදිවූ ඉතාමත් වටිනා අංගයකි. විද්‍යාලයේ ආදර්ශපාඨය වන "දැනුම තුළින් යහපත් ජීවිතයක් කරවූ යන්න අර්ථවත් කිරීමට අධ්‍යාපනය මෙන්ම ක්‍රීඩා කටයුතු දියුණු කිරීමටත් එතුමා වෙහෙසුනි. පුරා අවුරුදු 13 ක අනුපම මෙහෙවරක් ඉටුකළ ස්ටැන්ලි අබේසේකර පියතුමා 1996 දී විදුහල්පති සේවයෙන් විශ්‍රාම ගත්තේය.

විශ්‍රාම ගැනීමෙන් අනතුරුව පූර්ණ කාලීන ආගමික මෙහෙවරෙහි යෙදෙමින්, එතුමා අමරිකාවේ ලුසියානා ප්‍රාන්තයේ ධර්ම ප්‍රචාර හා ආගමික සේවයෙහි නිරත විනි. 1998 දී යළිත් ලංකාවට පැමිණ නුගේගොඩ ශාන්ත ජෝශප් දේවස්ථානයේ මාස 9 ක් දේව මෙහෙවරෙහි යෙදිනි. ඉන්පසු කොල්ලුපිටියේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ වසර හතක් සේවය කළ එතුමා එයින් විවේක ගැනීමට සිතුවේ එතුමාට දෘශ්‍යාබාධයක් ඇතිවූ නිසයි.

දෙදහස් හය වසරේදී යළිත් මරදාන ශාන්ත ජෝශප් විද්‍යාලයට සපැමිණි සුසිල්වත් ස්ටැන්ලි අබේසේකර පියතුමා, පාසල් විනය කටයුතු හා උපදේශකයකු ලෙස සේවයේ යෙදිනි. පාසලේ ඉතිහාසය ලිවීමේ භාරදූර කාර්යය පැවරී තිබුණේ එතුමාටය. දෘශ්‍යාබාධයක් නිසා මේ දිනවල අසනීප ගතියෙන් පසුවූවත්, තවමත් හිත දේව සේවයට, උසස් රසවින්දනයකින් යුත් පියතුමා ආගමට දහමට මෙන්ම සංගීතයටත් ප්‍රියයි. සේවක නත්තල් සාදවලදී අමරදේව ශූරින්ගේ ගීත ගායනා කරන්නේ හැමෝගේම සිත්සතන් ප්‍රීතිමත් කරමිනි. දෙසැම්බර් මස 21 වෙනි දිනට පූජක දිවියේ 50 වෙනි වසරට පාතබන ගරු ස්ටැන්ලි අබේසේකර පියතුමාට, පූජක දිවිය තුළ තවදුරටත් සේවය කිරීමට නිරෝගී සුවය, දිරිය. බලය, සවිය ලැබේවායි දෙව් සමිඳු වරම් පතමු.


**පද්මිණී නානායක්කාර**

# 40 වසරක් අඛණ්ඩව දහම්ගුරු සේවයේ යෙදුණු කිතුනු සමාජ සේවකයා

එම්. ඒ. කෲස් වන ඔහු මිගෙල් ඇන්තනි සහ මරිය පාක්කියම් යන යුවලගේ තෙවන දරුවා ලෙස 1940-11-25 දින උපත ලබා 1941 ජනවාරි 6 වන දින සියලු සාන්තුවරුන්ගේ දේවස්ථානයේ ප්‍රසාද ස්නාපනය කරනු ලැබුවේය. ඉක්බිති බොරැල්ල දේවස්ථානයට අයත් රෝ/ ක සියලු සාන්තුවරුන්ගේ මිශ්‍ර පාසලේ 1947 සිට 1959 දක්වා අධ්‍යාපනය ලැබූහ.

එම වකවානුව තුළදී සියලු සාන්තුවරුන්ගේ දේවස්ථායේ එවකට මීසම් භාර පියතුමා ලෙස සේවය කළ ගරු ජෝන් හේරත් පියතුමා (1948-1977) යටතේ දේවස්ථානීය ලතින් ගීතිකා කණ්ඩායමේ සාමාජිකත්වය ලැබ සිටිය දී එනම් වර්ෂ (1950 සිට 1957 දක්වා) මාගේ දේවස්ථානීය ධර්මදූතික සේවය ආරම්භ වුණි.

එවකට ඔහුගේ පාසලේ විදුහල්පති ලෙස සේවය කළ මීගමුව මුන්නක්කරේ ගරු කුරුකුලසූරිය ලියෝනිස් ප්‍රනාන්දු මහතා අදාල ගීතිකා කණ්ඩායමෙන් විශේෂ ලෙස තෝරා ගෙන ඔහු හට ගීතිකා හා විශේෂිත යාච්ඤාරාධනා පුහුණු කර පාසලේ සිටියදීම ඔහු හට ද්‍රවිඩ අංශයේ මීසම් කටයුතු (එතුමන් විසින් කරමින් සිටි) භාර දුන්නේය. කුඩා කලම මරිය හමුදාවෙහි සාමාජිකත්වය ලැබ එම සමිතියේ සභාපති ලේකම් යන තනතුරුද භාර දෙන ලදි. එකලම කුඩා දූදරුවන්ට ධර්මෝපදේශය කටයුතු සිදුකිරීමටද පත් කරන ලදී. බොරැල්ල සියලු සාන්තුවරුන්ගේ දේවස්ථානීය ද්‍රවිඩ කාර්මෙල් මෑණියන්ගේ සමිතිය ඒ වන විට ක්‍රියාවිරහිතව, විසිරී ගොස් තිබූ අවස්ථාවේ එනම් 1960 දී එකල මීසම් භාරව කටයුතු කළ ගරු ජෝන් හේරත් පියතුමන්ගේ ඉල්ලීම පරිදි එම සමිතිය නැවත ස්ථාපිත කර එහි සභාපති ධූරය දරමින් සමිතිය වර්ධනය කරන්නට පටන් ගත්හ. එකල සිට එනම් වර්ෂ 1960 සිට 2000



දක්වා සමිතියේ ස්ථිර සාමාජිකයකු ලෙස සිටිමින් සභාපති තනතුරට අමතරව උප සභාපති ලේකම්, භාණ්ඩාගාරික, අනුශාසක ලෙසත් ද්‍රවිඩ අංශයේ අන්නවිරාළ ලෙසත් නම් දරමින් ක්‍රියාකර එම සමිතිය වර්ධනය කරන්නට වූයෙහිය.

එම හේතුවෙන් වර්තමානයේ එම සමිතිය බොරැල්ල මීසමේ පැරණිතම කතෝලික සමිතිය ලෙසත් කිතුනු සේවයෙහිලා ප්‍රමුඛත්වය දරමින් අනෙක් කිතුනු සමිති වලට ආදර්ශවත් සමිතියක් ලෙසත් කොළඹ කිතුනු ඒකකයේ විශේෂිත නමක් දිනාගෙන ඇත. වර්ෂ 1965 දී ශ්‍රී ලාංකේය පාසල් රජයට පවරාගත් හෙයින් පාසල් තුළ කිතු දහම් අධ්‍යාපනය අඩාල වු නිසා පියතුමන්ලා, කන්‍ය සොහොයුරියන් හා ගිහි ජනයා විසින් ධර්මෝපදේශන පංති ආරම්භ කරන ලදී.

ගරු ජෝන් හේරත් පියතුමා විසින් බොරැල්ල මීසමේ ද්‍රවිඩ දහම් පාසල ස්ථාපිත කරමින් 1974 වර්ෂයේ දී ඔහු ප්‍රමුඛ පස් දෙනෙකු තෝරා ගෙන කොළඹ ධර්මෝපදේශන මධ්‍යස්ථානයේ වසරක කලක් පුහුණු කරනු ලැබ දහම් ගුරුවරුන් ලෙස පත්කරනු ලැබිණ එහිලා කෲස් මහතා හා එන්ජල් ඇන්තනි මෙනවිය විසින් 1974 සිට 2000 දක්වා නොකඩවා සේවය කරන ලදී.

දහම් ගුරුවරයෙක් ලෙස වසර 25 කට වැඩි කලක් සේවය කිරීම වෙනුවෙන් වර්ෂ 2000 දී එකල මීසම් භාර පියතුමා වන ගරු බෙනඩික් ජෝසප් පියතුමන් විසින් උපහාර ලැබීමට ලක් වූයේය.

තවද බොරැල්ල සියලු සාන්තුවරුන්ගේ දෙව්මැඳුරේ 2000 වන ද්‍රවිඩ දිව්‍ය පූජාවේදී එනම් 2013.01.06 දී උප රදගුරු ගරු දො. ඉමැනුවෙල් ප්‍රනාන්දු පියතුමන් සහ එවකට මීසම්භාර පිලිසියන් රන්ජිත් පියතුමන් ද ඇතුළු අනෙකුත් පියතුමන්ලා විසින් එතුමාගේ සේවය වෙනුවෙන් ගෞරව කරනු ලැබිණ.

කොළඹ අගරදගුරු පදවියේ මීසම් කිතුනු සේවය. දහම් ගුරු සේවය 40 වසරක් නොකඩවා කළ කිතුනු සේවය අගය කර කොළඹ ජෝසප්වාස් කේන්ද්‍රය විසින් 2013-10-09 දිනදී සංවිධානය කරන ලද උත්සවයේ දී ද සහය රදගුරු දො. ඉමැනුවෙල් ප්‍රනාන්දු පියතුමා විසින් උපහාර පුදනු ලැබ ගෞරව කරනු ලැබීය.

**ආර්. පලිහවඩනආරච්චි**

# ප්‍රදීප ලේඛකයා විවාහ දිවියේ ස්වර්ණ ජයන්තිය සමරයි



ගහකොළට පරිසරයට ආදරය කරමින් කවිය තම දිවියේ කොටසක් කර ගත් අව්‍යාජ කවියකු ලෙසින් ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතට නිරතුරුව කවියෙන් කෙටි කතාවෙන් දායක වූ නුගපේ බී. සී. රුද්‍රිගු මහතා පසුගිය දා තම විවාහ දිවියේ ස්වර්ණ ජයන්තිය සමරණු ලැබීය.

ඒ මහතා වසර 40 ක කාලයක් බම්බලපිටිය ශාන්ත පීතර විදුහලේ ලේඛකාධිකාරී ලෙස කටයුතු කර ඇති අතර රාජකාරිය දේවකාරිය ලෙස සලකා තම උපරිම කැපවීම හා දායකත්වය ලබා දීමට ද නොමසුරු විය. දියණියන් තිදෙනෙකු, පුතනුවන් තිදෙනෙකු දයාබර පියාණන් ලෙසින් තම ජීවන ගමනේ යුතුකම් ඉටුකිරීමට තම ආදරණීය බිරිඳගෙන් මහමෙරක් තරමට වූ ආදරය හිමි කර ගැනීමට ද වාසනාවන්ත විය. පී. ඩී. මේරි තෙරේසා නම් වූ ඇය තම දරුවන් යහමඟ යැවීමටත් පවුලේ දියුණුව වෙනුවෙන් කැප වෙන්නටත් තම ස්වාමියාට අතිශය ආදරණීය බිරිඳක් වන්නටත් තම මුළු දිවියම කැප කළාය.

ජීවිතයේ බොහෝමයක් දුක් කරදර හමුවේ තම දරුවන් දෙවිඳුන්ගෙන් ලැබූ උතුම්ම වරප්‍රසාදයන් ලෙස පිළිගනිමින් ඔවුන්ට දැක් වූ ආදරය නිසාවෙන්ම තම දරු මුනුබුරු මිනිපිරියන් අතර ඉතා සෙනෙහෙබර මවක් පියෙක් ලෙසින් මෙන්ම සෙනෙහෙබර සීයා කෙනෙකු හා ආච්චි කෙනෙකු ලෙස තම සැඳෑ සමය ගත කිරීමට ද වාසනාවන්ත වී ඇත.

තම ඥාති පූජක පුතකු වන ගරු නිහාල් රුද්‍රිගු පියතුමා විසින් බෝපිටිය ශුද්ධ වූ නිකුලා වූ මුනිඳුන්ගේ දෙව් මැඳුරේ දී පසුගිය දා දෙවිඳුන්ට තුති පිදීමේ දිව්‍ය පූජා යාගය සිදුකරන ලදී. අද සමාජයේ බොහෝමයක් විවාහක පවුල් වලට ආදර්ශයක් වූ මෙම යුවලට ඔවුන්ගේ ඉදිරි කාලය දේවාශිර්වාදයෙන් පූර්ණ වන්නට තම ඥාති හිතවතුන් එම මොහොතට එක් වූහ.

බී. සී. රුද්‍රිගු යුවලට නිදුක් නිරෝගි සුවය ප්‍රදීප පාඨකයන් සමග ප්‍රාර්ථනා කරමු.

**ඇන්ටනි පෙරේරා**
කැපුන්ගොඩ

**ආගම ධර්මය ...** 1 පිටුවෙන්

ආගම ඉගැන්වීමට අනුයුක්ත කරන ලද සමහර ගුරුවර ගුරුවරියන්ට එම විෂය උගැන්වීමට ඉඩ ප්‍රස්තා සීමා කරන විදුහල්පතිවරු රජයේ පාසල්වල සිටීම අපගේත්, දෙමාපියන්ගේත් කනස්සල්ලට හේතු වී තිබෙනවා.

ඒ වගේම, අපගෙන් සහතිකයක් ලබා ගෙන ආගම විෂය උගැන්වීමට පුහුණුවක් ලබාගෙන, රජයේ පත්වීමක් ලැබ, ක්‍රිස්තියානි ආගම ධර්මය උගන්වන ගුරුවරයකු ලෙස අනුයුක්ත කරනු ලැබ, එම විෂය උගැන්වීමට අදිමදිකම් කරන උනන්දුවක් නොදක්වන නමුත් වෙනත් විෂයන් උගැන්වීම සඳහා මඟ පාදා ගන්නා අවස්ථාවාදී සුළු පිරිසක් ඇති බව මා සඳහන් කරන්නේ කණගාටුවෙන්. කිසිවෙක් ආගම ධර්මය උගැන්වීමෙහිලා හීනමානයෙන් පෙළී නොසිටිය යුතුයි.

**ඉකුත් සඳුදා...** 1 පිටුවෙන්

මේ පිළිබඳව නොවැ. 26 වනදා "ලංකාදීප" පුවත්පතේ කණගාටුව පළකර පුවතක් පළකර තුබූ අතර, ප්‍රවෘත්ති වාර්තා පළ කිරීමේදී විවිධ මූලධර්මවාදීන්ට "කතෝලික" ලේබලය ගසා කතෝලික පූජකවරුන්ටත්, සභාවටත් අපහාස කිරීමේ අලුත්ම ප්‍රවනතාවක් මෙරට මාධ්‍ය ඔස්සේ පැතිරයමින් තිබේ. මේ පිළිබඳව දැඩි අවධානයෙන් පසුවන්නැයි සැදැහැවතුනට අනතුරු අඟවමු.

**සිග්නිස්...** 1 පිටුවෙන්

මෙවර මෙම උළෙලේ අනුග්‍රාහක දායකත්වය සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය, සුනිල් ටී. ෆිල්මිස්, වාසනා අයි කෙයා, ෆයින් විෂන්, ජාතික චිත්‍රපට සංස්ථාව සහ නිමල් සුපර් ලයිට් යන ආයතන එක්ව සිටින බව "සිග්නිස්" ජාතික අධ්‍යක්ෂ බෙනඩික් ජෝශප් පියතුමා ප්‍රදීපයට පැවසීය.

**සා.බෙ.නි. නව ...** 1 පිටුවෙන්

රෝමයේ සිට පැමිණි සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකායේ මඩාධිපති අති උතුම් මයිකල් කෙලී පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවති යාච්ඤාවේ භාවනාවේ විශ්ලේෂණයේ නව මාවත් සොයා යන ගමනේදී සාමූහිකව රැස්වීමේදී මෙම තෝරා පත් කර ගැනීම සිදුකළේය. ශ්‍රේෂ්ඨාධිපති පියතුමන්ගේ උපදේශක මණ්ඩලය ලෙස එම නිකායේ ගරු ඇන්සලම් ෆොන්සේකා, යොවාන් සවරිමුත්තු, ක්ලෙමන්ට් ඥානප්‍රගාසම් හා ඉයුජින් ද සිල්වා පියතුමන් තෝරා පත්කර ගැනිණි.



දුන්ගල්පිටිය ශුද්ධවූ මරිය මග්දලේනා මුනිවරියගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය වෙනුවෙන් දිව්‍ය සත්ප්‍රසාද පෙරහර අලංකාරමත් කිරීම සඳහා දුන්ගල්පිටිය වේලන්කන්නි මණ්ඩපය ඉදිරිපිට සකස් කර තිබූ බව සතුටින් දන්වා සිටිමු. **(ඒනෝෂ් කවිශ්ක තිරිමාන්න)**

# කිතුනු දයාපෙම සවිමත් කළ යුග දිවියක පනස් වසරේ අභිමානය



පමුණුගම ඇලෙන්එගොඩ ජුස්තින් අබේසේකර මහත්මියත් උස්වැටකෙයියාවේ පරණම්බලම ජෙරාඩ් පීරිස් මහතාත් යුගදිවියේ පනස් වසරක් සපිරිය.

පමුණුගම ඇලෙන්එගොඩ නිකලස් අබේසේකර සහ එලිසබෙත් පොන්චිර යුවතිපතින්ගේ වැඩිමහල් දියණිය වන මේරි ජුස්තින් අබේසේකර දිළිඳු දරුවන්ට නොමිලේ අධ්‍යාපන පංති පවත්වමින් ඔවුන්ගේ ඉදිරි දිවි ගමනට අත්වැලක් වූවාය.

ඇය පමුණුගම දෙව්මැඳුරට සම්බන්ධ කොට්ඨාශ නායිකාව ලෙස කැපවූ දේව සේවාවන්ද ඉටුකරන්නිය. පමුණුගම සුභ මරණ හා අවමංගල්‍යාධාර සමිතියේ මුදල් ලේකම් හා 164 පමුණුගම ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානයේ ප්‍රධාන භාණ්ඩාගාරික වේ.

මරිය හමුදාවේ හා දිව්‍ය හෘදය සංගමයේ සාමාජිකාවකි.

වෙළෙඳ ව්‍යාපාරික ජෙරාඩ් පීරිස් මහතා "අත්වූ නිත්‍ය මොක්පුර ක්‍රිස්තු, කුසුමෙනි නර්බෝන" ගීතයෙන් හෙළය බැබළවූ කේ. සෙබස්තියන් පීරිස්ගේ වැඩිමහල් සොහොයුරාගේ පුත්‍ර රත්නයකි. ඔවුන්ගේ යුග දිවියට තුති පිදීමේ දිව්‍ය යාගය පමුණුගම සා. ජෝශප් දෙව්මැඳුරේදී පැවැත්විය.

**(ජෝ. සංඝපාලආරච්චි)**

# ජනපති ජන්ම දිනය හා පදවි ප්‍රාප්තියට සමගාමීව මීගමුවේ පවුල් 17000 ක් වෙත පානීය ජලය ලබාදීමට පියවර



තලාහේන පේරුව, දුන්ගල්පිටිය, කොච්චිකඩේ ප්‍රදේශවල ජනතාවට කාලයක් තිස්සේ පැවති පානීය ජල ගැටලුවට විසඳුම් ලබා දෙමින් දවසේ පැය 24 ක් පුරා ජලය ලබා ගැනීමට හැකි වන පරිදි ජලය ලබා දීමට ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය සරත් කුමාර ගුණරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් දුන්ගල්පිටිය දොන් බොස්කෝ ආයතනයේදී සිදුකෙරිණි.

මෙම ප්‍රදේශයේ ජනතාවට ජලය ලබාදීමට කටයුතු කර තිබුණත් එය දවසේ පැය කිහිපයකට පමණක් සීමා වී තිබූ අතර එහිදී ප්‍රදේශයේ ජනතාවට මහත් ගැටලුවලට මුහුණ දීමට සිදුව තිබුණි. ඒ සඳහා අවධානය යොමු කළ ධීවර හා ජලජ සම්පත් නියෝජ්‍ය අමාත්‍ය සරත් කුමාර ගුණරත්න මහතා ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාගේ හා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාගේ පූර්ණ සහයෝගයෙන් මෙම ප්‍රදේශයන්ට පැය 24 පුරාම පානීය ජලය ලබා ගැනීමට හැකි වන පරිදි ජලය ලබා දුන් අතර ඒ පිළිබඳව ජනතාවගේ සතුටට හේතුවී ඇත.

**(මාධ්‍ය ලේකම් - සී. රාජපක්ෂ)**


**වත්තල, එඬේරමුල්ල 261 බස් පාරට මායිම්ව ටයිල් පොළොව, ප්‍රියමනාප ගෙවත්ත සහිත කාමර 2 ක නිවස**

**වසර දෙකකට බදු දීමට තිබේ.**

**දු. අංක 0777349335**


# උඳුවප් මිහිර දොරට වැඩුම හා ප්‍රතිභා සම්මාන උළෙළ 14 දා

උඳුවප් මිහිර නත්තල් සංගරාවේ 37 වන වාර්ෂිකය එළිදැක්වීම දෙසැම්බර් 14 දින පෙ.ව. 9.30 ට ජා-ඇල නගර සභා ශ්‍රවණාගාරයේ දී එළිදැක්වේ.

ශිරාන් මෛත්‍රි හා මැක්සිමස් රෝයි පෙරේරාගේ සංස්කාරකත්වයෙන් එළිදැක්වෙන උඳුවප් මිහිර එළිදකින උළෙලට සමගාමීව ලේඛක ලේඛිකාවන් 25 දෙනෙකුට ප්‍රතිභා සම්මාන ද පිරිනැමේ. මේ උළෙලේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ජා-ඇල කලාපීය නාහිමි අතිගරු ශාන්ති කුමාර වැලිවිට පියතුමා සහභාගි වේ. **(මැක්සිමස් රෝයි පෙරේරා)**

# ගර්භවාස මංගල්‍යය

පල්ලන්සේන මිසමේ ගර්භවාස දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය දෙසැම්බර් මස 08 වන දා පැවැත්වෙන බව මිසම් සේවක ගරු ජයන්ත නිමල් පියතුමා ප්‍රදීපයට පැවසීය.

# භාග්‍යවන්ත ජුසේවාස් තුමන්ගේ විශේෂ මැදිහත්වීමක්

වැදගත් කරුණක් ඉටුකර ගැනීම සඳහා මාත්, මගේ පවුලේ අයත් දින ගණනක් වෙහෙසුනෙමු. මෙය අපට ඉටුකරගත නොහැකි යැයි සිතා බලාපොරොත්තු සුන්කරගෙන සිටින මොහොතක ජුසේවාස් තුමන් ශුද්ධවරයට ඔසවනු සඳහා යාච්ඤා කරන්නැ'යි සඳහන් බැනරයක් දෙව්මැඳුර ඉදිරිපිට ප්‍රදර්ශනය කර තිබෙනවා අපි දුටුවෙමු. අපි ජුසේවාස් තුමන්ගේ මැදහත් යාච්ඤා පිහිට ඉල්ලා අපේ අවශ්‍යතාවය එතුමන්ට බාර කළෙමු.

දිනපතා සවස ජපමාලය උච්චාරණය කර ජුසේවාස් තුමන්ගේ ප්‍රාර්ථනාව ද කියා අප වෙනුවෙන් මැදහත් වන ලෙස ඉල්ලා සිටියෙමු. ඊළඟ ඉරුදින දිව්‍ය පූජාවට සහභාගී වූ අපි විශ්වාසිකයින්ගේ යාච්ඤා කීමෙන් පසු පෞද්ගලික ඉල්ලීම් කරන අවස්ථාවේදී ද ජුසේවාස් තුමන්ගේ මැදහත්කමින් අපගේ ප්‍රශ්නය විසඳා දෙන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටියෙමු. දිව්‍ය පූජාවෙන් පසු, අපි දෙදෙනා (මාත්, මගේ සැමියාත්) ජුසේ වාස් පියතුමන්ට යාච්ඤා කළ අතර අපගේ ඉල්ලීම ඉටු වූ පසු එතුමන්ට ස්තුති පූජාවක් පැවැත්වීමට ද බාර වුයෙමු.

පසුදින අපගේ ප්‍රශ්නයට සාර්ථක පිළිතුරක් ලැබුනේ අප නොසිතූ අයුරිනි. ජුසේ වාස් පියතුමා දුබල අප වෙනුවෙන් දෙවි පියා ඉදිරියේ මැදිහත්ව අපගේ ඉල්ලීම ඉටුකර දුන් නිසා අපි එතුමන්ට ස්තුති කළෙමු. ජුසේ වාස් තුමන් ශුද්ධවරයට ඔසවන දිනය කඩිනමින් ළඟා වේවායි අපි නොකඩවා දෙවි පියාණන්ට යාච්ඤා කරන්නෙමු. **(මේරි සෙල්සි පද්මා - වෙන්නප්පුව)**

# රාජ්‍ය, සංස්ථා හා පෞද්ගලික අංශයේ කතෝලික සංගම් නියමුවන්ගේ හමුවක් !

දෙවියන් වහන්සේ මිනිස් ශ්‍රමය සැමවිටම ආශිර්වාද කරන බවත් ශ්‍රම දායකත්වය සාන්ත සභාවේ සහ ලෝකයේ අභිවෘද්ධිය සඳහා යෙදවීම කිතුනුවාගේ කැඳවීම බවත් කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ පැවසූහ.

කොළඹ අගරදගුරු පදවියේ නව ධර්මදූත වැඩපිළිවෙල යටතේ ක්‍රියාත්මක වන සඳහම් සජීවක මෙහෙවර සියලුම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනයන්හි කතෝලික සංගම් නියෝජිතයින් වෙනුවෙන් භාග්‍යවන්ත ජුසේවාස් දේව ධර්ම නිකේතනයේදී පැවති වැඩමුළුව අමතමින් කාදිනල් හිමි එසේ පැවසීය. **(ෂෙහාන් ඇන්ටන්)**

# "රිදම් ඔෆ් මෙරූන් - 2013"



ආනන්ද විද්‍යාලය මඟින් සංවිධානය කරන ලද "රිදම් ඔෆ් මෙරූන්" සංගීත වැඩසටහන 2013 නොවැම්බර් මස 09 දා මියුසියස් ශ්‍රවණාගාරයේ පැවැත්විණි.

දිවයිනේ පාසල් 30 ක ගායනා කණ්ඩායම් වැඩසටහනට සහභාගි වූ අතර අවසාන මහා තරඟයට කොටහේන, යහපත් එඬේරාගේ කන්‍යාරාමය හා මියුසියස් විද්‍යාලය තේරී පත්විය. මෙම තරඟයේ විනිශ්චය සඳහා සංගීත ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් වන නිලූ අධිකාරි, වසන්ත ගී කියනගේ, හේෂාන් ගමගේ සහ ජගත් ප්‍රියන්ත යන මහත්ම මහත්මීන් සහභාගි විය.

අවසාන මහා තරඟයේ ජයග්‍රහණ කොටහේන යහපත් එඬේරාගේ කන්‍යාරාමය විසින් දිනාගන්නා ලදි. ගායනා කණ්ඩායම කන්කළු රාවයෙන් ගැයුණු "සුනාමි ගීතය, රන්කුරහන් හා වර්ල්ඩ් ඉන් යුනියන්" ගීත ප්‍රේක්ෂකයන්ගේ පැසසුමට ලක්විය. **(මාධ්‍ය කවය)**

# "සුපුවත අරණ" ආධ්‍යාත්මික සුව මෙහෙය

"සුපුවත අරණ සුව මෙහෙය" ඇවැන්ත මෙහෙයක් බවට පත්වී ඇත. සතියේ සෑම බදාදාවකම ප.ව. 7.00 ටත්, සිකුරාදා පෙ.ව. 7.00ටත් මෙහෙයන් පැවැත්වේ.

ගරු ඩැරල් කුක්ඤ පියතුමා සහ සෙලින්ටා පැව්දි සොයුරිය විසින් මෙහෙයවනු ලබයි. www.goodnewsashram.org ඔස්සේ අන්තර්ජාලයෙන් ද එය විකාශනය වේ. **(මයිකල් සෙබස්තියන්)**

# සැබෑ නත්තලක් භුක්ති විඳීමට ඔබට අවස්ථාවක්



පමුණුගම - සේදවත්ත ග්‍රාමයේ පදිංචි ඉතා දිළිඳු අසරණ පවුලක් සඳහා නිවසක් තනා දීමට පමුණුගම මිසමේ ක්‍රියාත්මක නුවාන ඒකක 1 සිට 4 දක්වා සියලුම සාමාජිකයන් සහ මිසම් වාසීන් කටයුතු කරමින් සිටී.

නත්තල් ගවලෙන සිහිකරමින් මෙම අසරණ පවුල වෙත හිසට සෙවණක් ලබා දී සැබෑ නත්තලක් හදවතින්ම භුක්ති විඳීමට ඔබට අවස්ථාවක් ලැබී ඇත.

ඒ සඳහා ඔබට මුදලින් හෝ භාණ්ඩ වලින් ආධාර උපකාර කළ හැකිය. මුදලින් කරන ආධාර - ලංකා බැංකුවේ පමුණුගම ශාඛාවේ ගිණුම් අංක 75363735 හෝ මුදල් හෝ භාණ්ඩ වලින් කරන ආධාර මිසම් සේවක පියතුමා, සා. ජෝශප් දෙව්මැඳුර, පමුණුගම ලිපිනයට භාර දිය හැකියි. **(මොරිස් නානායක්කාර)**